# අභ්‍යන්තර අවතැන්වීම් ඇමතීම

# ජාතික වගකීම සඳහා සැලසුමක්



අප්‍රේල් 2005

UNIVERSITÄT BERN

බෲකිංස් ආයතනය - බර්න් විශ්ව විද්‍යාලය
අභ්‍යන්තර අවතැන්වීම් පිළිබඳ ව්‍යාපෘතිය

මුල් පිටුවේ ඡායාරූපය: නැගෙනහිර තිමෝරයේ අභ්‍යන්තර ව අවතැන් වූ ජනයාගේ නැවත පැමිණීම ඡායාරූපය - මනාටුටෝ/UNHCR විසිනි

# පෙරවදන

## අභ්‍යන්තර අවතැන් වූවන්ගේ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ ලේකම් නියෝජිත වෝල්ටර් කාලීන් විසිනි

අභ්‍යන්තර අවතැන් වූවන් ඔවුනොවුන්ගේ රටවල්වල මායිම් තුළම පදිංචිව සිටිනා බැවින්ද එම රටවල රාජ්‍යයන් යටතේ පවත්නා අධිකරණයට සහ පාලනයට ඔවුන් යටත්ව සිටිනා බැවින්ද, ඔවුන්ගේ ආරක්ෂාව හා ආධාර උදව් අවශ්‍යතාවන් සපුරාලීමේ ප්‍රාථමික වගකීම රඳා පවත්නේ ඔවුන්ගේම ජාතික ආණ්ඩුව මතයි. “අභ්‍යන්තර අවතැන්වීම සඳහා වන මාර්ගෝපදේශක ප්‍රතිපත්ති හා මූලධර්ම” අභ්‍යන්තර අවතැන්වූවන්ගේ හිමිකම් හා මෙවැනි ජන කොටස් කෙරෙහි එම රාජ්‍යවල අනිවාර්ය යුතුකම් වශයෙන් පවත්නා දේ ඍජුවම ඉදිරිපත් කරමින් මේ බව සනාථ කරයි. ජාතික වගකීම් තුළ ඇති විය යුතු ප්‍රතිඵල වඩා පැහැදිලිව තේරුම් ගැනීම සඳහා ඒවා විශේෂ සැකසුමක් ලබාදෙයි.

අභ්‍යන්තර අවතැන් වීම් නිසා පැන නගින ගැටලුවලට මුහුණ දී ඒවා විසඳීම සඳහා සුදුසු අඩිතාලමක් පිළියෙළ කර එය වැඩි දියුණු කරමින්, සඵල වූ ජාතික ප්‍රතිචාරයක් නිර්මාණය කිරීම සඳහා මේ ප්‍රතිපත්තීන් හා මූලධර්මයන් දායක විය යුතුය. මෙම කර්තව්‍යය උදෙසා රාජ්‍යයන්ට සහාය දීම පිණිස අභ්‍යන්තර අවතැන් වීම පිළිබඳව ගොඩ නගන ලදුව ඇති බර්න් විශ්ව විද්‍යාලීය බෲකිංස් ආයතන ව්‍යාපෘතියේ උප අධ්‍යක්ෂිකාව වන එරින් මූනි මහත්මිය විසින් ජාතික වගකීමෙහි ඇතුළත්වන ප්‍රතිපත්තිමය ප්‍රමිතීන් එකම ලියවිල්ලකට ගොනු කරන ලදි. මේ එක් එක් ප්‍රමිතියක් මගින් අභ්‍යන්තර අවතැන් වූ ජනගහනයන් කෙරෙහි ඒ ඒ රාජ්‍යයන් විසින් සිදුකළ යුතු යුතුකම් සිතා බලා සැලකීමට භාජන කිරීමට ගත හැකි එක් එක් පියවර බැගින් සලකුණු කර පිළිබිඹු කරයි.

තම තමන්ගේ ජාතික තත්ත්වයන්වලට ගැළපෙන සේ, එම රාජ්‍යයන් විසින් සුදුසු අදියරයන් පිළියෙළ කර ගත යුතුව ඇති අතර, මෙය කිහිප ආකාරයකට කළත්, ඒවා අභ්‍යන්තර අවතැන් වූ ජනයා සිටින්නාවූ අභ්‍යන්තර අවතැනින් පීඩා විඳින සෑම රටකටම පොදු වන්නක් බව ඔප්පු විය යුතුය. එනම් එම රාජ්‍යයන් විසින් සලකා බැලීමට ලක් කළ යුතු විශේෂිත වූ වැඩ පිළිවෙළවල් කීපයකි:

1. අවතැන් වීම වළක්වාලීම හෝ අඩු කිරීම.
2. මෙම දුෂ්කර කාරණය හෝ ගැටලුව ගැන ඇති ජාතික අවධානයේ මට්ටම ඉහළ නැංවීම.
3. අවතැන් වූවන්ගේ සංඛ්‍යා තොරතුරු සහ තත්ත්වයන් ගැන දත්තයන් එක් රැස් කරගැනීම.

4. අභ්‍යන්තර අවතැන් වීම හා "මාර්ගෝපදේශක ප්‍රතිපත්තීන්" ගැන පුරුදු පුහුණු වීමට රුකුල් දීම.
5. අභ්‍යන්තර අවතැන් වූවන්ගේ අයිතීන් තහවුරු කරන ජාතික නීතිමය සැකැස්මක් නිර්මාණය කිරීම.
6. අභ්‍යන්තර අවතැන් වූවන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් ආරම්භ කර දියුණු කිරීම.
7. අභ්‍යන්තර අවතැන් වූවන් සඳහා ආයතනික නාභීය ලක්ෂ්‍යයක් නම් කර පත්කර ගත යුතු වීම.
8. ජාතික මානව හිමිකම් සම්බන්ධ වැඩ කටයුතුවල යෙදෙන ආයතන අභ්‍යන්තර අවතැන් වීම තම කටයුතු සඳහා එක්කර ගැනීමට දිරිමත් කිරීම.
9. මෙම ගැටලුවට සරිලන සියලු උපාය උපක්‍රම සහ සම්පත් සොයා නම් කර වෙන් කරදීම.
10. තීරණ ගැනීමේදී ඒ සඳහා අභ්‍යන්තර අවතැන් වූවන්ගේ සහභාගිත්වය ලබා ගැනීම සුරක්ෂිත කරගැනීම.
11. අවතැන් වූවන් සඳහා දිගුකල් පැවතීගෙන යන විසඳුම් ඇත්නම් ඒවාට දිරිදී සහාය වීම.
12. මීට අමතරව, අවතැන් වූවන්ගේ උවමනා එපාකම් සහ අවශ්‍යතාවන් කෙරෙහි අවධානය යොමු කර ඒවා ආමන්ත්‍රණය කිරීමට ජාතික ධාරිතාවෙහි හිඟයක් ඇති විට, ජාත්‍යන්තර ප්‍රජාව සමග සහභාගිත්වයෙන් ක්‍රියා කිරීම ජාතික ප්‍රතිපත්තියෙහි මුල්ම හා ප්‍රාථමික වස්තු මාත්‍රය විය යුතුය.

අභ්‍යන්තර අවතැන්වීම යන ගැටලුවට මුහුණ පා සිටින රටවල රාජ්‍යයන්වලට එම ආපදාවට සෑම ආකාරයටම මුහුණ දී උදව් කිරීමටත් එය ආමන්ත්‍රණය කිරීමටත් උදව් කිරීම මෙම ජාතික වගකීමේ සැකසුම මගින් අපේක්ෂා කෙරේ. තව දුරටත් එය, ජාත්‍යන්තර සංවිධානද ප්‍රාදේශීය මණ්ඩලද ජාතික මානව හිමිකම් ආයතනද සිවිල් සමාජය සහ එම අවතැන් වූවන් හටද බලය හා ශක්තිය පැවරීමෙන් කොතරම් දුරට හා කොතරම් ප්‍රමාණයක් කාර්ය සාධකව හා සඵල භාවයකින් ජාතික වගකීම යොදවා ඇත්දැයි තක්සේරු කරගනිමින්, අවතැන් වූවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් හා ඔවුනට පක්ෂව ප්‍රයත්න දරන්නා වූ පදනම බවට පත්වීමට දිරිදිය යුතුය.

නියෝජිතයාගේ බලාපොරොත්තුව වනුයේ, මෙම ප්‍රකාශනයේ අඩංගු වී ඇති අදියරයන් රාජ්‍යයන් විසින් ඉතා සැලකිල්ලෙන් සහ අවධානයෙන් විවේචනය කර පරීක්ෂා කර බලා, අභ්‍යන්තර අවතැන් සඳහා ඉතා සාර්ථකම හා සඵලීයක ක්‍රම ක්‍රියාත්මක කරවීමට මග පෙන්වීමකි. දායක රාජ්‍යයන් හෝ ආධාර දෙන රාජ්‍යයන්ද, ජාතික වගකීමෙහි උච්ච තත්ත්වය හෝ ප්‍රමිතිය පරීක්ෂා කර බැලීමෙන්, අවතැන් ප්‍රශ්න සහිත රාජ්‍යයන්වලට මුදලින් උදව් ආධාර දීමේ තීරණයන් ගැනීම ප්‍රාථමික වස්තුමාත්‍රය විය යුතුයි.

# පටුන

හැඳින්වීම / 5

අභ්‍යන්තර අවතැන් පිළිබඳ මාර්ගෝපදේශක ප්‍රතිපත්ති / 7

ජාතික ප්‍රතිචාරයක මූලික සහ පාදක ගතිලක්ෂණ / 9

ජාතික වගකීමෙහි ප්‍රමිති / 12

1. වළක්වාලීම / 12
2. ගැටලුව හෝ ප්‍රශ්නය පිළිබඳ ජාතික අවධානය ඉහළ නැංවීම / 13
3. දත්ත රැස් කිරීම / 14
4. අභ්‍යන්තර අවතැන් වූවන්ගේ හිමිකම් පිළිබඳ පුහුණුව / 15
5. අභ්‍යන්තර අවතැන් වූවන්ගේ හිමිකම් නගා සිටුවීම සඳහා ජාතික නීතිමය සැකසුමක් / 16
6. අභ්‍යන්තර අවතැන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් හෝ ක්‍රියාදාමයක සැලසුමක් / 17
7. අභ්‍යන්තර අවතැන් වූවන් සඳහා ජාතික සංස්ථාගත කේන්ද්‍රස්ථානයක් / 18
8. ජාතික මානව හිමිකම් ආයතනයන් සඳහා භූමිකාවක් / 19
9. තීරණ ගැනීම තුළ අභ්‍යන්තර අවතැන් වූවන්ගේ සහභාගිත්වය / 20
10. කල් පවතින විසඳුම් / 22
11. ප්‍රමාණවත් උපාය සහ සම්පත් / 24
12. ජාත්‍යන්තර සහ ප්‍රාදේශීය සංවිධාන සමග සහයෝගය / 24

නිමාව / 27

අවසාන සටහන් / 28

උපග්‍රන්ථය : අභ්‍යන්තර අවතැන පිළිබඳ මාර්ගෝපදේශක ප්‍රතිපත්ති / 29

# හැඳින්වීම

අභ්‍යන්තර අවතැන් වූවන්, ඔවුන්ගේ රටවල් තුළම රැඳී සිටින හෙයින් ජාත්‍යන්තර නීතිය තුළ තහවුරු කරන ලද ප්‍රතිපත්තීන්වලට අනුකූලව, ඔවුනොවුන්ගේ රාජ්‍යයන්වලින් ලැබෙන ආරක්ෂාව සහ උදව්, උපකාර, ආධාර භුක්ති විඳින බව, නිතරම ඉස්මතු කරන හොඳ හැටි පිළිගත් දෙයකි. සත්‍යයෙන්ම රාජ්‍යයන් විසින් නිතර පාහේ තරයේ කියා සිටින දෙයකි අභ්‍යන්තර අවතැන් වූ ජනගහනයන්ගේ සුභ සිද්ධිය හා සුරක්ෂිත භාවය ඔවුන් මත රැඳී ඇති මුල්ම වගකීම බව. අභ්‍යන්තර අවතැන් වූවන් සඳහා උදව් ආධාර ලබාදීම හා ඔවුනට ආරක්ෂාව ලබා දීම යන ඒ වගකීම, පළමුව සහ අන් සියල්ලන්ට පෙර රඳා පවත්නේ ඔවුන්ගේ ජාතික අධිකාරීන් සමග වන අතර එය "අභ්‍යන්තර අවතැන පිළිබඳ මාර්ගෝපදේශක ප්‍රතිපත්ති" තුළ පිළිබිඹු කරන ලද හරය සහිත සංකල්පයකි (උපග්‍රන්ථය බලන්න). ඒ මගින් අභ්‍යන්තර අවතැන් වූවන් සහ එම රාජ්‍යයන් ඔවුන් කෙරෙහි කළ යුතු යුතුකම් පැහැදිලි කිරීමක් කරන අතර මෙය අභ්‍යන්තර අවතැන් වෙත ජාත්‍යන්තර සහ ප්‍රාදේශීය සම්පවීම්වලට මග පෙන්වන හරය සහිත සංකල්පයකි.

එනමුත් අභ්‍යන්තර අවතැන් වූවන් කෙරෙහි වන ජාතික වගකීම යනු නිශ්චිතවම කුමක්ද? එය කෙසේ මැන ගත හැකිද? එය කෙසේ ප්‍රවර්ධනය කර ගත හැකිද? එය කෙසේ ශක්තිමත් කර ගත හැකිද? එයට කෙසේ සහාය දිය හැකිද?

අභ්‍යන්තර අවතැන් වූවන් සඳහා වන ජාතික වගකීම් ඉටු කිරීම සම්පූර්ණ කර ගැනීමට නම් මෙම ප්‍රශ්න ආමන්ත්‍රණය කිරීම ඉතා වැදගත්ය. මෙම වගකීම ඉෂ්ට කිරීමේදී රාජ්‍යයන්වලට මග පෙන්වීම් සඳහා තක්සේරු කරගතහැකි දර්ශන හෝ ප්‍රමිතීන් අවශ්‍යය. තක්සේරුව සඳහා ආරම්භයක් සේ, එය ඵලදායී ලෙස ක්‍රියාවට යොදවන ලදද යන්න දැන ගත යුතුය. මෙම පාර්ශ්වයට, "ජාතික වගකීම සඳහා සැකසුම"ක් හෝ නිසි වැඩ පිළිවෙළක් පිළිගැන්වේ. අභ්‍යන්තර අවතැන්වීම ඇමතීම සඳහා ප්‍රමිතීන් මේ මගින් පැහැදිලි වේ. විශේෂයෙන්ම, අභ්‍යන්තර අවතැන්වීම සඳහා ජාතික වගකීම් ඉටු කර ගැනීමට රාජ්‍යයන් විසින් අනුගමනය කළ යුතු මුල්මය අඩියර 12ක් හඳුනා ගෙන ඇත:

1. **අවතැන් වීම වළක්වාලීම හා අසතුටුදායක ප්‍රතිඵල අවම කිරීම.**
2. **ප්‍රශ්නය සම්බන්ධව ජාතික අවධානය ඉහළ මට්ටමකට ගෙන ඒම.**
3. **අභ්‍යන්තර අවතැන් වූවන්ගේ සංඛ්‍යාව සහ තත්ත්වය ගැන දත්ත එකතු කිරීම.**
4. **අභ්‍යන්තර අවතැන් වූවන්ගේ හිමිකම් පිළිබඳ පුහුණු කිරීමට රුකුල් දීම.**
5. **අභ්‍යන්තර අවතැන් වූවන්ගේ හිමිකම් ස්ථිර කිරීම සඳහා නීතිමය සැකසුමක් පිළියෙළ කිරීම.**
6. **අභ්‍යන්තර අවතැන්වීම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් ගොඩ නැගීම.**
7. **අභ්‍යන්තර අවතැන් වූවන්ට සංස්ථාගත කේන්ද්‍රීය ස්ථානයක් නියම කිරීම.**

8. **ජාතික මානව හිමිකම් ආයතනයන් අභ්‍යන්තර අවතැන් වූවන් සම්බන්ධ කාර්යයන් තම ආයතනයන් හා ඒකීයකරණය කිරීමට දිරිමත් කිරීම.**
9. **තීරණ ගැනීමේදී අභ්‍යන්තර අවතැන් වූවන්ගේ සහභාගිත්වය ඇති කර ගැනීමට වග බලා ගැනීම.**
10. **කල්පවත්නා විසඳුම්වලට ආධාර, සහාය දීමෙන් රුකුල් දීම.**
11. **ප්‍රශ්නයට අවශ්‍ය ප්‍රමාණයට උපක්‍රම සහ සම්පත් වෙන් කර ගැනීම.**
12. **ජාතික ධාරිතාව හීන වී ඇත්නම් හෝ නොසෑහෙන විට ජාත්‍යන්තර ප්‍රජාව සමග සහයෝගිත්වයෙන් ක්‍රියා කිරීම.**

අභ්‍යන්තර අවතැන් වීමේ තත්ත්වයන් තුළ, ජාතික වගකීම් සපුරාලීම සඳහා, ක්‍රියාකාරීත්වය සඳහා සැකසුමක් ස්ථාපනය කිරීම, මෙම ප්‍රමිතීන්වල එකතුවකින් සිදුවේ.

“ජාතික වගකීම සඳහා සැකසුම” යන්නෙහි කර්තව්‍යය වනුයේ, අභ්‍යන්තර අවතැන් වීම් ඇති රටවල රාජ්‍යයන්වලට, ඔවුන්ගේ අවතැන් වූ ජනගහනය කෙරෙහි සිදු කළ යුතු යොමු කිරීම් සහ යුතුකම් සපුරාලීමේදී නිසි සහ සුදුසු මගපෙන්වීම් ලබාදීමය. මේ අනුව අභ්‍යන්තර අවතැන් වීම් තුළ ඇතිවන තත්ත්වයන්වලදී, රාජ්‍යයන් මගින් ගත හැකි විසඳුම් අදියර කීපයක් හඳුනා ගැනීම මෙහි ප්‍රාථමික දැක්මයි. මේ හා සමගම, වැදගත් භූමිකාව, සහ සමහර අවස්ථාවලදී අනෙකුත් ක්‍රියා කරන්නවුන්ගේ වගකීම්, එනම් ජාතික මානව හිමිකම් ආයතන, ප්‍රාදේශීය මඬුලු, ජාත්‍යන්තර සංවිධාන, පරිත්‍යාග කරන්නන් සහ සිවිල් සමාජය යනාදිය විසින් අභ්‍යන්තර අවතැන් වූවන් හට ආරක්ෂාව හා උදව් ආධාර දීමෙන් සහාය වීම වැනි ජාතික අධිකාරීන්ගේ වගකීම් සපුරා ලීම උනන්දු කරවමින්, ශක්තිමත් කිරීම, මෙම සැකසුම මගින් අගය කෙරේ. එසේ නම් මෙම “සැකසුමේ” අභිප්‍රාය වන්නේ ජාත්‍යන්තර සංවිධාන සහ නියෝජිත ආයතන, පරිත්‍යාග කරන්නන්, ප්‍රාදේශීය මඬුලු, ජාතික මානව හිමිකම් ආයතන, සිවිල් සමාජය සහ අභ්‍යන්තර අවතැන් වූවන්ම විසින් ජාතික වගකීම් අධීක්ෂණය හා තක්සේරු කර, කොතරම් දුරට මෙම කාර්යය සාර්ථකව හා ඵලදායීව යොදවන ලද්දේ දැයි බලා, එමගින් අභ්‍යන්තර අවතැන් වූවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීම සඳහා පදනමක් සහිත පාක්ෂික ප්‍රයත්නයන් ලබා දීම සඳහා මෙය අවියක් ලෙස භාවිත කිරීමයි.

# අභ්‍යන්තර අවතැන් වීම් පිළිබඳ මාර්ගෝපදේශක ප්‍රතිපත්ති

අභ්‍යන්තර අවතැන් වූවන් සඳහා වන ආරක්ෂාව සහ සහාය යන ඒ ප්‍රාථමික වගකීම, ඔවුන්ගේ ජාතික අධිකාරියන් සමග රඳා පවතින "අභ්‍යන්තර අවතැන් වීම් පිළිබඳ මාර්ගෝපදේශක ප්‍රතිපත්ති" එක දිගටම අවධාරණය කරන, සහාය දී ශක්තිමත් කරන තේමාව, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ හිමිකම් සහ රජයන්ට ඔවුන් කෙරෙහි ඇති වගකීම් සහ යුතුකම් පැහැදිලි කරයි. රාජ්‍යයන්වල ඉල්ලීම මත සකස් කෙරුණු, මානව හිමිකම් කොමිසමේ සහ එක්සත් ජාතීන්ගේ මහා රැස්වීමේ යෝජනා තුළ ප්‍රකාශ කර ඇති පරිදි ජාතික වගකීම නොපැහැර හැරිය හැකි ලෙස අවශ්‍ය විය යුත්තේ කුමකටද යන්න වටහා ගැනීම සඳහා, ප්‍රාමාණික වූ සැකසුමක් ප්‍රතිපත්ති 30කින් ලබා දෙයි. සත්‍යයෙන්ම ලොව වටා රාජ්‍යයන් අභ්‍යන්තර අවතැන් තත්ත්වයන් ඇතිවීම සඳහා "ප්‍රතිපත්තීන්" අත්‍යවශ්‍ය අවියක් සහ සම්මුතියක් ලෙස පිළිගන්නා අතර, ප්‍රාන්ත රාජ්‍යයන් මෙය ඉතා පුළුල්ව ව්‍යාප්ත කිරීමට සහ භාවිත කිරීමට දිරි ගන්වන ලදුව ඇත.[1]

"මාර්ගෝපදේශක ප්‍රතිපත්ති"වලට අනුබල දීම සහ ව්‍යාප්ත කිරීම, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ හිමිකම් සහ විශේෂ අවශ්‍යතාවන් හඳුනා ගැනීම සඳහාද මෙම ජනතාව කෙරෙහි, රාජ්‍යය සතු යුතුකම් ශක්තිමත් කිරීම සඳහා ද ඉතා වැදගත් මාර්ගයක් වනු ඇත.

පටන් ගැන්මක් වශයෙන්, "ප්‍රතිපත්තීන්" ප්‍රාදේශික භාෂාවලට පරිවර්තනය කර ප්‍රාදේශික හා ජාතික නිලධාරීන්, රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් සහ රාජ්‍ය නොවන සංවිධානවලට පුළුල්ව බෙදා හැරිය යුතුය. මේ හැර ජාත්‍යන්තර නීත්‍යනුකූල මට්ටම් විදහාපාන "විවරණ"ද එම විවරණ මත පදනම්ව ඇති ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කරවීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික අඩිතාලම ඇතුළත් "මාර්ගෝපදේශක ප්‍රතිපත්තීන් ක්‍රියාවේ යෙදවීමේ අත්පොත" ද ඉහළ කී ආකාරයටම පරිවර්තනය කළ යුතුය.[2]

"මාර්ගෝපදේශක ප්‍රතිපත්තීන්" සහ ජාත්‍යන්තර මානුෂීය ආයතනයන්වල මට්ටම ද ප්‍රතිපත්තීන් පදනම්වන මානව නීතියද යන කරුණු පිළිබඳ පුහුණු කිරීමේ සැසි, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ හිමිකම් මත ඇති විය යුතු අවධානය ඉහළ නැංවීමේදී ද රජයන්වල සහ වෙනත් අධිකාරීන්වල අභ්‍යන්තර අවතැන් වූවන් කෙරෙහි තිබිය යුතු වගකීම් ඉහළ නැංවීමේදීද ඉතා වැදගත්, වටිනා කමකින් යුත්, බව ඔප්පු කළ හැකි ය.

අභ්‍යන්තර අවතැන පිළිබඳ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම "මාර්ගෝපදේශක ප්‍රතිපත්ති" ගැන දැනුම හා අවධානය ඉහළ නැංවීමට උදව්කරන තවත් ක්‍රමයකි. මෙවැනි සම්මන්ත්‍රණ උත්සාහ කළ යුත්තේ, ස්ථානීය, ප්‍රාදේශීය, සහ ජාතික රජයේ නිලධාරීන්, ප්‍රාදේශීය රජයේ නොවන සංවිධාන සහ අනෙකුත් සිවිල් සමාජ කණ්ඩායම්ද, ජාත්‍යන්තර සංවිධාන සහ අභ්‍යන්තර අවතැන් වූවන්ගේ ප්‍රජාව නියෝජනය කරන්නවුන්ද එකට එක්රැස් කරවා, අභ්‍යන්තර අවතැන

යන්නෙහි වෙනත් වෙනත් ආකාරයන් හා දර්ශනයන්, “ප්‍රතිපත්ති”මය වශයෙන් සාකච්ඡා කිරීමට හා, ඒකාබද්ධ උපාය හා උපක්‍රම දිරිමත් කරමින්, ප්‍රශ්නය හෝ ගැටලුව ඇමතීමටය.

මීට අමතරව “ප්‍රතිපත්තීන්” විසින් සිදුකරන ලද තවත් කාර්යයක් වනුයේ, ඉතා වැදගත් සැකසුමක් ලෙස වෙනත් වෙනත් රටවල නොයෙකුත් තත්ත්වයන් අධීක්ෂණය කිරීමය.

අභ්‍යන්තර අවතැන ඇමතීමට අවශ්‍ය ක්‍රියා මාර්ග සහ ජාතික නීති ගොඩනැගීමට අවශ්‍ය මගපෙන්වීම ලබා දීම මෙම “ප්‍රතිපත්තීන්” මගින් සිදුකරන තවත් දෑ වෙයි.

එලෙසම, එක්සත් ජාතීන්ගේ විසඳුම් සහිත යෝජනා මගින්, රජයන්වලට ඔවුන්ගේ අභ්‍යන්තර අවතැන් වූ ජනගහනය වෙත ආරක්ෂාව හා සහන සහාය ලබා දීමට දිරි දී, “මාර්ගෝපදේශක ප්‍රතිපත්ති” සැලකිල්ලට ගනිමින් ජාතික නීති සහ ක්‍රියා මාර්ග ගොඩ නගා ගැනීමට දිරිමත් කරයි.[3]

සමස්තයක් වශයෙන් ගත් විට “මාර්ගෝපදේශක ප්‍රතිපත්ති” අභ්‍යන්තර අවතැන් වීමට ඇති ජාතික සහ ජාත්‍යන්තර ප්‍රතිචාරයන්ට පදනමක් වන ප්‍රාමාණික සැකසුමක් ඉදිරිපත් කරයි.

# ජාතික ප්‍රතිචාරයක මූලික සහ පාදක ගතිලක්ෂණ

ජාතික ප්‍රතිචාරයක්, අර්ථ දැක්වීමක් ලෙස ගත හොත්, අභ්‍යන්තර අවතැන්වීම්වලද, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කණ්ඩායම්වලද, සෑම තත්ත්වයන්ම, විවේචනයකින් හෝ වෙනස් කිරීමකින් තොරව වාර්තාගත කර, අන්තර්ගත කරගැනීම අවශ්‍යය. විශේෂයෙන්ම, මෙයින් හැඟෙන්නේ අභ්‍යන්තර අවතැන්වීම් සඳහා ජාතික වගකීම්, වෙනස් වූ අංගයන් කිහිපයකින්ම පරිපූර්ණ වීම අවශ්‍ය බවය.

- **සියලුම හේතු :** ආරාවුල් තත්ත්වයන් තුළ හෝ, වාර්ගික අරගලයන් තුළ සහ මානුෂීය හිමිකම් උල්ලංඝනය කිරීම් ද, ස්වාභාවික හෝ මිනිසා විසින්ම ඇති කරන ලද ආපදාවන් හේතුකොට ගෙනද, අභ්‍යන්තර අවතැන් වූවන් සිටි තැන්වලින් ඉවත් කරන ලද විටද, සංවර්ධන ව්‍යාපෘති සහ අනෙකුත් හේතු මතද, අභ්‍යන්තර අවතැන් වූවන්ට අභ්‍යන්තර අවතැන් සඳහා වන ජාතික වගකීම අදාළ වනු ඇත. වෙනත් වචනවලින් කියන්නේ නම්, අභ්‍යන්තර අවතැන් වීම් ආමන්ත්‍රණය කිරීම සඳහා ජාතික වගකීම, අභ්‍යන්තර අවතැන් වූවන් ලෙස, එම අර්ථ දැක්වීමට සුදුස්සන් හැටියට "මාර්ගෝපදේශක ප්‍රතිපත්ති" රාමුව තුළට ඇතුළු වන්නා වූ සියලු දෙනාගේ යහපත සහ වාසිය තකා ක්‍රියාවට නැංවිය යුතුයි.

  > "මාර්ගෝපදේශක ප්‍රතිපත්ති" තුළ අභ්‍යන්තර අවතැන් වූවන් ගැන මෙසේ අරුත් දක්වයි: "..... විශේෂයෙන්ම සන්නාහ සන්නද්ධ කෝලාහල රණ්ඩු දබරවල ප්‍රතිඵලවලට මුහුණ දීමෙන් වළකින පිණිස, පොදු ප්‍රචණ්ඩකාරී තත්ත්වයන්, මානව හිමිකම් උල්ලංඝනයක් හෝ ස්වාභාවික හෝ මිනිසා විසින්ම සිදුකරන ලද ආපදාවන් නිසා තමන්ගේ පුරුදු වාස භූමිවලින් හෝ නිවෙස්වලින් බල කිරීමක් හේතුවෙන් හෝ ණයගැති හේතුවකින් අත්හැර පලායෑමට සිදුව ඇති අය, සහ ජාත්‍යන්තරිකව පිළිගත් දේශීය මායිමක් තරණය නොකළ කෙනෙක්."

  අභ්‍යන්තර අවතැන් වූවන්ගේ අවශ්‍යතාවන් ඔවුන්ගේ අවතැන් වීමේ හේතුව මත වෙනස් වීමට අවකාශ ඇති නමුත්, සියලුම අභ්‍යන්තර අවතැන් වූවන්, රජයේ උදව් ආධාර හා සහාය ද ආරක්ෂාවද ලැබීමට සුදුස්සන් බව සැලකීම වැදගත්ය. එසේ නම් ජාතික වගකීම් යනු, අවතැන්වීම මොන හේතුවක් මත සිදුවන්නට ඇත්තේ වුවත්, කිසිම වෙනසක් හෝ භේදයකින් තොරව, අභ්‍යන්තර අවතැන් වූවන් හට, ප්‍රමාණවත් හා සාධාරණ ආධාර, උදව් සහන ලැබෙන බවට සහතික කර ගැනීමය.

- **සියලු කණ්ඩායම් :** අවතැන් වූ ජනගහනයන් තුළ නොතකා සිටිය නොහැකි බහුතරයක්ම ස්ත්‍රී පක්ෂය සහ ළමුන්ය. ඔවුන් අත්දකින්නාවූ අවශ්‍යතාවන් වන විශේෂ ආරක්ෂාව, විශේෂ ආධාර උදව් සහ ප්‍රතිසංකලන අවශ්‍යතා, හුරු පුරුදු පිළිවෙළකට මගහැර දමන ලදුව හා ප්‍රමුඛත්වයකින් ආමන්ත්‍රණයක් නොකර ඇත. මෙයටත් වඩා තවද, ආධාර උදව් ලබා ගැනීමේ

ස්ත්‍රීන් සහ ළමුන්, විශේෂයෙන්ම ගැහැණු ළමුන්, නිතර නිතර වෙනස්කම් සහ භේදයන්වලට මුහුණ දෙන්නේ, ඔවුන්ගේම නමින් ලියකියවිලි ඇතිවත්, අධ්‍යාපනයට හා ආදායම් උපදවන වාසිදායක තත්ත්වයන්වලට ඇතුළු වීමේ හැකියාව ඇතුවත්, ඔවුන්ගේ ඉල්ලීම් හෝ කන්නලව්වලට කන්දීම ලබාගෙනත්ය. ජාතික අධිකාරියන් වගකීමකින් බැඳී ඇත්තේ, විශේෂ ආරක්ෂාව හා ආධාර උදව් ලබා දිය යුතු අභ්‍යන්තර අවතැන් වූ ජනගහනයන් අතරේ වන්නා වූ, විශේෂ කණ්ඩායම් වගබලා ගැනීමටය. එනම් නිවෙස්වල ස්ත්‍රී නායකත්වය, කාත්කවුරුත් නැති බාල වයස්කරුවන්, නොහැකිබව, විකලාංග බව, හෝ දුබලතාව ඇත්තවුන් සහ වැඩිහිටියන් සැලකීමට ගෙන ආමන්ත්‍රණය කරනු ලැබීමටය.

අභ්‍යන්තර අවතැන, ගම්බද දුප්පත් ජනයාද යම් පළාතකට පමණක් ආවේණික වූ ජනතාව සහ සුලුතර ජනවාර්ගික කණ්ඩායම් ද මත සමානුපාතික නොවෙන සේ බලපාන සුවිශේෂී තත්ත්වයකි. අවතැන් වූ පසු, මෙම නොවැදගත් සේ කොන්කර දමන ලද කණ්ඩායම්, ජනවාර්ගික හෝ වාර්ගික හෝ මතවාද ලක්ෂණ හේතුවෙන්, උදව් ආධාර සහ ආරක්ෂාව පතා යැමේදී, නිතරම මුහුණ දෙන්නා වූ විවේචනය සහ වෙනස්කම් කිරීම, ඔවුන්ගේ අසරණභාවය හෝ ඕනෑම දෙයකට ගොදුරු විය හැකි වීමේ අවරීනම තව දුරටත් ඉහළ යවයි. භාෂා සාධක හේතුවෙන්, රාජ්‍ය අධිකාරීන් සමග සන්නිවේදනය කිරීමේ දුෂ්කරතාව නිසා, ඔවුන්ගේ අයිතීන් පවා දැන ගැනීමට නොහැකි වනු ඇත. මීටත් වඩා, යම් පළාතකට පමණක් හුරු පුරුදු වූ ජනතාව ගැන සලකන විට, ඔවුන් තම ප්‍රදේශයට ඇති ලෙන්ගතුකම හා සිත් බැඳීම නිසා, අවතැන් වීම විශේෂයෙන්ම දුෂ්කර කරුණක් වනු ඇත. අභ්‍යන්තර අවතැන්වීම්වලට දක්වන ජාතික ප්‍රතිචාරයන්, වෙනසක් නොකිරීමේ ප්‍රතිපත්තියෙන් මග පෙන්වනු ලැබිය යුතුය. ඇත්තෙන්ම, දේශීය ජනතාවේ සමහර කණ්ඩායම්, ඔවුන්ගේ ආර්ථික සහ දේශපාලනමය ජීවිතවලින් නෙරපා දැමීමේ වැඩිවීමක් ඇති කරවන සමාජමය, ආර්ථික සහ දේශපාලනමය ඉරි තැළීම් සහ බෙදීම් හේතුවෙන් සිදුවන අසාධාරණකම් සහ සමාජමය බෙදීම්, ප්‍රජාවන් දෙකට ඉරා දැමීම් නිසා අවතැන්වීම පෝෂණය වී වර්ධනය වීමට විරුද්ධව විසඳුමක්, ජාතික ප්‍රතිචාරය විසින් සොයාගත යුතුය.

- **සියලුම අවශ්‍යතා :** අභ්‍යන්තර අවතැන්වීම සඳහා වන ජාතික වගකීම, එම ගැටළුව හෝ ප්‍රශ්නය සැම අංශයකින් හා ආකාරයකින්ම ආමන්ත්‍රණය කළ යුතුය. අභ්‍යන්තර අවතැන් වූවන්ගේ අවශ්‍යතාවන් වන ආහාර, පිරිසුදු ජලය, නිවාස හෝ රැකවරණය, වෛද්‍ය ආරක්ෂාව සහ අනෙකුත් මානුෂීය මූලික උදව් ආධාර ගැන අවධානය යෙදීම අතිශයින්ම වැදගත් කරුණකි. ඒ කෙසේ වුවත්, ජාතික ප්‍රතිචාරයකට අවශ්‍ය වන්නේ සහ එහි සඵලතාව රඳා පවතින්නේ, ඒකීයකරණය කරන ලද ප්‍රවේශයන් තුළින් ආරක්ෂාව සහ ආධාර උදව් අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමකි. ස්වාභාවික ආපදා තත්ත්වයන් තුළ වුවත් මෙය සත්‍ය කරුණක් වනුයේ, ඇසට පෙනෙන්නට ඇති අවශ්‍යතාවන් එනම් ද්‍රව්‍යමය දේ අත්‍යවශ්‍යම සේ පෙනුනත් මොනවා නැතත් බරපතළ ආරක්ෂක ප්‍රශ්න හෝ සිදුවීම් පැන නැගිය හැකි නිසාය.

- **සියලුම අදියර :** ජාතික වගකීම අවතැනෙහි සියලුම අදියරයන් හරහා පැතිර ඇත. මෙයට ඇතුළත් වනුයේ, හිතුවක්කාර ලෙස සිදුවන අවතැන් වීම වළක්වාලමින් අවතැන් වූ පසු එම

ජනයාගේ සුරක්ෂිතභාවය සහ ශුභ සාධනය සහතික කරමින්, නැවත ඒකීයකරණය කිරීම සහ නැවත පදිංචි කරවීම හෝ සිය කැමැත්තෙන් ආරක්ෂිතව නැවත පැමිණීම වැනි, ඔවුන් මුණ පා සිටින අවාසනාවන්ත තත්ත්වයන්ට කල් පවතින විසඳුම් තත්ත්වයන් නිර්මාණය කිරීමය. අභ්‍යන්තර අවතැන්වූවන්ගේ මානව හිමිකම් සඳහා ගරුත්වයක් ඇතිවීමට වගබලා ගනිමින්, විෂය නිශ්‍රිත උපමානය මත පදනම් වන තීරණ ගැනීම කළ යුත්තේ "අභ්‍යන්තර අවතැන්වීම අවසන් වූ විටය."[4]

- **සියලුම රජයේ ශාඛා සහ අදාළ මට්ටම් :** අවංකව සහ සත්‍යව ජාතික වීමට නම් රජයක් අභ්‍යන්තර අවතැන කෙරෙහි දක්වන ප්‍රතිචාරය රජයේ සියලු මට්ටම්වලදී පිළිබිඹු විය යුතුය. ස්ථිරයෙන්ම, අභ්‍යන්තර අවතැන්වීම කෙරෙහි රජයෙන් ලැබෙන ප්‍රතිචාරය හැඩගැස්වීම නගරයේ නිලධාරීන් අතින් සිදුකෙරෙන ශක්තිමත් කර්තව්‍යයක් වීම නිසැකය. ඒ කෙසේ වෙතත්, ප්‍රාදේශීය සහ ස්ථානීය මට්ටම්වලදී, අවතැන් වූ ජනගහනයන් සමග වඩා ඍජු සම්බන්ධකමකින් සිටීමේ වැඩි හැකියාවක් ඇති අධිකාරීන් හටද, ප්‍රදේශය තුළ ජාතික වගකීම ඵලදායී ලෙස ඉෂ්ට කරන බවට, වග බලා ගැනීමේ තීරණාත්මක හා ඉතා වැදගත් කර්තව්‍යයක් ඇත. මීට අමතරව, දේශපාලන පාර්ශ්වයන්, සංවර්ධනය, අධ්‍යාපනය, නිවාස යෝජනා ක්‍රම, සෞඛ්‍යය, මානව හිමිකම්, මානව සුභ සාධනය යන ආංශ ද ඇතුළුව, ජාතික ප්‍රතිචාරයකට අවශ්‍ය වන්නේ රජයේ සියලුම අදාළ ශාඛාවල ආධාර උදව්වල එකතුවකි. අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කායික හෝ ස්වාභාවික ආරක්ෂාව ගැන සුවිශේෂී වූ වගකීම් රැසක් ත්‍රිවිධ හමුදාවට සහ පොලීසියට පැවරී ඇති බව විශේෂයෙන්ම සඳහන් කළ යුතුය.

- **සියලුම පීඩාවට පත් වූ ප්‍රදේශ:** විශේෂයෙන්ම අභ්‍යන්තර සන්නාහ සන්නද්ධ ගැටුම් තත්ත්වයන්වලදී, එම රටෙහි සියලුම පළාත් ආවරණය කරමින් ඒ තත්ත්ව සඵලව පාලනය කිරීමේ හැකියාව රජයන්ට නොමැති වීමට පුළුවන. ලොව වටා මිලියන ගණන් අභ්‍යන්තර අවතැන් වූවන්, රජයේ ආධාර උදව් හා ආරක්ෂාව යටතට නොපැමිණිය හැකි හෙයින්, රාජ්‍ය නොවන මැදිහත්කරුවන්ගේ පාලනය යටතේ ඇති පළාත්වල දක්නට ලැබේ. ජාතික වගකීම් සඵලවත්ව ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය වන්නේ, ඔවුන් භාරගැනීමට හෝ අඩු තරමින් ප්‍රවේශ වීමේ බලය සඳහා ඔවුන් දරන උත්සාහයන්ට පහසුකම් සැපයීම, හා මෙම අභ්‍යන්තර අවතැන් වූවන්ට ආධාර උදව් සහ ආරක්ෂාව සැපයීමය. මෙම පෙදෙස්වල මානව හිතවාදී අවකාශයන් එළි ගැන්වීමෙන්, රජයේ නොවන ක්‍රියාකරන ආයතන හටද ඔවුන්ගේ වගකීම් ගැන සිහිගැන්වීමක් සිදුකෙරෙනු ඇත: ජාත්‍යන්තර මානව හිතවාදී නීතිය යටතේ සහ "මාර්ගෝපදේශක ප්‍රතිපත්ති"වලින්ද, අභ්‍යන්තර අවතැන්වීමට ආරක්ෂාව හා උදව් ආධාර සැපයීම ඔවුන්ගේ ද වගකීම් වේ. එසේ නම්, එක්සත් ජාතීන්ගේ සංවිධානය හෝ පරිත්‍යාග කරන්නවුන්, පල්ලි කණ්ඩායම් හා රජයේ නොවන සංවිධාන, ආධාරයට බඳවා ගෙන මානව හිතවාදී අවකාශ විවෘත කරගැනීම රජයන් ගේ වැදගත් සහ වටිනා කාර්යයක් වනු ඇත. රජයේ නොවන ක්‍රියාකරන්නවුන් යටතේ ඇති පළාත්වල සිටින්නාවූ අභ්‍යන්තර අවතැන් වූවන් හට ආරක්ෂාව හා උදව් ආධාර දීම සහතික කර ගැනීමෙන් අවසානයේදී, මෙම අභ්‍යන්තර අවතැන් වූ ජනගහනය මැදිවී සිටින අරගලයන් විසඳා ඒවා හොඳ ප්‍රතිඵලවලට පෙරළීමටත් මේ මගින් හැකිය.

# ජාතික වගකීමේ ප්‍රමිති

"මාර්ගෝපදේශක ප්‍රතිපත්ති" තුළ, දී තිබෙන ප්‍රාමාණික සැකසුමෙන් හා ජාතික ප්‍රතිචාරයෙහි මූලික ගතිලක්ෂණ හඳුනන විකල්පික සැකසුමෙනුත් ඔබ්බට ගොස්, කුමන විශේෂිත වූ අදියරයන් අභ්‍යන්තර අවතැන්වල ගැටලු ආමන්ත්‍රණය කිරීමට ජාතික වගකීමට නොපැහැර හැරිය හැකි ලෙස උවමනා වේද යන්න, පැහැදිලි කර ගැනීමේ අවශ්‍යතාවන් ඇත. ජාතික වගකීමෙන්, ස්ථිර දර්ශනයක් හෝ ප්‍රමිතියක් සත්‍යයෙන්ම හඳුනා ගත හැකි ය. අභ්‍යන්තර අවතැන් වූවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සහ ජාතික වගකීම ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීම සහතික කර ගැනීම සඳහා රජයන්ට විශේෂිත වූ සහ ප්‍රධාන වූ මුඛ්‍ය අදියරයන් 12ක් ඇත. සවිස්තරාකාර ලැයිස්තුවක් නොවුණත්, මෙම ප්‍රමිතිවල අඩංගු ජාතික වගකීම් හඳුනා ගැනීමේ ප්‍රධාන පියවරයන් රාජ්‍යයන් විසින් ගනු ලැබුණ හොත් අභ්‍යන්තර අවතැන සඳහා වන උදව් ආධාර සහ ආරක්ෂාව සඳහා වැදගත් ප්‍රතිඵල ලබා දීමට ඉඩ ඇත.

## 1 වැළැක්වීම

**ප්‍රථමයෙන් සහ පළමුවෙන්** වැළැක්වීම ඇත. විස්තර වශයෙන් පැහැදිලි කරන ලද "මාර්ගෝපදේශක ප්‍රතිපත්ති"වලින් (5-9 ප්‍රතිපත්ති) රජයන්වලට පැවරී ඇති වගකීම නම්, ජනගහනයන්ගේ අවතැන් විය හැකි ප්‍රාන්ත තුළ ඇති විය හැකි තත්ත්වයන් මග හැරවීම හා වැළැක්වීමෙන්ද වැළැක්විය නොහැකි අවතැන අවම කිරීමෙන් ද ඒවායේ අසතුටුදායක ප්‍රතිඵල අඩු කිරීමත්, සිදුවන ඕනෑම අවතැන් වීමක් ඒ අවස්ථාවට අවශ්‍ය කාලය ඉක්මවා යාමට ඉඩ නොදීමට වගබලා ගැනීමත්ය.

විශේෂයෙන්ම අහඹු ලෙස තෝරාගනු ලැබූ අවතැනින් පුද්ගලයන් ආරක්ෂා කළ යුතුය. මානව හිමිකම්වලට ගරු කරන පරිසරයක් ගොඩ නැගීම, ජාත්‍යන්තර මානව හිතවාදී නීති තුළින් අනතුරු ඇඟවීම්වලට සහ තර්ජනයන්ට මුහුණ පා සිටින ජනතාව ආරක්ෂා කිරීමට ඉක්මන් ප්‍රතිචාර යාන්ත්‍රණයන් වැනි දේ භාරගෙන ක්‍රියාවේ යෙදවීම රාජ්‍යයන්ට පැවරෙන ඉතා වැදගත් කර්තව්‍යයන්ය.

මිනිසුන්ගේ අවතැන ගැන ගන්නා වූ ඕනෑම තීරණයක් නීත්‍යානුකූල වීමට නම්, තත්වයන්ට මුහුණ දී 7 වන "ප්‍රතිපත්තියෙහි" විස්තරාත්මකව පැහැදිලි කර ඇති සේ වගකීමෙහි සහතික වූවන් සමග එකඟ වී, එයද ඇතුළත් වන පරිදි, ඇති කළ හැකි සියලු ප්‍රායෝගික වෙනස් කිරීම් පළමුවෙන්ම සෝදිසියෙන් සොයා බැලිය යුතුය. අවතැන් වූවන් සඳහා සුදුසු නවාතැන් ඇත්ද යන බවට, කිසියම් හෝ ආරක්ෂාව, පෝෂණය, සෞඛ්‍යය සහ සනීපාරක්ෂාව යන තත්ත්වයන් මත ආවරණයක් ලබා ඇත්ද යන වගට, සහ එකම පවුලේ සාමාජිකයින් වෙන් නොකරන ලද බවටත්, අධිකාරියන් සහතික වීමට පියවර ගත යුතුය. ආපදාවන් හෝ සන්නද්ධ අරගලයන්

හේතුවෙන් හදිසි නීතිය ඇති තත්ත්වයන්වල හැර අවතැන් වීම සිදුවන්නේ නම්, ජාතික අධිකාරීන් මගින් පහත සඳහන් පියවර ගැනීම අවශ්‍යය:

- අවතැන්වීම අනුමත කරමින් ගන්නා ලද නිශ්චිත තීරණයක්, ඒ වැනි නීතිමය පියවරක් ගැනීමේ බලය ඇත්තා වූ රාජ්‍ය අධිකාරියක් විසින් ගනු ලැබ ඇති බවට සහතික කර ගැනීම;
- අවතැන් වූවන්ට ඔවුන්ගේ අවතැන්වීමේ හේතුන් සහ අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙළවල්ද වන්දි ගෙවීමේ සහ අළුත් ස්ථානයක් නැවත පිහිටුවීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටියන්ද, ක්‍රියාවේ යෙදිය හැකි ස්ථාන වෙත දැක්වීම;
- අවතැන් වී සිටින්නා වූ අයගෙන් ඒ ගැන දැනුවත්කම සහ අවධානය ද සහතිකව දෙන කැමැත්ත ද ලබා ගැනීම;
- අවතැන් වීමට ලක් වූවන්, විශේෂයෙන්ම ස්ත්‍රීන් ඔවුන්ගේ අළුත් ස්ථානයේ ක්‍රියා පිළිවෙළවල් සැලසුම් කරගැනීමෙහිත් එය හසුරුවා ගැනීමෙහිත් යෙදවීම කර, සඵලවත් පිළියමක් ලබාගැනීම කෙරෙහි අවතැන් වූ ජනතාවගේ අයිතිය රැකීමට සහතික කරගැනීම.

සියලු ප්‍රතිපත්තීන්ට ඉහළින් වන ප්‍රතිපත්තියක් ලෙස, අවතැන් වූවන්ගේ සුරක්ෂිතභාවය, නිදහස, අභිමානය සහ ජීවන අයිතීන් උල්ලංඝනය නොවන සේ අවතැන කරගෙන යා යුතුය. මීට අමතරව, අවතැන් වූවන්, යම් ප්‍රදේශයකට ආවේණික වූ කණ්ඩායම් ලෙසද, සුලුතර කණ්ඩායම් ලෙසද, ගොවි හා කෘෂිකාර්මික හෝ ගැමි කණ්ඩායම් ලෙසද, පිටිසරබද ජීවිතයට හුරු වුණු කණ්ඩායම් ලෙස සහ තම යටත් ප්‍රදේශයට ඇත්තා වූ තද ලෙන්ගතුකමක් සහිත කණ්ඩායම් ලෙසද බෙදී ඇති අතර, ඔවුන්ගේ අවතැනට විරුද්ධව ඔවුනට ආරක්ෂාව සැපයීමේ විශේෂිත වූ වගකීම් සහිත රාජකාරියක් රාජ්‍යයන් සතුව ඇත.

## 2 ගැටලුව ගැන ජාතික අවධානය ඉහළ නැංවීම

අභ්‍යන්තර අවතැන්වීම සිදුවන විට, තම ප්‍රදේශයේ එම ගැටලු පවතින බවත්, එය ආමන්ත්‍රණය කිරීමෙහි මූලික පියවර තමා සතු බවත් පිළිගෙන එමගින් සඵලවූ ජාතික ප්‍රතිචාරයක් ලබා ගැනීම රාජ්‍යයේ වගකීම යි. අභ්‍යන්තර අවතැන් වීමක් රාජ්‍යයක් විසින් හඳුනාගත් බවත් පිළිගත් බවත්, ඒ අනුව අවතැන් වූවන්ගේ අවාසනාවන්ත ගැටලු තත්ත්වය ආමන්ත්‍රණය කිරීම එහි පරම වගකීම බවත්, ප්‍රසිද්ධ උච්චාරණය මගින්ද මාධ්‍ය භාවිතයෙන් හා රජය විසින් ගොඩනගන ලද උපක්‍රම තුළින්ද අවතැන් ජනගහනයට දැන්වීමේ ක්‍රම සමහරකි. යම් රාජ්‍යයක් “මාර්ගෝපදේශක ප්‍රතිපත්ති” පිළිගැනීම හා භාවිතය මගින් ඉතා වැදගත් ලෙස පෙන්වා සිටින්නේ අවතැන් වූවන්ගේ විශේෂ අවශ්‍යතාවන් හඳුනා ගැනීම සහ රාජ්‍ය වගකීම අනුව ඔවුන්ගේ හිමිකම් ආරක්ෂා කිරීම හා ඔවුන්ගේ අවශ්‍යතාවන් ආමන්ත්‍රණය කිරීමය.

අභ්‍යන්තර අවතැන් වීමක් ගැන හඳුනා ගැනීමට නම් ගැටලුව සම්බන්ධව ජාතික අවධානය

නගා සිටුවීම, අවතැන් වීමට තුඩු දෙන ප්‍රශ්නය ගැන ජාතික එකඟතාවක් ගොඩ නැගීම හා ජාතික ප්‍රමුඛතාවක් වන අර්බුදය ආමන්ත්‍රණය කිරීමට උත්සාහ කිරීම අවශ්‍ය වේ. අවතැන් වූවන් සමග ජාතික සහයෝගිතාවක් ගොඩ නැගීම අත් නොහැර කළ යුතුය. මෙය ඔවුන්ගේ ආරක්ෂාවට ඉතා වැදගත් වන අතර, අභ්‍යන්තර අවතැන්වූවන් බොහෝ අවස්ථාවල හිරිහැර විඳින ජනවාර්ගික, වාර්ගික සහ මතවාද සිදුවීම් නිෂ්ඵල කිරීමටද ඉතා වැදගත් වේ. මෙම ලක්ෂණ, අභ්‍යන්තර අවතැන් වූවන් වැඩි අවදානමකට තල්ලු කරන අතර, අවශ්‍යතා දන්වා සිටීමෙන් ඔවුහු වළක්වා, අදෘශ්‍යමාන ගතිය තවත් වැඩිකර, කොන් වී සිටීමේ හේතුවෙන් නැවත ඒකීයකරණයක් ඇති කිරීම දුෂ්කර කරයි.

ජාතික ප්‍රජානනය ඉහළ නැංවීමට ගන්නා උත්සාහයට, සියලුම අදාළ අධිකාරීන් සඳහා සංවේදීකරණ සංවිධාන, යුද හමුදාව සහ පොලීසිය ද, පොදු ප්‍රජාවෙහි බලපෑම් ඇති ප්‍රදේශද ඇතුළත් වන අතර අභ්‍යන්තර අවතැන් වීම ආමන්ත්‍රණය කිරීම සඳහා ජාතික වගකීම සමාජයේ සියලු ම කොටස් විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන සංකල්පයක් බවට පත් වේ. එවැනි සංවේදීකරණ සංවිධාන අතිශයින්ම ඵලදායී වන්නේ අවතැන් ප්‍රජාවන් සහ නාගරික සමාජවලින් ලබාගන්නා උපදෙස් මත ගොඩනැගෙන විටය.

ඇත්තෙන්ම අභ්‍යන්තර අවතැන් වීම පිළිබඳ පොදු තොරතුරු සඳහා නිරත වන සංවිධානවල වැදගත් කොටස්කරුවෙක්, රාජ්‍ය අධිකරණ සංවේදීකරණය කිරීම, ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධානයන්හි කාර්යය තුළ මානව හිතවාදී ස්වභාවය පොදු ප්‍රජාවට වටහා දීම, අභ්‍යන්තර අවතැන් වූවනට උදව් දෙන සහ ඔවුන් වෙනුවෙන් හෝ පක්ෂව කතාකරන අනෙකුත් නාගරික සමාජ කණ්ඩායම් ඔවුන්ගේ ශාරීරික සුරක්ෂිතභාවය බරපතළ අවදානමකට තබන තත්වයන් තුළ පවා නිතරම මෙම ප්‍රයත්නයන් දැරීමට බැඳී සිටීම, කළ යුතුයි.

## 3 දත්ත එකතුව

අභ්‍යන්තර අවතැන් වූවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමටත් ඔවුන්ගේ අවශ්‍යතාවන් ආමන්ත්‍රණය කිරීමටත් සඵල වූ ප්‍රතිපත්තීන් සහ වැඩ සටහන් සැලසුම් කිරීමටත්, ඔවුන්ගේ තත්ත්වයන්, ස්ථානයන් සහ සංඛ්‍යාවන් ගැන විශ්වසනීය තොරතුරු අත්‍යවශ්‍ය වේ. අවතැන් වූවන් අතරින් විශේෂ කණ්ඩායම්වල නිශ්චිත අවශ්‍යතාවන් පිළිබඳව ලබාගන්නා ලද ඔවුන්ගේ දත්තයන් මත වයස, ලිංගික වර්ගීකරණය සහ අනෙකුත් ප්‍රධාන දර්ශකයන් ලෙස කොටස්වලට වෙන්කර ගැනීමෙන්, නිවෙස්වල ස්ත්‍රී නායකත්වය, කාත් කවුරුත් නැති කුඩා ළමයි, මහලු අය, නොහැකියාව ඇති අය, ජනවාර්ගික සුලුතරයින්, සහ ප්‍රදේශයකට පමණක් ආවේණික වූ අය ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය කළ හැකි වේ. සියලුම අවතැන් වූවන් කඳවුරු තුළ හෝ, සංග්‍රහකාරක පවුල් සමග හෝ අන් ජනාවාස කරන ලද ස්ථානවල සිටියත්, එය ඔවුන් සියලු දෙනාම ආවරණය කළ යුතුය. අභ්‍යන්තර අවතැන්වූවන්ගේ, වෙනස් වෙනස් ප්‍රවර්ගවලටද අවධානය දිය යුතු අතර, යුද්ධමය අරගලවලින් සිටි තැන්වලින් ඉවත් කරනු ලැබූ අයද, ව්‍යාප්ත වූ ප්‍රචණ්ඩ ක්‍රියා නිසා මානුෂීය හිමිකම් උල්ලංඝනය වීමෙන්, සහ ස්වාභාවික ආපදාවන්

හේතුවෙන් අවතැන් වූවන්ද, සංවර්ධන ව්‍යාපෘතීන් සහ අනෙකුත් හේතූන් නිසා අවතැන් වූ ජන කොටස් ද මීට ඇතුළත්ය. මීට අමතරව, හදිසි තත්වයන් තුළ අභ්‍යන්තර අවතැන් වූවන්ගේ තොරතුරු පමණක් නොව, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ අවශ්‍යතාවන් කාලයත් සමග වෙනස් වන නිසා, දිග්ගැස්සීම් නිසා කල් ගත වූ අවස්ථා තුළ සිදුවූ අවතැන්වල තොරතුරුද අළුතෙන් සැකසූ තොරතුරු විය යුතුය. කැරලිකාර කණ්ඩායම් විසින් පාලනය කර ලබන පළාත්වල ජීවත්වන අවතැන් ජනතාවන්ගේ තොරතුරු ද, එක්රැස් කිරීමට උත්සාහ කළ යුතුය.

අවතැන් වූවන්ගේ දත්ත එකතු කිරීමේ ප්‍රයත්නය කොයි ආකාරයෙන් වත් ඔවුන්ගේ ආරක්ෂාව සුරක්ෂිතභාවය සහ එහා මෙහා යෑමේ නිදහස අනතුරට හෙළා දැමීමක් නොවිය යුතු බවට අවධාරණය කළ යුතුය. විශේෂයෙන් අවතැන් වූවන්ගේ තත්ත්වය කෙරෙහි සංවේදී වීමේ අවශ්‍යතාවක් ඇති වන්නේ ඔවුන්ගේ තොරතුරු දන්වා සිටීමට ඔවුන් තුළ සුලු පෙළඹවීමක් පමණක් පහළ වීමෙන් තමන් ගැන දන්වා සිටීමට බියක් ඇති වූවන් හෝ හරියාකාර සහ නිවැරදි ලියකියවිලි තමන් සතුව නැති වූවන් අවතැන් වීම තුළ ඇති නිසාය. අවතැන් වූවන්ට, ඔවුන්ගේ ඒ අවාසනාවන්ත තත්ත්වයන් සඳහා විසඳුම් සොයාගැනීමට උදව් කිරීමත්, ආරක්ෂාව සහ උදව් ආධාර දීමත්, පහසු හා සාර්ථක වන  ලෙස තොරතුරු එක්රැස් කිරීමේ කර්තව්‍යය උද්යෝගිමත් වූ සූදානමකින් තිබිය යුතුය. අභ්‍යන්තර අවතැන් වූවන් ගැන දත්ත තොරතුරු රැස් කිරීමේ කාර්යය සඳහා දරන ප්‍රයත්නයට ජාත්‍යන්තර සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන ද සතු පළපුරුද්ද සහ විශේෂඥ ඥානය ද, දේශීය රාජ්‍ය නොවන සංවිධානද, පර්යේෂණ කරන්නවුන්ද, එම රාජ්‍යයන් මගින් ආධාරයට බඳවා ගත හැකි ය.

සමස්තයක් වශයෙන් ගත් කල, අභ්‍යන්තර අවතැන් වූවන්ට ආධාර උදව් සහ ආරක්ෂාව ලබාදීමේ ප්‍රයත්නයෙහි වඩා සාර්ථකත්වයක් ලබා ගැනීමේ දර්ශනයක් ඇතිව, එම රටෙහි අවතැන් වූවන්ගේ සංඛ්‍යාව, අවශ්‍යතා සහ තත්ත්වය යන කරුණු ගැන මනා අවබෝධයක් සහ පැහැදිලි රූපයක් ලබා ගැනීම ඉලක්ක කර ගත් දත්ත තොරතුරු සෙවීමේ ප්‍රයත්නයක් තිබිය යුතුය.

එහෙයින් දත්ත එක්රැස් කිරීමේ ප්‍රයත්නයන් එම කාර්යය පිළිබඳව අතිශයින්ම සැලසුම්කාරී වේ. පොදු සමාලෝචනයක් හෝ වෙනත් පරිපාලන ආරම්භයක් මගින් දත්ත එක්රැස් කිරීමට (ලියාපදිංචි කරවීමේ ක්‍රියා පිළිවෙළ ඇතුළු) අභ්‍යන්තර අවතැන් වූවන් සහභාගි වූවත්, නොවූවත්, ඔවුන්ගේ රාජ්‍යයන් විසින් ඔවුන් හට ලබා දෙන ආරක්ෂාව සහ උදව් ආධාර භුක්ති විඳීමේ නීත්‍යානුකූල අයිතීන් මත බලපෑමක් නැත.

## 4 අභ්‍යන්තර අවතැන් වූවන්ගේ හිමිකම් පිළිබඳ පුහුණුව

අභ්‍යන්තර අවතැන් වූවන්ගේ හිමිකම් ගැන රාජ්‍ය නිලධාරීන්ගේ පුහුණුව, අවතැන්වූවන්ට ආරක්ෂාව හා උදව් ආධාර ලබාදිමේ වගකීම ගැන මනා අවබෝධයක් ඔවුන්ට ඇති බව සහතික කිරීමට අත්‍යවශ්‍ය වේ.

මෙම වගකීම් සඵලව සම්පූර්ණ කිරීමට රජයේ ධාරිතාව සහ වග කිව හැකි ප්‍රමාණය ගොඩනැගීමද මෙයින් කොටසකි. විශේෂයෙන්ම පුහුණු කිරීම් ඉලක්ක කර ගත යුත්තේ:

- ජාතික මට්ටමේ රාජ්‍ය ප්‍රතිපත්ති ගොඩ නගන්නන්
- අවතැන් වූවන් සමග වඩා සෘජු සන්නිවේදනයක් සහ රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමේ වගකීමද, ක්ෂේත්‍රයේ වැඩ සටහන් ද, හා සම්බන්ධ ස්ථානීය සහ ප්‍රාදේශීය රාජ්‍ය නිලධාරීන්
- අභ්‍යන්තර අවතැන්වූවන්ගේ ආරක්ෂාව ගැන සහතික කිරීමේ මූලික භූමිකාව අපේක්ෂා කරන ලද්දවුන් ලෙස හමුදාව සහ පොලීසිය
- මානුෂීය හිමිකම් ආරක්ෂා කිරීම සහ මානව සුභ සාධන ආධාර සඳහා වගකීම් ඇති නිලධාරීන් සහ අභ්‍යන්තර අවතැන් කඳවුරුවල කළමනාකාරවරුන්
- ජාතික මානුෂීය හිමිකම් ආයතනවල කොමසාරිස්වරුන් සහ කාර්ය මණ්ඩලය
- නීති සම්පාදනය සංවර්ධනයෙහි ප්‍රධාන කාර්යයන් ඉටු කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්
- රාජ්‍යයන් විසින් නාගරික සමාජයන් සඳහා අභ්‍යන්තර අවතැන් වූවන්ගේ අයිතීන් ගැනද වැඩියෙන්ම වැදගත් වන අභ්‍යන්තර අවතැන් වූවන්ට තමන්ගේම අයිතීන් ගැන දැනගැනීමේ අයිතිය ගැනද පුහුණු වීම් සතුටින් පිළිගත යුතුය.

පුහුණු වීම් විසින්, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ හිමිකම් ආමන්ත්‍රණය කිරීමත්, “මාර්ගෝපදේශක ප්‍රතිපත්තීන්” තුළ තේරුම් කර ඇති පරිදි රාජ්‍යයන්, අවතැන් වූවන් කෙරෙහි දැක්විය යුතු වගකීමත්, වැළැක්වීමේ සිට කල් පවතින විසඳුම් සොයා ගැනීමට දක්වන හදිසි හෝ ඉක්මන් ප්‍රතිචාර දක්වා අවතැනක සියලුම අදියරයන් ආවරණය කිරීමත් කළ යුතුය. මෙම ගැටලු හෝ ප්‍රශ්න ආවරණය කිරීම සඳහා පුහුණු කොටසක් ඇති අතර, රාජ්‍යයන් තමන්ගේ ආරම්භක පුහුණු වීම් කිරීමට එම පුහුණු කොටස ඇද ගැනීම ප්‍රයෝජනවත් වන බව වටහා ගැනීම හෝ පුහුණු කිරීම සඳහා වැඩ මුළු ඉල්ලා සිටීම සිදු විය හැකිය. සත්‍යයෙන්ම අවතැන් වූවන්ගේ පුහුණුවක් සඳහා රාජ්‍යයක් කළ ඉල්ලීමකට ප්‍රතිචාර දක්වමින් මෙම පුහුණු කොටස, පළමුවෙන්ම ගොඩනගන ලද්දේ වර්ෂ 1999 නොර්වීජියානු සරණාගතයින්ගේ සභාවෙහි මීහිමත අභ්‍යන්තර අවතැන් වූවන්ගේ ව්‍යාපෘතිය සහ මානුෂීය හිමිකම් පිළිබඳව එක්සත් ජාතීන්ගේ තානාපතිවරයා විසින්ය.

රජයන් විසින් ගත හැකි පියවර ආමන්ත්‍රණය කිරීමට පුහුණු කිරීම වැදගත් විය හැකි අතර, අභ්‍යන්තර අවතැන් වූවන් කෙරෙහි ජාතික වගකීම සඵලව ඉෂ්ට කිරීම සඳහා වෙනත් ප්‍රතිපත්ති තෝරා ගැනීමේ නිදහස ඇත. මේ හා සම්බන්ධව සටහන් කරගැනීම වැදගත් වන “වෘත්තියෙහි නියැළෙන්නන් සහ ප්‍රතිපත්ති නිර්මාණය කරන්නන් සඳහා සංක්‍රමණය කළමනාකරණයෙහි අත්‍යවශ්‍යතාවන්” යන්න සංක්‍රමණය සඳහා ජාත්‍යන්තර සංවිධානය විසින් වර්ධනය කරන ලද අතර එහි අභ්‍යන්තර අවතැන පිළිබඳ පාඨමාලාවක් ඇත. අභ්‍යන්තර අවතැන් වූවන් කෙරෙහි වන ජාතික වගකීම සඳහා ආමන්ත්‍රණයෙහි වැදගත්කම, අවශ්‍යතාව අවධාරණය කිරීම සහ “මාර්ගෝපදේශක ප්‍රතිපත්ති”වල උචිත භාවය අවධානයට ලක්කිරීමට අමතරව, මෙම අධ්‍යයන ඒකකය මගින් හඳුනා ගැනීමෙන් පසු විස්තර කෙරෙන්නේ අභ්‍යන්තර අවතැන් වූවන් කෙරෙහි,

රාජ්‍යයන්ට ඔවුන්ගේ වගකීම සම්පූර්ණව සපුරාලීමට ගත හැකි මුල් පියවරයන්ය. තවත් උපදේශාත්මක විස්තරයක් වනුයේ, පොදු රාජ්‍ය මගින් කරන ලද ප්‍රකාශනයක් වන පොදු රාජ්‍යයේ සාමාජීය ප්‍රාන්ත රජයන් සඳහා ඉදිරිපත් කෙරෙන "ජාතික හොඳම නියැළීම්" යන්නයි. තව දුරටත් "ඇමරිකාවේ අභ්‍යන්තර අවතැන" නම් ප්‍රාදේශීය සම්මන්ත්‍රණයක් විසින් ප්‍රාදේශීය රාජ්‍යයන් සඳහා ජාතික වගකීම මත ක්‍රියා කෙරෙන පාදක ව්‍යුහයට අනුමැතිය පළ කෙරිණි.

## 5 අභ්‍යන්තර අවතැන් වූවන්ගේ හිමිකම් අනුමත කිරීමේ ජාතික නීත්‍යනුකූල ව්‍යුහය

ප්‍රධානවම හා මූලිකවම ආරක්ෂාව නීත්‍යානුකූල සංකල්පයක් බැවින්, ජාතික නීත්‍යානුකූල පාදක සැකසුමක් හෝ මූලික ක්‍රමයක් අභ්‍යන්තර අවතැන් වූවන්ගේ හිමිකම් අනුමත කිරීම සහ එහි සමාප්තියට කාර්ය මාධ්‍යයක් වීම, ජාතික වගකීමෙහි විශේෂ සහ වැදගත් පිළිබිඹුවයි. ලෝකයේ සියලුම ප්‍රදේශවල ඇති රටවල් තුළ, අභ්‍යන්තර අවතැන මත සිදු කෙරෙන නීති සම්පාදනය පිළිගැනීම, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ විස්තර දන්වා සිටීමට වැදගත් බව ඔප්පු වී ඇත්තේ, ඔවුන්ගේ හිමිකම් පැහැදිලි කර දන්වා සිටීමෙන් සහ ඔවුන් කෙරෙහි රාජ්‍යයන් මගින් සිදුවිය යුතු යුතුකම් ස්ථාපනය කිරීමෙන්ය. අවතැන් වීමෙහි විශේෂිත වූ අදියරයන් පිළිබඳව රාජ්‍යයන් විසින් නීති පිළිගැනීම, සමහර අවස්ථාවන්වල සිදු කරන ලද්දේ, නැවත පැමිණීම සහ අළුතෙන් පදිංචි කරවීම, පිළිපැදිය යුතුව ඇති අවම ප්‍රමිතීන් ලෙස පෙන්වමින්ය. අනෙකුත් අවස්ථාවල අභ්‍යන්තර අවතැන් වීම පිළිබඳ රාජ්‍යයන් පරිපූර්ණ ජාතික නීති පිළිගෙන ඇත්තේ අවතැන් වීමෙහි සියලු අදියරයන් ආවරණය කරමින්ය. "අභ්‍යන්තර අවතැන පිළිබඳ මාර්ගෝපදේශක ප්‍රතිපත්ති" සමග දැන් පවතින ජාතික නීති සම්පාදනයෙහි ඇති අනුකූලතාව විවේචනාත්මකව විග්‍රහ කර, ඒ අනුව නීත්‍යානුකූල සහ පරිපාලන නීතිරීති පරීක්ෂා කර සංශෝධනය කිරීම තවත් යෝජනාවක් වී ඇත. සමහර රටවල ප්‍රාදේශීය නීතිඥ කණ්ඩායම් සහ රජයේ නොවන සංවිධාන, "මාර්ගෝපදේශක ප්‍රතිපත්ති"වලට ඇති විවරණය මග පෙන්වීමක් ලෙස භාවිතා කරමින්, ඔවුන්ගේ නීති මාලාවන්, "ප්‍රතිපත්තීන්" අනුව පිළියෙළ කිරීමට තම රාජ්‍යයන් සමග එවැනි සමීක්ෂණ පවත්වා ඇත.

කොයි ආකාරයක එළඹීමක් ගත්තත්, අභ්‍යන්තර අවතැන් වීම ගැන වන ජාතික නීති සම්පාදනය, ජාත්‍යන්තර මට්ටම් හා සමග එක පෙළේ වැටිය යුතු වන්නේ "මාර්ගෝපදේශක ප්‍රතිපත්තීන්"වල පැහැදිලි කර ඇති ලෙසය. ඇත්තෙන්ම ලොව පුරා රාජ්‍යයන්, එක්සත් ජාතීන්ගේ යෝජනාවන් තුළින් "මාර්ගෝපදේශක ප්‍රතිපත්තීන්" සැලකීමට ගෙන, අභ්‍යන්තර අවතැන් වූ ජනගහනයන් ඇති ප්‍රාන්තවලට ශක්තිමත් කරන ලද ජාතික නීතිමය පාදක ව්‍යුහයන් ගොඩනැගීම දිරිමත් කර ඇත. මෙම ඇමතීම ප්‍රාදේශික මට්ටම්වල දෝංකාර වී ඇත්තේ "මාර්ගෝපදේශක ප්‍රතිපත්තීන්" සමග නිශ්චිත යොමුවකින් අභ්‍යන්තර අවතැන් වීම මත ජාතික නීතීන් සහ ප්‍රතිපත්තීන් ගොඩනැගීමේ ප්‍රයෝජනවත් අවියක් ලෙස ය. මෙම ප්‍රයත්නයන්ට ආධාර දීමට අභ්‍යන්තර අවතැන් වූවන්ගේ මානව හිමිකම් ආයතනයේ මහාලේකම්ගේ නියෝජිතවරයා, අභ්‍යන්තර අවතැන් වීම පිළිබඳ මූල්‍ය කරුණු හඳුනා දක්වමින් නීත්‍යානුකූල මගපෙන්වීමක් ලබාදෙන, අභ්‍යන්තර අවතැන් වීම සඳහා ඇති ජාතික නීති සම්පාදනයට ඇතුළත් කිරීමට සහ දේශයේ හෝ රටෙහි නීති

සම්පාදකයින් සඳහාද, අත්පොතක් ඉදිරිපත් කරයි. මෙම ඇමතීම ප්‍රාදේශික මට්ටම්වල දෝංකාරවී ඇත්තේ "මාර්ගෝපදේශක ප්‍රතිපත්තීන්" පිළිබඳ ලේකම්ගේ නියෝජිතවරයා, අභ්‍යන්තර අවතැන් වීම් මත මූලික කරුණු හඳුනා දක්වමින්, නීත්‍යනුකූල මගපෙන්වීමක් ලබාදෙන අභ්‍යන්තර අවතැන් වීම් සඳහා ඇති ජාතික නීති සම්පාදනයට ඇතුළත් කිරීමට හා දේශයේ හෝ රටේ නීති සම්පාදකයින් සඳහාද අත්පොත් ඉදිරිපත් කරයි.

## 6 අභ්‍යන්තර අවතැන් වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් හෝ ක්‍රියා සැලැස්මක්

ජාතික අවතැන් වීම් මත පිළිගැනුණු නිශ්චිත ජාතික ප්‍රතිපත්තියක් හෝ ක්‍රියා සැලැස්මක් අනුපූරක වූවත් ජාතික නීති සම්පාදනයෙහි පැනවීම්වලට ක්‍රියාමාර්ගයක් වනු ඇත. එනම්, ජාතික අවතැන් වීම් පිළිබඳව වන, ජාතික ප්‍රතිපත්තියක් හෝ ක්‍රියා සැලැස්මක් ඉදිරිපත් කරමින් ජාතික සහ ස්ථානීය සංස්ථාගත වගකීම් සඳහා අභ්‍යන්තර අවතැන් වීමට ප්‍රතිචාරය දක්වමින් වෙනත් වෙනත් රාජ්‍ය දෙපාර්තමේන්තුවල වගකීම් සහ කර්තව්‍යයන් විදහා දක්වමින්, ඔවුන් අතරේ සම්බන්ධීකරණයක් ඇති කර ගැනීම සඳහා ක්‍රියාදාමයන් හඳුනාගත යුතුය.

"මාර්ගෝපදේශක ප්‍රතිපත්තීන්" පාදක ව්‍යුහයක් ලෙස භාවිත කිරීමෙන්, අවතැන් වීමක සියලු අදියරයන් ජාතික ප්‍රතිපත්තියක් හෝ ක්‍රියා සැලැස්මක් මගින් ආවරණය කළ යුතු අතර, වැළැක්වීමේ ක්‍රියාදාමයේ සිට ආරක්ෂාව තෙක් සහ අවතැන් වූවාට පසුව උදව් ආධාර දීම, නැවත පැමිණීම හෝ ජනාවාස කිරීමද, ප්‍රතිසංකලනය කිරීමද කළ යුතුය. විශේෂිත වූ අවධාරණය දිය යුත්තේ හිතුවක්කාර අවතැන් වීම වැළැක්වීම ගැන විශේෂිත වූ විස්තර වශයෙන් පැහැදිලි කරන ලද පියවර මගින්, අවතැන් වීමට හේතුවන තත්ත්වයන් මගහැරීමට සහ අවතැන් වීමෙහි අසතුටුදායක ප්‍රතිඵල අවම කිරීමටත්ය. ජාතික ප්‍රතිපත්තියක් හෝ ක්‍රියා සැලැස්මක් මගින් අවතැන් වීමට තුඩු දෙන නොයෙකුත් හේතූන් සොයාගෙන අරගලයන් සහ මානව හිමිකම් උල්ලංඝනය පමණක් නොව ස්වාභාවික සහ මිනිසා විසින්ම කරන ලද ආපදාවන් නිසාත්, සංවර්ධන වැඩ සටහන් නිසාත්, යන මේ සියලුම හේතූන් වටකර ගත යුතුය. වැඩි දුරටත්, ඒ මගින් නිශ්චිත වූ අවතැන් වූවන්ගේ කණ්ඩායම්වල විශේෂ අවශ්‍යතාවන් ආමන්ත්‍රණය කිරීමට ගන්නා පියවර විස්තර වශයෙන් පැහැදිලි කිරීම මෙමගින් සිදුවිය යුතු අතර, නිවෙස්වල ස්ත්‍රී නායකත්වය, ළමුන්, සහ වැඩිහිටියන්, ප්‍රදේශයකට පමණක් සීමිත වූ අය සහ ජනවාර්ගික සුලුතරයින් මෙයට අයත්ය.

අභ්‍යන්තර අවතැන් වූවන්ගේ ප්‍රජාවන් සමග පරිපූර්ණ සම්මේලන ගොඩනගා ගත් විට, එම අවතැන් වීම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ඉතා සඵල වනු ඇත. සම්පූර්ණ කර අවසන් වූ වහාම ප්‍රතිපත්තිය හෝ ක්‍රියා සැලැස්ම, ඉතා පුළුල්ව ව්‍යාප්ත කරවීම කළ යුතු වන්නේ, විශේෂයෙන්ම අභ්‍යන්තර අවතැන් වූවන් හට ඔවුන්ගේම මව් බසින් සහ ඔවුන්ට ඉතා පහසුවෙන් තේරුම් ගත හැකි ආකෘතියක් ලෙස පිළියෙළ කිරීමෙන්ය. අභ්‍යන්තර අවතැන් වූවන්හට ප්‍රතිපත්තීන් සහ වැඩසටහන් විධිමත්ව සකස් කරන විට, ඔවුන් සමග වැඩ කරන්නාවූ, ඔවුන් වෙනුවෙන් කතා කරන්නාවූ නාගරික සමාජ කණ්ඩායම් සහ ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධාන සමගද, රාජ්‍යයන්

සමීපව වැඩ කටයුතු කිරීම, වැදගත් වේ. මෙම කණ්ඩායම් අවතැන් වූවන් සමග ඇති සමීප සබඳතාවෙන් නිතරම වැටහෙන්නේ අභ්‍යන්තර අවතැන් වූවන්ගේ ප්‍රාර්ථනාවන් සහ අභිලාෂයන් පිලිබිඹු කරගැනීමේ හැකියාවක් ඇති පරිදි ඔවුන් සැරසී සිටින බවත්, ඔවුන්ගේ දර්ශනයන් සඳහා ශබ්ද නැගීමක් ලබාදීමට හැකිව ඇති බවත්, ඔවුන්ගේ අවශ්‍යතාවන් ආමන්ත්‍රණය කිරීම සහ ඔවුන්ගේ හිමිකම් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය උපක්‍රම යෝජනා කිරීමේ හැකියාව ඇති බවත්ය.

අභ්‍යන්තර අවතැන් වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියා සැලැසුම් තෝරා, ගොඩ නගා, ඒවා පිළිගැන්වීමේ සූදානම්භාවය මගින්, රජයක් තුළ එම අභ්‍යන්තර අවතැන් වීමෙහි ගැටලුව සහ එය ආමන්ත්‍රණය කිරීමේ තම වගකීම් ගැනද වැටහීමක් ඇති බව පෙන්වන වැදගත් ඉඟියක් වන අතර, එසේ කිරීම ජාතිකව සහ ජාත්‍යන්තරව ඇති ප්‍රමුඛතාවක් බව සංඥා කරයි. අභ්‍යන්තර අවතැන් වීම අත්දකින රටවල්වල රජයන්වලට, ජාතික සැලැසුම් තෝරා පිළිගැනීමට හෝ අභ්‍යන්තර අවතැන් වූවන්ට ආරක්ෂාව සහ උදව් ආධාර සැපයීමට මුල පිරීමට එක්සත් ජාතීන්ගේ යෝජනාවන් දිරිය ලබා දී ඇත.

## 7 අභ්‍යන්තර අවතැන් වූවන් සඳහා, ජාතික සංස්ථාගත නාභීය ලක්ෂ්‍යය

අභ්‍යන්තර අවතැන් වීම පිළිබඳ ජාතික සංස්ථාගත නාභීය ලක්ෂ්‍යය නිර්මාණය කිරීම, ගැටලුව කෙරෙහි රඳා පවතින අවධානයක් සහතික කිරීමටත්, තවද ජාතික සහ ජාත්‍යන්තර සහකාරයින් සමගද, රාජ්‍යයන් ඇතුළතමද සම්බන්ධීකරණයක් සඳහාත් පහසුකම් සැලසීම සඳහා අවශ්‍යම විය හැකි ය.

වෙනත් වෙනත් සංස්ථාගත විකල්ප ගණනාවක් ඇත. සමහර රටවල, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ වගකීම ඉටු කිරීම සඳහා වන පැවරුමට එවකට පවතින රාජ්‍ය නියෝජිත ධුරය එකතු කරනු ලබන්නේ, සරණාගත ගැටලු භාරව සිටින රජය හෝ සමාජ සුභ සිද්ධි දෙපාර්තමේන්තුව යනාදී ලෙසය. අනෙකුත් රටවල, සංවිධානාත්මක සමූහයක් හට අභ්‍යන්තර අවතැන් වූවන් පමණක්ම පිළිබඳ අවධානය යොමු කිරීම පවරා ඇත. එහෙත් තවත් අවස්ථාවල අවතැන් වූවන් පිළිබඳ සාකච්ඡා සම්බන්ධීකරණය පහසු කිරීමටත්, ජාත්‍යන්තර ප්‍රජාවද ඇතුළුව, සඵල වූ ප්‍රතිචාරයක් සහතික කිරීමට අවශ්‍ය උපක්‍රම ගොඩනැගීමටත්, අදාළ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල නිලධාරීන් නිතරම එකට එක්රැස් කිරීම සඳහා රාජ්‍ය කමිටුවක් හෝ ක්‍රියා කරන කණ්ඩායමක්, හෝ කාර්ය සාධක බළමුළුවක් ගොඩනගන ලදුව ඇත.

කොයි ආකාරයේ සංස්ථාගත විකල්පයක් තෝරාගනු ලැබුවත්, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ ආරක්ෂාව හා උදව් ආධාර සඳහා පැවරුමක් ජාතික සංස්ථාගත නාභීය ලක්ෂ්‍යයට තිබීම, අතිශයින් වැදගත්ය. එහි කාර්ය මණ්ඩලය, අභ්‍යන්තර අවතැනෙහි ප්‍රශ්න මත පුහුණු කළ යුතු අතර, විශේෂයෙන් "මාර්ගෝපදේශක ප්‍රතිපත්ති" ගැන සහ ජාතික ප්‍රයත්නයන් තුළ ප්‍රධාන වූ කාර්යභාරයක් ඔවුන් මගින් සිදු කිරීම හෙවත් අභ්‍යන්තර අවතැන් වූවන්ගේ හිමිකම්වලට ගරු කිරීමද, ඔවුන්ගේ

අවශ්‍යතාව ආමන්ත්‍රණය කිරීමද බලාපොරොත්තුවෙන් සිටිය යුතුය. අභ්‍යන්තර අවතැන් වූවන් හට, අවතැන සම්බන්ධව කල් පවතින විසඳුම් තෝරා ගැනීමේ නිදහස, එනම් නැවත පැමිණීම හෝ ජනාවාස කිරීමට අනාරක්ෂිත සහ ස්ථාපනය කළ නොහැකි තත්ත්වයන් ඇති පළාත්වලට යාමට බල නොකිරීමට වගබලා ගැනීම මෙයට ඇතුළත් වේ. මෙය සඵල වීමට නම් සංවිධානාත්මක සමූහයට, මෙම පැවරීම ඉෂ්ට කිරීම සඳහා දේශපාලන ආධිපත්‍යය සහ ප්‍රමාණවත් උපක්‍රම තිබිය යුතුය.

රජයේ නොවන සංවිධාන සහ අනෙකුත් නාගරික සමාජ කණ්ඩායම් අභ්‍යන්තර අවතැන් වෙනුවෙන් කතා කිරීමේදී, වගකීම පවරා දෙන ලද සංවිධානාත්මක යන්ත්‍රණයේ වැඩ කටයුතුවලට පමණක් ප්‍රයෝජන විය හැකි වන අතර අභ්‍යන්තර අවතැන් වූවන් සඳහා ජාතික ප්‍රයත්නය හා සම්බන්ධීකරණය කිරීම සඳහා සහභාගිත්වයක් ලබා දෙයි. අභ්‍යන්තර අක්‍රියතාවේ තත්ත්වයන්ට, ජාතික සහ ජාත්‍යන්තර ප්‍රතිචාරය, වඩා හොඳට දැනුම් දෙනුයේ උදව් කරනුයේ සහ වැඩි දියුණු කෙරෙනුයේ හවුල් වීම් නිර්මාණය කිරීම, අභ්‍යන්තර අවතැන් වූවන් සමග නාගරික සමාජ කණ්ඩායම් ක්‍රියා කටයුතු කිරීමේදීය. එවැනි හවුල්වීම් වැඩි වියදමක් ඇති කරන බව, පිටරටවලින් දක්ෂවූ ප්‍රවීණයින් ගෙන්වීමේදී ඇති වන අධික වියදමින් දැකිය හැකි අතර, පිටින් මෙලෙස පැමිණෙන්නන් නිතරම ඉතා කෙටි කාලයකින් පිට වී යන විට ස්ථානීය ධාරිතාව හෝ හැකියාව කිසිසේත් ශක්තිමත් තත්ත්වයකට නොපමුණුවා යෑම දැකිය හැකිය. එසේනම්, රජයේ නොවන සංවිධාන සහ අනෙකුත් නාගරික සමාජ කණ්ඩායම්වල පුළුවන්කම් සහ දක්ෂතාවන් තව දුරටත් දියුණු කිරීම සහ ප්‍රාදේශීය ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා, අභ්‍යන්තර අවතැන් වූවන් ගත යුතු පියවරයන් සඳහා ජාතික සැලැසුම් ද, වැඩසටහන්ද ගොඩනැගීම වැදගත් වන බව ඔප්පු විය හැකි ය.

## 8 ජාතික මානව හිමිකම් ආයතන සඳහා භූමිකාවක්

මානව හිමිකම් ආරක්ෂා කිරීමත්, ප්‍රවර්ධනය කිරීමත් කෙරෙහි ජාතික ප්‍රයත්නයට ඉතා වැදගත් ආධාරයක් සහ දායකත්වයක් ජාතික මානව හිමිකම් සංවිධානයෙන් ලැබෙන බව කවුරුත් දන්නා හඳුනන දෙයකි. මෙම සංවිධානයන්, රාජ්‍යයන් විසින් ඔවුන් කෙරෙහි දක්වන ලද නිල හැඳුනුම භුක්ති විඳින අතර, නිතරම සැලකිය යුතු වැදගත් ගරු කිරීමක්, ජාතික සමාජ තුළම තිබිය යුතු බවට අණකර සිටින්නේ, සාමාන්‍යයෙන් ඔවුන්ගේ සංවිධානයේ මූලිකත්වය දරන්නන් සේවයෙන් විශ්‍රාම ගිය විනිසුරුවරුන් හෝ ගරු බුහුමන් ලබන මානව හිමිකම් සඳහා ක්‍රියාශීලී වන්නන් වැනි බලවත් හා විශිෂ්ට  ඇත්තන් නිසාය. අභ්‍යන්තර අවතැන් වීම් ඇති රටවල් තුළ ජාතික මානව හිමිකම් සංවිධානවලට අභ්‍යන්තර අවතැන්වූවන්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත්, වැදගත් සහ වටිනා කාර්යභාරයක් ඇති අතර, ඒ ආකාරයටම රාජ්‍යයන් විසින්, එක්සත් ජාතීන්ගේ විභේදන තුළ එය හඳුනාගෙන දිරිගන්වන ලදුව ඇත.

බොහෝමයක් ජාතික සංවිධානවල විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල,

ධාරිතාව හිඟ හෝ නොමැති තත්ත්වයක පැවතුණාට අභ්‍යන්තර අවතැන් වීමෙහි ගැටලු හා ප්‍රශ්න මත ඔවුන්ගේ අවධානය යොමු කිරීම ශීඝ්‍රයෙන් කෙරීගෙන යයි. මෙම ප්‍රයත්නයට රුකුලක් දීමට ජාතික මානව හිමිකම් සංවිධානයේ ආසියානු පැසිෆික් සංසදය, උදාහරණයක් ලෙස අවතැන් වූවන් වෙත සිත යොමු කළ හොත්, මෙම සංසදය මගින් එහි සාමාජික සංවිධානවල ධාරිතාව තක්සේරු කිරීම සඳහා ව්‍යාපෘතියක් ගොඩනගා ඇති අතර, ඔවුන්ගේ ධාරිතාවන් වැඩිකර දියුණු කිරීමට ජංගම ආධාරයක් ගොඩනගා ඇත.

අභ්‍යන්තර අවතැන් වීම් සමග කටයුතු කිරීමේදී, හොඳම ක්‍රියා මාර්ගය වනුයේ, අභ්‍යන්තර අවතැන් වීම් ජාතික මානව හිමිකම් සංවිධාන තුළම පැවරීමකට අයත්, මානව හිමිකම් සම්බන්ධව ඇති ප්‍රශ්නයක් බව රජයන් විසින් පිළිගැනීම සහ ඔවුන් විසින් මෙම සංවිධාන මගින් විෂය ආමන්ත්‍රණය කිරීමට අවශ්‍ය උපක්‍රම සහ සම්පත් වඩා විශාල ප්‍රමාණයකින් වෙන්කර තිබීමය. අභ්‍යන්තර අවතැන් වූවන්ගේ හිමිකම් ප්‍රවර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීමට ජාතික සංවිධාන විසින් ගත හැකිව ඇති පියවර අතර වනුයේ:

- අභ්‍යන්තර අවතැන්වූවන්ගේ තත්ත්වයන් අධීක්ෂණය කර බලා, රටෙහි අනෙකුත් පුරවැසියන් හා සමානවම හිමිකම් භුක්ති විඳිනවාද යන්න හා ඔවුන්ගේ හිමිකම් තක්සේරු කිරීමේදී වෙනස් කමක් කිරීමෙන් තොරව, ඔවුන්ට අවශ්‍ය ආරක්ෂාව හා උදව් ආධාර ලැබෙන්නට සැලසීම.
- අභ්‍යන්තර අවතැන් වූවන්ගේ මානව හිමිකම් සම්බන්ධව ඇති බරපතළ උලැඟීම්වල වාර්තාවන් ගැන සෝදිසි කිරීමට පිරික්සීමක් දියත්කර, අධිකාරියන් විසින් ඒ සඳහා සඵල වූ ප්‍රතිචාරයන් ලබාදෙන බවට වග බලා ගැනීම.
- අවතැන් වීම් ගැන, පෙර අනතුරු ඇඟවීම් සඳහා ඉදිරියට කටයුතු කර හිතුවක්කාර අවතැනට විරුද්ධව ජනතාවන් ආරක්ෂා කිරීම සඳහා සඵලවත් පියවර අධිකාරීන් විසින් ගන්නා ලද බවට සහතික කරගැනීම හා අධිකාරීන් මගින් ජනතාවන් අවතැන් කිරීමට ගන්නා ලද තීරණ, ක්‍රියාවෙහි යෙදවීම, "මාර්ගෝපදේශක ප්‍රතිපත්තීන්" තුළින් විදහා පාන පොරොන්දුවලට අනුකූලතාවක් තිබීම.
- අභ්‍යන්තර අවතැන්වූවන්ගේ හිමිකම් ගැන රජයට අවවාද කිරීම, විශේෂයෙන්ම ජාතික ව්‍යවස්ථාදායක සමූහයක් සමග ක්‍රියා කටයුතු කිරීමෙන්, අභ්‍යන්තර අවතැන් වීම් පිළිබඳ "මාර්ගෝපදේශක ප්‍රතිපත්තීන්" මත පදනම් වන ජාතික නීති ගොඩනැගීම සහ ප්‍රතිපත්තීන් සහ ක්‍රියා කටයුතු සැලැස්මවල් රාමු කිරීමට උදව් කිරීම, අභ්‍යන්තර අවතැන් වීමෙහි තත්ත්වයන් සාර්ථකව සහ සඵලව ආමන්ත්‍රණය කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන් සමග සහයෝගිතාවෙන් ක්‍රියා කිරීම.
- ජාතික නීති සම්පාදනය හෝ නීති පැනවීම රජය විසින් ක්‍රියාවේ යෙදවීමේ වාර්තාව අධීක්ෂණය කර රටවල් අතර වන ගිවිසුම් සමග ඇති වගකීමෙහි අනුකූලතාද අභ්‍යන්තර අවතැන් වූවන්ගේ ජාතික ප්‍රතිපත්තීන් සහ ජාතික සැලසුම් ක්‍රියාවේ යෙදවීම පිළිබඳව ද අධීක්ෂණය කිරීම.

- පුහුණු කිරීමේ වැඩ සටහන් සහ අධ්‍යාපනික ක්‍රියාකාරකම් භාර ගැනීම එනම් විශේෂයෙන්ම රජයේ ආයතනයන් සහ හමුදාවද අභ්‍යන්තර අවතැන් වූවන්ගේ හිමිකම් පිළිබඳ නීතිය බලයේ ක්‍රියාත්මක කරවන නියෝජිත ආයතන ද, ස්ත්‍රීන් ළමුන් සහ අනෙකුත් කණ්ඩායම් වැනි පහසුවෙන් අවදානමට ලක්වීමේ හැකියාව ඉහළ මට්ටමකින් අත්දකින්නවුන්ගේ අවශ්‍යතාවන් වන විශේෂිත වූ ආරක්ෂාව සහ උදව් කෙරෙහි දැනුවත්කම ඉහළ නැංවීම සඳහා විශේෂ අවධානයෙන් සිටීම.
- අභ්‍යන්තර අවතැන් වූවන් වෙනුවෙන් මුල් පියවර ගත් බව දන්වා සිටින අතර, ඔවුන්ගේ අදහස්වලින් දායකත්වය සහ තීරණ ගැනීම සඳහා ඔවුන්ගේ සහභාගිත්වයන් ආරාධනා කිරීමට වගබලා ගැනීම.
- අභ්‍යන්තර අවතැන් වූවන්ගේ සංගම්ද රජයේ නොවන ආයතනද, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීම සඳහා පක්ෂව කතා කරන නාගරික සමාජවල නියෝජිත පිරිස්ද සමග ශක්තිමත් සම්බන්ධතාවක් ඇති කර ගැනීම.
- අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කායික සුරක්ෂිතභාවය බරපතළ වූ අවදානමක පවතින පළාත්වල අධීක්ෂණාත්මක නියෝජනයක් ගොඩනැගීම, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ නැවත පැමිණීම සහ ජනාවාස කිරීම අධීක්ෂණය කර එය ස්වේච්ඡා සහ ප්‍රවේසම් තත්ත්වයන්වල සිදුවන බවට තීරණය කර ගැනීම.
- අනෙකුත් රටවල ජාතික මානව හිමිකම් සංවිධාන සහ ප්‍රාදේශික සමූහයන් සමග ජාලයක් ස්ථාපනය කිරීමෙන් අභ්‍යන්තර අවතැන් වීම මත ඇති තොරතුරු සහ අත්දැකීම් බෙදාහදා ගැනීමෙන් ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ගයක් ගොඩනගා ගැනීමේ දර්ශනයක් ඇති කර ගැනීම.

## 9 අභ්‍යන්තර අවතැන් වූවන් තීරණ ගැනීමේ ලා සහභාගි වීම

අභ්‍යන්තර අවතැන් වූවන් හට ඔවුන්ගේ රාජ්‍යයන්වලින්, මානව හිතවාදී ආධාර සහ ආරක්ෂාව, ඉල්ලා සිටීමට සහ ලබා ගැනීමට අයිතිය ඇත. අභ්‍යන්තර අවතැන් වූවනට ඔවුන්ගේ දර්ශන දන්වා සිටීමට, දඬුවමක හෝ හිංසා පීඩා හෝ පාඩුවක් ලැබීමේ අවදානමක් නොමැති වාතාවරණයක් තිබිය යුතුය.

කෙසේ හෝ, වැඩිපුරම වනුයේ අභ්‍යන්තර අවතැන්වූවන් හට උදව් ආධාර සහ වැඩ සටහන් ලැබුණත් ප්‍රතිපත්තීන් සහ වැඩ සටහන් කොයි ආකාරයකට සැලසුම් කෙරුණේද යන්න සොයා බැලීමේ හෝ එයට සහභාගි වීමේ බලයක් නොමැති වීම සහ ඔවුන්ගේ ඕනෑඑපාකම් ගැන හඬ නැංවීමට බොහෝ විට සුලු අවස්ථාවක් වත් ලැබෙන නොලැබෙන තරම් වීමය. එය එසේ වුවත් අවතැන් වූවන් සමග තොරතුරු විමසීම හා ඔවුන් හට උදව් ආධාර සහ ආරක්ෂාව ලබා දීම සඳහා දරන ප්‍රයත්නයන්වල සඵලතාව මත බලපාන බරපතළ අවශ්‍යතාවකි. ඇත්ත නම්, අභ්‍යන්තර අවතැන් වූවන් හැර ඔවුන්ගේ අවශ්‍යතාවන් හොඳ හැටි දන්නා සහ ඒවා දන්වා සිටීමෙහි මේ හොඳම ක්‍රමයන් හඳුනන වෙන අය නැත. මීට අමතරව අභ්‍යන්තර අවතැන් වූවන් හට

සාමාන්‍යයෙන් ඔවුන්ගේ තත්ත්වයන්වලට විසඳුම් සෙවීම වැනි දේ අනුකරණය කිරීමේ දක්ෂතාව ඇත.

අභ්‍යන්තර අවතැන් වූවන්ගේ දක්ෂතා මතම, ඔවුන් සඳහා වන වැඩසටහන් ශක්තිමත් කර ගොඩනැගීම එම වැඩ සටහන්වලට උපරිම සඵලතාවක් ලබාදෙයි.

අභ්‍යන්තර අවතැන්වීම්වලට දක්වන ජාතික එලෙසම ජාත්‍යන්තර ප්‍රතිචාරයන් වැදගත් සහ සැලකිය යුතු පරිදි දන්වා සිටීම සහ වැඩි දියුණු කර උසස් මට්ටමකට ගෙන ඒම අභ්‍යන්තර අවතැන් වූවන් සමග තොරතුරු විමසීම් තුළින් කළ හැකිය. සත්‍යයෙන්ම, ඔවුන්ගේ හිමිකම් ආරක්ෂා කිරීමත් ඔවුන්ගේ අවශ්‍යතාවන් ආමන්ත්‍රණය කිරීමත් සඳහා වැඩ සටහන් සහ ප්‍රතිපත්තීන් සැලසුම් කිරීමටත් ක්‍රියාවෙහි යෙදවීමටත් අභ්‍යන්තර අවතැන් වූවන්ගේ සහභාගිත්වය දිරිමත් කරමින් පහසු කර දීමට රාජ්‍යයන් හට වගකීමක් ඇත. කඳවුරු තුළ නායකත්වයෙහි සහ කළමනාකරණයෙහි ශක්තිමත් කාර්යභාරයක් අභ්‍යන්තර අවතැන් වූවන් අතින්ම සිදු කෙරෙන බවට වගබලා ගැනීමද මෙයට ඇතුළත්ය.

විශේෂ අවධානයක් දැක්විය යුත්තේ ඕනෑම ව්‍යුහයක් තුළ ක්‍රමානුකූලව තීරණ ගැනීම සඳහාත් අභ්‍යන්තර අවතැන් වූවන්ගේ ස්ත්‍රී පක්ෂය එම අවතැන් වූවන්ගේ තොරතුරු ලබා ගැනීමේ කාර්යභාරයට සහභාගි කර ගැනීමටත් සහතික වීමය. තමන්ගේ පවුල්වලට ප්‍රධාන අවශ්‍යතාවන්, සහ සැලකිල්ල, ප්‍රවේසම, රැකවරණය, යන දේ මූලිකවම සපයන්නන් ලෙස අවතැන් වූ ස්ත්‍රීන් තමන්ටත් තම පවුල්වලටත් ලැබිය යුතු සුභ සාධනය සහ සුරක්ෂිත භාවය ගැන සහතික වීම සඳහා අවශ්‍ය වන්නේ කුමක්ද යන්න ගැන හොඳම වැටහීමක් ඇත්තියන්ය. ස්ත්‍රීන් සහ ගැහැණු ළමයින්ගෙන් තොරතුරු ලබා ගැනීමෙන් ඔවුන් හට විශේෂිත වූ ආරක්ෂාව සහ ඔවුන් මුහුණ පා සිටින උවමනා එපාකම් වන ලිංගික අතවර, සහ අපයෝජනය ද එලෙසම ප්‍රජනන සෞඛ්‍ය ගැටලුද නොසලකා හැරීමට බොහෝ අවකාශ ඇති වීම, එම කණ්ඩායමේ පිරිමින් පමණක් ආමන්ත්‍රණය කළ හොත් සිදුවීමට ඉඩ ඇත. විශේෂිත අවතැන් වූ ස්ත්‍රීන් සහ ළමුන්ගේ කායික සුරක්ෂිතභාවය කෙරෙහි අවදානම් බලපෑමක් ඇති කිරීමේ සම්බන්ධතාවක් ඇත්තේ වතුර සහ දර එකතු කිරීම, කඳවුරුවල පහසුකම් හෝ අනෙකුත් පදිංචි ස්ථානවල සැලැස්ම සහ පසුතලය, ආහාර කූඩයෙහි අඩංගු වන දේ, සහ ආහාර බෙදා හැරීම යන කරුණු මත හෙයින් ස්ත්‍රීන්ගේ දායකත්වය ලබා ගත යුතුය.

අවතැන් වූවන් සමග තොරතුරු විමසීම්, අවතැනෙහි සෑම අදියරකම සිදු විය යුතුය. විශේෂයෙන් අවතැන් වූවන්ගේ පදිංචිය අළුත් තැනක පිහිටුවීමට පෙර, එම අවතැන් වීම බලපා ඇති අයගෙන් තොරතුරු විමසීමකට පසුව මෙම කාර්යභාරය ඉටු කළ යුතු අතර අවතැන් වූවන්ගේ, විශේෂයෙන් ස්ත්‍රීන්ගේ, සහභාගිත්වය ඇතිව සැකසීම, පිළියෙළ කිරීම සහ කළමනාකරණය මෙම කර්තව්‍යයේදී සිදුවිය යුතුය. මානව සුභ සාධන උදව් ආධාර බෙදා දීමේදී ඒ සඳහා කලින් සැලැස්ම සැකසීමට සහ සැපයුම බෙදා දීමට ස්ත්‍රියගේ දායකත්වය ලබා ගන්නා බවට ස්ථිර කර ගැනීමට විශේෂ වූ ප්‍රයත්නයක් දැරිය යුතුය. තමන්ටත් තම පවුල්වලටත් ආහාරපාන ද්‍රව්‍ය ලබාගැනීමේදී ලිංගික

බලාත්කාරකම් සහ සූරා කෑම් හෝ අපයෝජනය කිරීමේ අවදානමකට මුහුණ පාන්නට සිදුවන ස්ත්‍රීන්ගේ මෙම  භයානක තත්ත්වය ලිහිල් කිරීම ඉතා වැදගත්ය. අවතැන් වීමට කල් පවතින විසඳුම් සොයා ගැනීමේදී අවතැන් වූවන්ගේ තොරතුරු විමසීමට වඩා ප්‍රධාන කාර්යයක් වනුයේ අවතැන් වූවන් හට සිය නිදහසේ කැමැත්තෙන් නැවත පැමිණීමට ඇති අයිතියට ගරු කිරීමය. මෙයට අමතරව අභ්‍යන්තර අවතැන් වූවන්ගේ ආපසු පැමිණීම, නැවත ජනාවාස කිරීම සහ නැවත ඒකීයකරණය කිරීමේදී කළමනාකරණය සහ කලින් කරන සැකසීම් සඳහා අභ්‍යන්තර අවතැන් වූවන්ගේ සම්පූර්ණ සහභාගිත්වය ස්ථිර කර ගැනීමට විශේෂ ප්‍රයත්නයන් දැරිය යුතුය.

මීට අමතරව අභ්‍යන්තර අවතැන් වූවන්ගේ මානසික ආකල්ප සහ මතයන් ගැන ක්‍රමානුකූලව සොයා බලා හඳුනාගැනීමෙන් පසු එම මතයන් සාම ක්‍රියා මාර්ගය තුළටද අභ්‍යන්තර අවතැන් වීම්වල ඇති වන තත්ත්වයන් විසඳීමට යොදන්නා වූ අනෙකුත් ප්‍රයත්නයන් තුළටද යෙදිය යුතුය. මීට අමතරව “මාර්ගෝපදේශක ප්‍රතිපත්තීන්” යටතේ 22(ඈ) ප්‍රතිපත්තිය තුළ තහවුරු කර ඇති පරිදි දේශපාලනය තුල අභ්‍යන්තර අවතැන් වූවන්ගේ සහභාගිත්වයට ඇති අයිතිය කෙරෙහි ආරක්ෂාව දැක්වීම ජාතික වගකීමෙහි නොපැහැර හැරිය හැකි ලෙස අත්‍යවශ්‍ය කාරණයකි. නිතර නිතර සිදු වන දෙයකි අභ්‍යන්තර අවතැන් වූවන් හට ඡන්දය භාවිත කිරීමට ඇති අයිතිය ක්‍රියාවේ යෙදවීමේදී මුහුණ පාන්නට සිදුවන බාධක හේතු කොට ගෙන දේශපාලනමය සහ ආර්ථිකමය තීරණයන් ගැනීම ඔවුන්ගේ ජීවිතවලට බලපෑමක් ඇති කිරීම.

## 10 කල් පවතින විසඳුම්

අභ්‍යන්තර අවතැන්වීම සඳහා ඇති ජාතික වගකීම අභ්‍යන්තර අවතැන් වූවන්ගේ ඒ අවාසනාවන්ත තත්ත්වයට කල් පවතින විසඳුමක් ලබා ගැනීම සඳහා ඔවුන්ට අවශ්‍ය ප්‍රවේශ වීම සනාථ කර ස්ථිර කිරීමට ඉමහත් රුකුලකි. මෙයින් හැඟෙන්නේ අභ්‍යන්තර අවතැන් වූවන්ගේ හිමිකම් අනුව, නැවත පැමිණීම හෝ නැවත ජනාවාස කිරීම, පහසු කිරීමට හැකි  සෑම උත්සාහයක්ම ගැනීමයි.

සියලු අතින් බැලුව හොත් රාජ්‍යයන්ගේ යුතුකමක් වන්නේ සහ ඔවුන් බැඳී සිටින්නේ අභ්‍යන්තර අවතැන් වූවන්ගේ නැවත පැමිණීම සිය කැමැත්තෙන්ද ආරක්ෂා සහිතවද ඔවන්ගේ උදාර භාවය රැකගනිමින්ද තම සුපුරුදු වාසස්ථාන කරා පැමිණීමට ඉඩ හැරීමට හෝ ඔවුහු තමන්ගේ නැවත ජනාවාසය සඳහා රටේ වෙන පළාතක් තෝරා ගතහොත් එය ඒ ලෙස කිරීමට ඉඩ හැරීමත්, ඒ සඳහා සුදුසු තත්ත්වයන් ගොඩ නගා සුදුසු ක්‍රම උදාකර දීමටත් ය. ආරක්ෂාව සහිත ප්‍රවේසම කල් පවතින විසඳුම් සහ අවතැන් වූවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීම සඳහා අත්‍යවශ්‍යම මූලයයි. රණ්ඩු දබර හෝ අරගලයන් හේතුවෙන් සිදුවන අවතැන් වීම් සඳහා පළමු අවශ්‍යතාව වනුයේ එම භේදකාරී තත්ත්වය දුරු කිරීම හෝ එම අවතැන සිදු වීමට මුල් වූ හේතු සහගත සියලු තත්ත්වයන්හි ප්‍රධාන වෙනසක් ඇති කිරීමය. බිම බෝම්බ වැනි දේ ඉවත් කිරීමද අවශ්‍යතාවක් වෙයි.

අවතැන් වීමට හේතුන් කොයි කෙසේ වුවත්, ආරක්ෂාව සඳහා වන යාන්ත්‍රණයන්, නැවත පැමිණෙන හෝ නැවත ජනාවාස කෙරෙන පළාත්වල ක්‍රියා කරවිය යුතු වන අතර, විශේෂයෙන් මෙය නීතියේ අණ කිරීම් තුළින් සහ මානව හිමිකම් කෙරෙහි තිබිය යුතු ගරුත්වය ගැන සහතික වීමේ පියවර ගැනීම තුළින් කළ යුතුය.

මොනම තත්ත්වයන් හෝ අවස්ථාවන් යටතෙහි වුවත් අභ්‍යන්තර අවතැන් වූවන්ගේ නැවත පැමිණීම හෝ නැවත පදිංචිය ඔවුනගේ සෞඛ්‍යය, නිදහස, ප්‍රවේසම සහ ඔවුන්ගේ ජීවිත වුවත් අවදානමකට ලක්වීමේ හැකියාවක් ඇති පළාත් තුළ සිදු කිරීමට ඉඩදීම හෝ දිරිගැන්වීම හෝ බල කිරීම සිදු නොවිය යුතුය (15 (ඈ) ප්‍රතිපත්තිය). හැකි සෑම අවස්ථාවකම නැවත පැමිණෙන්නන් කැටුව අධීක්ෂකයන්ද යාම කළ යුතු වන්නේ මෙම ක්‍රියාවලියේ ඇත්ත නැත්ත සොයා බැලීමටත් මෙය සිය කැමැත්තෙන්ම සිදුවන්නේද බැලීමටත් මෙම ක්‍රියාමාර්ග ප්‍රවේසම් සහිත තත්ත්වයන් තුළ සිදුවෙනවාද යන්න බැලීමටත්ය.

තව දුරටත් අවතැන් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් අභ්‍යන්තර අවතැන් වූවන් හට අහිමි වූ ඔවුන්ගේ දේපොළ සහ බඩු බාහිරාදිය සහ අනෙකුත් හිමිකම් යළි ලබා ගැනීමට උදව් කිරීම සඳහා බල මණ්ඩලවලට වගකීමක් ඇති අතර, මෙය කළ නොහැකි අවස්ථාවලදී හානිපූරණය හෝ වන්දි ගෙවීමක් ලබා ගැනීමට හෝ වෙනත් සාධාරණ පිළියමක් කිරීමටද එලෙසම වගකීමක් ඇත. විශේෂිත වූ අභියෝග රැසක් පැන නැගීමට අවකාශ ඇත. බොහෝ අවස්ථාවල අවතැන් වූවන්ගෙන් සුලු ප්‍රමාණයක් සතුව ඉඩම් සහ දේපළවල අයිතිය පෙන්වන, විධිමත් නීත්‍යානුකූල බලයක් හෝ වෙනත් සාක්ෂ්‍යයක් ඇත. මේවා තිබුණු අවස්ථාවල වුණත් පුද්ගලික හෝ අධිකාරීන් විසින් නඩත්තු කරන ලද ඉඩම් දේපොළ වාර්තා, භේද සහ අරගල මධ්‍යයේ නැතහොත් ස්වාභාවික ආපදාවක් හේතුවෙන් ලැබූ අවතැන් වීමේ ප්‍රතිඵල වශයෙන් විනාශ වී යන්නට ඇත. මීට අමතරව දේපළ අයිතීන් සහ උරුම දායාදයන් පිළිබඳ ජාතික නීති සහ චාරිත්‍ර මගින් තම ස්වාමි පුරුෂයින් අහිමි වූ ස්ත්‍රීන්ද තම ගෙවල් කරා නැවත පැමිණෙන ස්ත්‍රීන් සහ අවසාන ප්‍රතිඵලය හෝ විපාකය ලෙස තමන් සහ තම පවුල්වල ජීවිකාව සහ නඩත්තුව කෙරෙහි ක්‍රම යළිත් සොයා ගැනීමට වෙර දරන ස්ත්‍රීන්ද අතර වෙනස, නිතරම සොයාගනු ලැබේ. රාජ්‍ය අධිකාරීන් හෝ බල මණ්ඩල මෙම ගැටලු බලාපොරොත්තුව සිට ඒවා ආමන්ත්‍රණය කිරීම ජාත්‍යන්තර මානව හිමිකම් මට්ටමෙන් සහ සාධාරණ වූත් වෙනසක් නොවෙන්නාවූත් ආකාරයට ඉටුකළ යුතුය.

අභ්‍යන්තර අවතැන් වූවන් නැවත පැමිණීමට තීරණය කළත් නැවත ජනාවාස කිරීමට තීරණය කළත් ඔවුන්ගේ ජීවිත නැවතත් ගොඩනගා ගැනීම පහසු කිරීමට අවශ්‍ය තත්ත්වයන් අභිවර්ධනය කිරීමද නැවත ඒකීයකරණයක් ඇතිකර ගැනීමට පහසුකම් සැලසීමද ජාතික අධිකාරීන් හෝ බල මණ්ඩලවලට ඇති වගකීමකි. සත්‍යයෙන්ම අභ්‍යන්තර අවතැන් වූවන්ගේ ජීවිකාවක් පිළියෙළ කර ගැනීමේ සහ තම තමන් මතම විශ්වාසය ගොඩනගා ගැනීමේ ක්‍රම දිරිමත් කිරීම සඳහා උපක්‍රම අවතැන් සිදුවූ පසු හැකි විගසින්ම හඳුන්වා දිය යුතු වන්නේ දිගු කාලීන යටත් ප්‍රදේශ ඇතිකර ගැනීම මග හැරවීම සඳහා වන අතර, ඒ වෙනුවට නැවත පැමිණීම සහ නැවත ජනාවාස කිරීම පුළුවන් වූ විගසම අවසාන වශයෙන් ඔවුන්ගේ එකට එකතු කිරීම හෝ ඒකීයකරණය පහසු

කරදිය යුතුය. අභ්‍යන්තර අවතැන් වූවන් නැවත පැමිණීම සහ නැවත ජනාවාස කිරීමේදී ඔවුනට තාවකාලික නිවහන් සඳහා ප්ලාස්ටික් තහඩුද උපකරණ සහ ධාන්‍ය වර්ග වැනි අත්‍යවශ්‍ය දේවල්ද සියල්ල සම්පූර්ණ වන සේ එකට එකතු කිරීම සඳහා අවශ්‍ය යෝජනා පෙළ ද ලබා ගැනීමේ ප්‍රවේශයට බලය තිබිය යුතුයි.

මීට අමතරව අභ්‍යන්තර අවතැන් වූවන්ගේ අවතැන් වීමේ ප්‍රතිඵල වශයෙන් ඔවුන් හට ඇති විශේෂ අවශ්‍යතාවන් සහ අවදානම් සහිත තත්ත්වයන් දිගින් දිගටම පවතින තෙක් ඔවුහු තමන් කෙරෙහි විශේෂ අවධානයක් දිරි ගැන්වීම සහ ආධාරය බලාපොරොත්තු විය හැකි ය. "අවතැන් වීම අවසාන වී ඇත" වැනි තීරණ අවතැන් වූවන්ගේ තත්ත්වය, අවශ්‍යතාවන් සහ අයිතීන් ගැන දිය යුතු සැලකීම නොදී හිතුවක්කාරව ගත නොයුතුය. අභ්‍යන්තර අවතැන් වූවන් කෙරෙහි දක්වන සහායේ ස්වභාවය ක්ෂණික සහ හදිසි මානව සුභසාධන ආධාර දීමේ සිට ක්‍රමයෙන් සංවර්ධනාත්මක උපක්‍රම බවට වෙනස් වීමට ඉඩ ඇති වන්නේ ස්වයං පෝෂණය කෙරෙහි ආධාර කරමින් අවතැන් වූවන්ගේ ආර්ථික සහ සාමාජීය ඒකීයකරණයට ඉඩ සලසමින්ය. එවැනි කාර්යයන් කළ යුතු වන්නේ අනෙකුත් ජනගහනයන්ගේ අවශ්‍යතාවන් සඳහා ආධාර කිරීමේ මුල් පියවර සමගත් නැවත පැමිණීම සහ නැවත ජනාවාස කිරීමේ පොදු කාර්ය සංවිධාන හෝ ව්‍යූහය ගොඩ නැගීමේ පුළුල් වූ රාජ්‍ය ප්‍රයත්නයන් සමග ඒකාබද්ධ වීමෙනුත් ය (උදාහරණ : පාසල්, සෞඛ්‍ය සායනයන්, සහ පාරවල් යනාදිය). විශේෂ අවධානයක් දිය යුතු වන්නේ, ප්‍රතිසංවිධානයෙහි සහ පුනරුත්ථාපනය හෝ නැතිවූ වරප්‍රසාදයන් නැවත ලබාදීමේ ව්‍යාපෘතිය තුළ සහභාගිත්වයට ස්ත්‍රී පක්ෂයෙන්ද සමාන දායකත්වයක් හා ආදායම් උපදවන ක්‍රම හා සුලු ණය මුදල් දීමේ වැඩසටහන් කෙරෙහි ඔවුන් හට සම පිවිසීමක් ලබා දීමටද ස්ථිර කරගැනීම කෙරෙහිය.

අභ්‍යන්තර අවතැන් වූවන් නැවත පැමිණීම හෝ නැවත අළුත් ස්ථානවල පදිංචි කරවීමේදී ඔවුන් කිසිදු වෙනස්කම් හෝ අඩු සැලකිලිවලට භාජන නොකිරීමට වග බලා ගැනීමේ පියවරයන් ගත යුතු අතර, ඔවුන්ටත් අධ්‍යාපනය සහ සෞඛ්‍ය ආරක්ෂාව වැනි මහජන සේවාවන් තුළට පිවිසීමේ සමාන අයිතියක් සලසමින්, ඡන්දය භාවිතයේ අයිතිය වැනි මහජන කාර්ය කටයුතු තුළ සම්පූර්ණ සහ සමාන සහභාගිත්වයක අයිතිය ක්‍රියාවේ යෙදවීමටද, ඉඩ කඩ සැලසීමට වගබලා ගත යුතුය.

කෙටියෙන් කිව හොත්, අභ්‍යන්තර අවතැන් වූවන් සඳහා කල් පවතින විසඳුම් නොසලකා හැරිය හැකි ලෙස රඳා පවතින්නේ, ඔවුන්ගේ නැවත පැමිණීම හෝ නැවත අළුත් ස්ථානයක පදිංචිය සිය සම්පූර්ණ කැමැත්තෙන් සහ ආරක්ෂා සහිතව සිදුකර ගැනීමේ මනාපය හෝ තෝරාගැනීමේ නිදහස ඔවුන් හට ඇති බවටත්, තමන්ම ගොඩනගා ගැනීමේ හැකියාවද ඔවුන්ගේ ජීවනෝපාය නැවත ලබා ගැනීමේ හැකියාවද සමාජය තුළ ඒකීයකරණයකට පිවිසීමේ හැකියාවද ඔවුන් හට ඇති බවටත් ස්ථිර කර ගැනීම මතය. මේ හා සම්බන්ධව අභ්‍යන්තර අවතැන් වූවන්ගේ නැවත පැමිණීම සහ නැවත අළුත් ස්ථානවල පදිංචි කරවීම ඇතුළත් කරන ලද අභ්‍යන්තර අවතැන් වූවන් හා සම්බන්ධ වඩා හොඳම ප්‍රතිපත්ති සහ ක්‍රියා මාර්ග විදහාපාන හැදෑරීම් සහ අභ්‍යාසයන් කෙරෙහි අවධානය යොමුකර විමසා බැලීම ඉතා වැදගත් බව සනාථ වනු ඇත.

අවසාන වශයෙන් රාජ්‍යයක් කල් පවතින විසඳුම් ලබාදීම කෙරෙහි ඇති බැඳීම වනුයේ මගහරවා ගැනීමට පුළුවන් වීමේ හැකියාවක් තිබුණා වූ තත්ත්වයන් වැනි, අවතැන් වීමට පාදක වූ රණ්ඩු දබර, අරගල, සහ භේද හෝ වෙනත් කරුණු සඳහා සඵලවත් වූ විසඳුම් ලබාදීමේ ප්‍රයත්නය භාරගැනීමට සහතිකය සහ ස්ථිරභාවයයි. මෙම අවස්ථාවන් හෝ සිදුවීම්වල විසඳුම් තුළ සත්‍ය සඵලතාව හෝ සත්‍ය කල් පැවතීම ලබා ගැනීමට නම්, පාදක හෝ මූලික හෝ ප්‍රධාන සමාජයීය, ආර්ථික සහ දේශපාලනික අසාධාරණකම් නිසා ඇති වන භේදය හා අවතැන් වීම සංකේත වන පාදක කරුණු ආමන්ත්‍රණය කිරීම ඇතුළත් විය යුතුයි. වාර්ගික සහ ජනවාර්ගික ප්‍රචණ්ඩතාවන් හේතු කොට ගෙන හටගත් අවතැන් වීමේ තත්ත්වයන්වලදී, නැවත සාමදාන කිරීමට හා දිරිමත් කිරීමට මූල්‍යමය පියවරයන්, උදාහරණයක් ලෙස, යන්ත්‍රණයන් තුළින් සත්‍ය කොමිෂන් සභාවක් සහ හානිකර ප්‍රතිඵලවලින් මිදීමේ අවස්ථාවන් ආමන්ත්‍රණය කිරීමත් විශේෂිතව ඉතාමත් වැදගත්ය.

## 11 සෑහෙන සහන, ප්‍රමාණවත් සම්පත් සහ උපක්‍රම

අභ්‍යන්තර අවතැන් වූවන් සඳහා ප්‍රතිපත්තීන් සහ වැඩ සටහන් ක්‍රියාවට නැංවීමෙන්ද ඔවුන්ට අවශ්‍ය උදව් ආධාර ලැබීමට සැලසීමද (ආහාර ආධාර, නිවහන් හෝ නිවාස, සෞඛ්‍ය සත්කාරය, අධ්‍යාපනය, ඒකීයකරණය සඳහා උපකාර වීම යනාදිය ඇතුළත්ය) එලෙසම, ඔවුන්ගේ කායික සුරක්ෂිතභාවය සඳහා නොවැළැක්විය හැකි ලෙස වැදගත් හෝ අනිවාර්ය වන මානව සහ ද්‍රව්‍යමය සම්පත් ලබාදීම ද අත්‍යවශ්‍ය බව තහවුරු හා සනාථ කිරීම. අභ්‍යන්තර අවතැන් වූ ජනතාවගේ අයිතීන් සහ හිමිකම් ආරක්ෂා කිරීමත්, ඔවුන්ගේ අවශ්‍යතාවන් ආමන්ත්‍රණය කිරීමත් සඳහා, එම නිසා උපක්‍රම කෙරෙහි හැකි තාක් දුරට රාජ්‍යයන්ගේ කැප වීම ජාතික වගකීම කෙරෙහි ඇති අවශ්‍යතාවක් වෙයි. සමහර රටවල් ප්‍රයත්න දරන්නේ, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ වැඩ සටහන් මාලාවන් සඳහා ජාතික අයවැය ලේඛනයෙහි නිශ්චිතවම අරමුදලක් එක් රැස් කර වෙන්කර ගැනීමෙන් මෙය කිරීමටය. රාජ්‍යයන් විසින් කළ හැකි තව දෙයක් නම්, තෙල් හෝ වෙනත් සම්පත්වලින් උපයන රාජ්‍ය ආදායම ඇසුරෙන් වෙන් කර තබා ගැනීමේ වාසියක් ලබා දෙන “අභ්‍යන්තර අවතැන් වූවන්ගේ අරමුදල්” ලෙස හැඳින්විය හැකි විශේෂ අරමුදලක් නිර්මාණය කිරීමය.

මෙයින් කියැවෙන්නේ රාජ්‍යයන් විසින් තනිවම සහ සම්පූර්ණයෙන් මෙම මුදල්මය පීඩනයට හෝ බරට උර දීමෙන් අභ්‍යන්තර අවතැන් වූවන් ආමන්ත්‍රණය කිරීම නොවේ, සත්‍යයෙන්ම, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ අවශ්‍යතාවන් ආමන්ත්‍රණය කිරීම සඳහා සෑහෙන තරම් ධාරිතාවක් නැති හෝ ධාරිතාවෙහි හිඟයක් ඇති රාජ්‍යයන්වලට උදව් උපකාර ලබා ගැනීමට ජාත්‍යන්තර ප්‍රජාව වෙතට යොමු විය හැකි අතර සත්‍යයෙන්ම ඔවුහු එය එසේ කළ යුතුය.

එසේ වුවත් ව්‍යාපෘති මුල පිරීම්, ප්‍රතිපත්ති සහ අයවැය වෙන් කිරීම් මගින් රාජ්‍යයක ස්ථාවරය පිළිබිඹු කළ හැකි වන අතර ජාතික ප්‍රයත්න සඳහා මූල්‍යමය සහන ලබා ගැනීමට ජාත්‍යන්තර සහාය ස්ථාපනය කර ගැනීම සඳහා අභ්‍යන්තර අවතැන් වීම් ජාතික ලෙස ප්‍රමුඛත්වය ලබා ගන්නා කරුණක් විය යුතුය.

## 12 ජාත්‍යන්තර සහ ප්‍රාදේශික සංවිධාන සමග සහයෝගිතාව

රාජ්‍යයන් හට ඔවුන්ගේ අභ්‍යන්තර අවතැන් වූ ජනතාවන් කෙරෙහි සුභසාධනය සහ සුරක්ෂිතතාව ලබා දීමට අවශ්‍ය ධාරිතාව නොමැති වූ විට, ස්වෛරීභාවයේ වගකීම ක්‍රියාවට නැංවීමක් ලෙස, ජාත්‍යන්තර උදව් උපකාර සඳහා ආරාධනා කිරීමක් හෝ එම උදව් භාරගැනීමක් කළ යුතු අතර, ප්‍රාදේශික, ජාත්‍යන්තර සංවිධාන සමගත් එකට ක්‍රියා කරමින්, අවතැන් වූවන්ගේ ආරක්ෂාව සහ උදව් ආධාර ආමන්ත්‍රණය කරමින්, ඔවුන්ගේ අවාසනාවන්ත තත්ත්වය සඳහා කල් පවතින විසඳුම් හඳුනා ගත යුතුය. එම නිසා ජාතික වගකීමෙහි තවත් ලක්ෂණයක් වන්නේ, අභ්‍යන්තර අවතැන් වූවන් වෙනුවෙන් ප්‍රයත්නයන් දැරීමේ කාර්යභාරයන්වලට සම්බන්ධ වීමට කැමැත්තෙන් සිටින ප්‍රාදේශික සහ ජාත්‍යන්තර සංවිධාන සඳහා අවහිර නොකරන ලද හෝ බාධා නොකරන ලද ආරක්ෂා සහිත ප්‍රවේශ වීමකට ඉඩ හරිමින්, ඔවුන් සමග සහයෝගිතාවෙන් ක්‍රියා කිරීමය.

සැබවින්ම "මාර්ගෝපදේශක ප්‍රතිපත්තීන්" අවධාරණය කර සිටින්නේ, ජාතික අධිකාරීන් "වේගවත් සහ අවහිර නොකරන ලද ප්‍රවේශය" ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධානවලට ලබා දීමෙන්, අභ්‍යන්තර අවතැන් වූ ජනතාවන් වෙතට මෙම සංවිධාන එළඹීමෙන් ඔවුනට අවශ්‍ය උදව් උපකාර ලබාදීමය. ජාත්‍යන්තර නීතිය යටතේ මෙම සංවිධාන තිබෙන හෙයින්, ඔවුන්ගේ සේවයන් ලබා දීමට ඉදිරිපත් වීමේ අයිතිය ඔවුන් සතුව ඇති අතර, එවැනි ඉදිරිපත් වීම්, අහිතවත් සතුරු ක්‍රියාවන් ලෙසවත් රටක අභ්‍යන්තර කටයුතුවලට ඇඟිලි ගැසීමක් ලෙසවත් සැලකිය යුතු නැත. අභ්‍යන්තර අවතැන් වූවන් නැවත පැමිණීම හෝ නැවත අළුත් තැන්වල පදිංචි කරවීම ඒකීය කරණය කරවීමත් සඳහා උදව් උපකාර කිරීමට ජාත්‍යන්තර මානව හිමිකම් ආයතනයන් සඳහා ඇති ප්‍රවේශය, ඔවුන් විසින් භුක්ති විඳිය යුතුය.

ජාත්‍යන්තර උදව් උපකාර සහ ආධාර භාර ගැනීමේදී, ආධාර රැගෙන එන මානව හිමිකම් කාර්ය මණ්ඩලයට සුරක්ෂිතතාව සහ ආරක්ෂාව සලසා දිය යුතු වන්නේය. මානව හිමිකම් ආධාර කිරීම් හෝ උදව් කිරීම් කාර්යයන්වල යෙදී සිටින අයද ඔවුන්ගේ ප්‍රවාහනයන් සහ සැපයුම්ද, ආරක්ෂා කිරීමත් ඒ කෙරෙහි ගරුත්වයක් තිබීමත් අවශ්‍යය. සේවක මණ්ඩල මත පැමිණෙන ප්‍රහාරයන් වළක්වාලීමටත්, අනතුරට භාජන වීමේ අවදානමක් ඇති මෙම සේවක මඬුල්ලට උදව් පදව් කිරීම සඳහාත් රාජ්‍යයන් විසින් සුරක්ෂිතතාව තහවුරු කිරීමේ පියවර ගත යුතුව ඇති අතර, මෙවැනි සේවක මණ්ඩලවලට විරුද්ධව නැගී එන ප්‍රචණ්ඩ ක්‍රියා සිදුකරන අයට විරුද්ධව නඩු පැවරීමත් කළ යුතු වේ. මෙම වගකීමේ රාජකාරිය ඉෂ්ට කිරීමේ හැකියාවන් නොමැති රාජ්‍යයන් ජාත්‍යන්තර ප්‍රජාවන් සමග එකතු වීමෙන් මානව හිමිකම් සේවක මණ්ඩලය සඳහා ස්ථිර ආරක්ෂාවක් සනාථ කරන විකල්ප පියවර ඇතුළත් සුදුසු පිළිවෙළක් යොදා ගත යුතුය.

අභ්‍යන්තර අවතැන් වූ අයගේ මානව හිමිකම් මත, එක්සත් ජාතීන්ගේ මහා ලේකම්තුමාගේ නියෝජිතවරයාට නිල පිරික්සුමකට ආරාධනා කිරීම, අභ්‍යන්තර අවතැන් වීම ඇති රටවල්වල රාජ්‍යයන් හට ජාත්‍යන්තර ප්‍රජාවන් සමග සහයෝගයෙන් වැඩ කිරීම ප්‍රදර්ශනය කර දැක්වීම සඳහා තවත් වැදගත් මාර්ගයක් වනු ඇත. මෙවැනි ආරාධනා මත සිදුවන පිරික්සුම් චාරිකා

තුළින් රාජ්‍යයන් සමග කතා බහ කිරීමත්, සංවාදවල යෙදීමත්, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ තත්වයන් සෘජුවම හෝ කෙළින්ම මුල් තැනින්ම තක්සේරු කරගැනීමත්, සෘජුවම ඔවුන්ගේ ඕනෑඑපාකම් සහ ප්‍රශ්න අසා ගැනීමටත් ඔවුන් හට හැකි වනු ඇත. සාමාන්‍යයෙන්, මෙම බැහැ දැකීම් හෝ චාරිකා, රට තුළ ඇති අභ්‍යන්තර අවතැන් වීමේ ප්‍රශ්නය කෙරෙහි ජාතික අවධානය ඉහළ නැංවීම සඳහා උපයෝගි වන සේම, අවතැන් වූවන් වෙනුවෙන් ඇති ප්‍රතිපත්තීන් සහ වැඩ සටහන් ප්‍රබෝධමත් කරමින්, ජාත්‍යන්තර ප්‍රජාවන් සහ රාජ්‍යයන් අතර ඇති වැඩ කිරීමේ සංයෝගය ශක්තිමත් කරනු ඇත.

හවුල්කාරයින් ලෙස පැවතිය යුතු ප්‍රාදේශික සහ ජාත්‍යන්තර සංවිධාන, අභ්‍යන්තර අවතැන සඳහා වන ජාතික වගකීම භාවිතය සඳහා යෙදවීම ශක්තිමත් කරමින් උදව් කර දිරිගැන්වීමෙන්, ජාතික ප්‍රයත්නයන් සඳහා ඉතා වටිනා සහ වැදගත් පෝෂණයක්, නඩත්තු සහ ආධාර කිරීමක් කීප විධියකට ලබාදිය හැකි ය. එනම්:

- අභ්‍යන්තර අවතැන් වීම් පිළිබඳ ඇති ප්‍රතිපත්තීන් සහ ජාතික නීති ගොඩ නැගීම, ඉඩම් කඩම් සහ දේපළ හිමිකරුවන්ට නැවත ලබාදීම සහ ඒවාට වන්දි ගෙවීම වැනි ගැටලුමය තත්ත්වයන් ලියාපදිංචි කිරීම හෝ ලේඛනගත කිරීම, දත්ත එක් රැස් කිරීම් වැනි ගැටලුමය අවස්ථාවන් සඳහා කාර්මික සහ ප්‍රායෝගික සහයෝගය ලබාදීම,
- අභ්‍යන්තර අවතැන් වීම් පිළිබඳ මාර්ගෝපදේශක ප්‍රතිපත්තීන් සහ අනෙකුත් ප්‍රශ්න හෝ ගැටලුමය තත්ත්වයන් ගැන පුහුණු කිරීම සඳහා කැමැත්ත පළ කර ඉදිරිපත් වීම,
- අභ්‍යන්තර අවතැන් වීමෙහි තත්ත්වයන් තක්සේරු කිරීමට ක්ෂේත්‍රය හෝ අංශය බැහැ දැකීමට භාර ගෙන, ජාතික ප්‍රාදේශික සහ ජාත්‍යන්තර ප්‍රතිචාරයන් වැඩි දියුණු කිරීමෙන් උසස් මට්ටමකට ගෙන ඒමට නිර්දේශ ඉදිරිපත් කිරීම සහ ජාත්‍යන්තර සහ ප්‍රාදේශික මානව හිමිකම් යාන්ත්‍රණයක් විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ක්‍රියාවෙහි යෙදවීම හා ඉටු කිරීම ගැන වාර්තා කිරීම,
- හිතුවක්කාර අවතැන්වීම් සම්බන්ධ වූ මුල් කාලීන අනතුරු ඇඟවීම් ඒ අදාළ බලධාරීන්ගේ අවධානයට යොමු කර, මෙම තර්ජන හෝ අනතුරු ඇඟවීම්වලට සඵලවත් ප්‍රතිචාරයන් ලබා ගැනීම සඳහා මැදිහත් වී පක්ෂව කතා කිරීමෙන් ජාතික ආරක්ෂාව කෙරෙහි ප්‍රතිචාරය දිරිමත් කිරීමට හැකි උදව් පිළිගැන්වීම,
- අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කායික සුරක්ෂිතභාවය අවදානමකට ලක් වී ඇති පළාත් සහ සැලකිලිමත් විය යුතු සහ වැදගත් ආරක්ෂක ගැටලු ගැන වාර්තා ලැබී ඇති පළාත්ද අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කඳවුරු ඇති පළාත්ද ඇතුළු සියලු පළාත් තුළ අධීක්ෂණාත්මක පෙනී සිටීමක් හෝ නියෝජනයක් ගොඩ නගා ගෙන, මෙම තර්ජනවලට විරුද්ධව අභ්‍යන්තර අවතැන් වූවන් ආරක්ෂා කිරීමට උපාය උප්‍රකම ගොඩ නගා ලිංගික අතවර හෝ ප්‍රචණ්ඩත්වයන් සහ අපයෝජනවල භයානක සහ අවදානම් තත්ත්වයන්ට විශේෂ අවධානයක් යොදමින් ළමුන් යුද හමුදාවට බඳවා ගැනීම් වැනි තත්ත්වයන්ටද විශේෂ අවධානයක් සහ සැලකිල්ලක් යෙදවීම, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ නැවත පැමිණීම සහ නැවත අළුත් ස්ථානවල පදිංචි

කරවීම් අධීක්ෂණය කිරීමෙන්, හැකි අවස්ථාවල අභ්‍යන්තර අවතැන් වූවන් කැටුව හෝ එක්ව යමින් මෙම ක්‍රියාවලිය සිය කැමැත්තෙන් හෝ ස්වේච්ඡාවෙන් ප්‍රවේසම් සහ ආරක්ෂා සහිත තත්ත්වයන් තුළ සිදු වන්නේදැයි පැහැදිලිව බලා ගැනීමට අභ්‍යන්තර අවතැන් වූවන් මෙසේ නැවත පැමිණීමේ සහ නැවත අළුත් ස්ථානවල පදිංචි වීමේ ක්‍රියාවලිය ගැන ආරක්ෂා සහ ප්‍රවේසම් ඔවුන් කෙරෙහි අත්දැයි අධීක්ෂණය කිරීම.

- අභ්‍යන්තර අවතැන් වූ ස්ත්‍රීන්ගේ සමාගම් හෝ සංගම් ඇතුළු සියලුම අභ්‍යන්තර අවතැන් වූවන්ගේ මෙවැනි සමාගම් සැකසීම සහ දියත් කිරීම, අභ්‍යන්තර අවතැන් වූවන් හට තම උවමනාඑපාකම් තමන්ම ආමන්ත්‍රණය කිරීමේ ප්‍රශ්නයන් කෙරෙහිත් රැකුලක් හෝ පිටුවහලක් වී, ඒ සඳහා අනුබල දීමෙන් ඔවුන්ගේ හිමිකම් සඳහා පාක්ෂිකව කතා කිරීම.
- රාජ්‍යයන් සහ අභ්‍යන්තර අවතැන් වූවන්ද, රාජ්‍ය නොවන සංවිධානද, අතරේ කතාබහ සංවාද සඳහා පහසුකම් සැලසීම.
- රාජ්‍ය පාලන බලයෙන් පිටත පිහිටි පළාත්වල සිටින අභ්‍යන්තර අවතැන් වූවන් හට උදව් ආධාර කරමින්, ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ "මාර්ගෝපදේශක ප්‍රතිපත්ති" යටතේ රජයේ නොවන ක්‍රියා කරන්නවුන්ගේ වගකීම් ශක්තිමත් කර බලවත් කර, අවතැන් වූවන් ආරක්ෂා කරමින් උදව් ආධාර කිරීම, හැකි විට සහ අවස්ථාවලදී රජය සහ රජයේ නොවන ක්‍රියාකරන්නවුන් අතර ඇති කර ගන්නා ගනුදෙනු පහසු කර දීමෙන්, මානව හිමිකම් සඳහා අවකාශයත් අරගල සහ භේදවලට අවසානයකුත් ඇති කිරීම,
- අභ්‍යන්තර අවතැන්වීම් සඳහා ජාතික වගකීම සඵලවත් ලෙස ඉෂ්ට කිරීම හෝ විසර්ජනය කිරීමට, ප්‍රායෝගිකව සහ සහයෝගයෙනුත් සම්පත් හෝ උපක්‍රම සංවිධානය කර රැස් කිරීමෙන් හා අරමුදල් පරිපාලනය කිරීමෙනුත් දරන උත්සාහයන් සහ ප්‍රයත්නයන් පැහැදිලිව ප්‍රදර්ශනය කරන රාජ්‍යයන්වලට දිරිය සහ ආධාර කිරීම,

සමස්ත වශයෙන් සහ විශේෂයෙන්ම ජාතික ධාරිතාව අඩු වූ හෝ හිඟ වූ විට ප්‍රාදේශික සහ ජාත්‍යන්තර සංවිධාන සමග සහයෝගයෙන් අභ්‍යන්තර අවතැන් වීම යන ප්‍රශ්නය ආමන්ත්‍රණය කිරීම ජාතික වගකීමේ එක් ස්වරූපයකි.

අභ්‍යන්තර අවතැන් වූ ජනතාවන්ගේ ආරක්ෂාව සහ සුභසාධනය සනාථ කිරීම හෝ ස්ථිර කර ගැනීමට ඇති වගකීම ලබා දීමට රජය කැමැත්තෙන් සහ එකඟ වීමෙන් සිටියත් එසේ කිරීමේ හැකියාව නොමැති විට ජාතික ධාරිතාව ශක්තිමත් කරගැනීමට උදව් කිරීම සඳහා දරන ජාත්‍යන්තර සහ ප්‍රාදේශික ප්‍රයත්නයන් බහුතර හෝ සමූහ අවතැන් වීම් සමග කටයුතු කිරීම තුළ විශේෂ වූ සඵලතාවක් පෙන්වයි. ගැටලුව හා ප්‍රශ්නය ආමන්ත්‍රණය කිරීම සඳහා ජාතික මට්ටමේදී දේශපාලනමය කැමැත්ත හෝ එකඟත්වය හෝ සහයෝගය ප්‍රමාණවත් නොවන තත්ත්වයත් තුළ ජාතික වගකීම ශක්තිමත් කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රජාව යෙදවීම ඒ හා සමාන හෝ එයටත් වැඩියෙන් වැදගත් වනු ඇත. එවැනි අවස්ථාවල වුවද කෙසේ හෝ උත්සාහය සහ ඉලක්කය විය යුත්තේ, මෙවැනි ආදේශ කිරීමක් නොව අභ්‍යන්තර අවතැන් වූවන් සඳහා ආරක්ෂාවක් උදව් ආධාර කිරීමක් සඳහා ජාතික ප්‍රයත්නයන් ශක්තිමත් කිරීමය.

# අවසානය

අභ්‍යන්තර අවතැන් වීම යන එම ලෝක ව්‍යාප්ත සහ සමස්ත අර්බුදය ඉදිරිපත් කර සිටින අභියෝගය වනුයේ ගැටලුවේ විශාලත්වය සහ සංකීර්ණතාව හේතු කොට ගෙන එය ආමන්ත්‍රණය කිරීම සමහර විට නොතකා සිටිය නොහැකි තරම් බලවත් සේ පෙනී යාමය. එහෙත් ආරම්භක ස්ථානය පැහැදිලිය. අභ්‍යන්තර අවතැන් වූ අය ආරක්ෂා කිරීම සහ ඔවුනට උදව් ආධාර කිරීම යන වගකීම ප්‍රමුඛව ප්‍රධානව සහ වැදගත් ලෙසම රඳා පවත්නේ ඔවුන්ගේ රාජ්‍යයන් මතය. අභ්‍යන්තර අවතැන් වූවන්ගේ අයිතීන් සහ හිමිකම්ද, එලෙසම දැන් ඉතා හොඳින් දන්නා වූ ඔවුන් කෙරෙහි වන ජාතික සහ අනෙකුත් අධිකාරීන් සතු වගකීම්ද අභ්‍යන්තර අවතැන සඳහා ඇති "මාර්ගෝපදේශක ප්‍රතිපත්තීන් තුළ පැහැදිලි කරන ලදුව, අභ්‍යන්තර අවතැන් වීමෙහි තත්ත්වයන් ආමන්ත්‍රණය කිරීම සඳහා ජාත්‍යන්තරව පිළිගන්නා ලද මට්ටමකට සහ ප්‍රමිතියකට පත්වී ඇත. මෙම අයිතීන් සහ හිමිකම්ද වගකීම්ද සඵලවත් ලෙස ඉටු කරන ලද්දේද යන්න සනාථ කර ගැනීමට රාජ්‍යයන් ගත හැකි නිශ්චිත පියවරයන්, කෙසේ වූවත් වඩා අපැහැදිලි නැත.

මෙම හිඩැස හෝ අඩුව පිරවීම කෙරෙහි ජාතික වගකීම සඳහා සැකසුම, රාජ්‍යයන් විසින් ගත හැකි මූල්‍යමය පියවරයන් දොළොසක් (12) හඳුන්වා දී ඇත්තේ, අභ්‍යන්තර අවතැන් වීම් ආමන්ත්‍රණය කිරීම සඳහා තමන් සතු වගකීම් විස්තරාත්මකව පැහැදිලි කර සඵලවත් ප්‍රතිඵල සහිතව ඉෂ්ට කරවීමටය. තනි තනිවම ගත හොත් මේ එක් එක් පියවරයන්, අභ්‍යන්තර අවතැන් වූවන් හට යහපතක්, උපකාරයක් සහ ප්‍රයෝජනයක් ගෙන දෙන්නේ ජාතික ප්‍රයත්නයන් වැඩි දියුණු කරමින් වර්ධනය කර උසස් මට්ටමකට ගෙන ඒමෙන්ය. මෙම පියවරයන් එකට එකතු කළ විට අභ්‍යන්තර අවතැන් වීම යන ගැටලුව සඳහා දක්වන සම්පූර්ණ සහ පරිපූර්ණ ප්‍රතිචාරයේ හර කොටස වන අතර වඩා නිශ්චිතව මෙය ලොව වටා වෙසෙන මිලියන සංඛ්‍යාත අභ්‍යන්තර අවතැන් වූවන්ගේ අවාසනාවන්ත තත්ත්වයන්වල අවශ්‍යතාවන් වන ආරක්ෂාවත් උදව් ආධාරයත් ලබා ගැනීම සඳහා තම රාජ්‍යයන් මත ඔවුන් රඳවන විශ්වාසයට ප්‍රතිචාරයක් වෙයි.

# අවසාන නිරීක්ෂණ - (සටහන)

1. එක්සත් ජාතීන්ගේ මහා සභා රැස්වීම්, විභේදනය, 2004, 58/177, 7 වන ඡේදය, සහ මානව හිමිකම් මත එක්සත් ජාතීන්ගේ කොමිසම, විභේදනය, 2004/55, 6 වන ඡේදය

2. වෝල්ටර් කාලින්, අභ්‍යන්තර අවතැන් වීම පිළිබඳ මාර්ගෝපදේශක ප්‍රතිපත්ති, විවරණය, අන්තර්ජාතික සමාගම්වල නීත්‍යනුකූල ප්‍රතිපත්ති අධ්‍යයනය, නො. 32 (ජාත්‍යන්තර නීතියෙහි ඇමරිකානු සමාජය සහ අභ්‍යන්තර අවතැන මත බෲකිංස් ආයතන ව්‍යාපෘතිය, 2000 ), අභ්‍යන්තර අවතැන් වීම පිළිබඳ මාර්ගෝපදේශක ප්‍රතිපත්ති යෙදවීම සඳහා අත්පොත (බෲකිංස් ආයතනය සහ මානව හිතවාදී කටයුතුවල සම්බන්ධීකරණය සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලය, 1999).

3. එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජයීය කවුන්සිලය (ECOSOC), විභේදනය 2004 ජූලි 23, 2004/05, 39 වන රේදය සහ (ECOSOC), විභේදනය 2003 ජූලි 15, 2003/05, 9 වන ඡේදය.

4. තව දුරටත් එක්සත් ජාතීන්ගේ හදිසි සහන සම්බන්ධීකරණය කරන්නාගෙන් සහ මානව හිතවාදී කටයුතු පිළිබඳ යටත් මහ ලේකම් විසින් කරන ලද ඉල්ලීමක් වන අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයෙක් තව දුරටත් එසේ අවතැන් වූවකු ලෙස සැලකීමට අවශ්‍ය නොවන කාල සීමාව ගැන දැනුවත් කිරීම සඳහා බර්න්හි බෲකිංස් ආයතනයේ අභ්‍යන්තර අවතැන පිළිබඳව ක්‍රියා කරන ව්‍යාපෘතිය සමග, ජෝර්ජ්ටවුන් විශ්වවිද්‍යාලයේ, ජාත්‍යන්තර සංක්‍රමණය (රට හැර යෑම) අධ්‍යයනය සඳහා ඇති ආයතනයත් නෝර්වීරියානු සරණාගත කවුන්සිලයේ ගෝලීය අභ්‍යන්තර අවතැන් වූවන්ගේ ව්‍යාපෘතියේත් සහයෝගිත්වයෙන් අභ්‍යන්තර අවතැන් වූවන් සඳහා දීර්ඝ කාලීන විසඳුම් පිළිබඳ ප්‍රමිතීන් ගොඩනගමින් පවතී. මෙම සකස් කරන ලද ප්‍රමිතීන්, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ ලේකම්වරයාගේ නියෝජිතවරයා විසින් 2005 දී, එක්සත් ජාතීන් හට ඉදිරිපත් කෙරෙනු ඇත. එරින් මූනී බලන්න, "අභ්‍යන්තර අවතැන් වූවන් සඳහා අවසානය සහනය කරා ගෙන ඒම", බලාත්කාර සංක්‍රමණ සමාලෝචනය, සඟරාව 2003 මැයි 17, ඡේද 4-6 දක්වා.

5. පුහුණු කිරීමේ අධ්‍යයන කොටස් www.idpproject.org

6. ප්‍රතිපත්ති ගොඩනගන්නන් සහ ක්‍රියාවේ යොදවන්නන් සඳහා සංක්‍රමණ පරිපාලනයේ අත්‍යවශ්‍ය කරුණු: පාඨමාලා අත්පොත (සංක්‍රමණය සඳහා සංවිධානය, 2004). මෙම අධ්‍යයන කොටසේ අඩංගු තොරතුරු එරින් මූනි මගින් දළ සටහන් ගත කරන ලදුව, මේ ප්‍රකාශනය තුළ ප්‍රතිසාධනය කර සකස් කරන ලදුව "ජාතික වගකීම සඳහා සැකිල්ල" ලෙස ඉදිරිපත් කෙරේ.

7. පොදු රාජ්‍ය මණ්ඩලයේ මහ ලේකම් කාර්යාලය, මානව හිමිකම් ඒකකය, "පොදු රාජ්‍ය මණ්ඩලය තුළ අභ්‍යන්තර අවතැන් වීම පිළිබඳ ප්‍රවීණ කණ්ඩායම් රැස්වීමේ වාර්තාව: පොදු තේමාවන් සහ ක්‍රියා මාර්ග මෙහෙයුම් නිර්ණායකය, 2003 මැයි 19 -21 (ජූනි 2004).

8. "අභ්‍යන්තර අවතැන් වූවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ, හිටපු මහ ලේකම් වරයාගේ වාර්තාව ෆ්‍රැන්සිස් ඇම් ඩෙං විසින් ඇමරිකාව තුළ අභ්‍යන්තර අවතැන මත ප්‍රාදේශික සම්මන්ත්‍රණ," මෙක්සිකෝ නගරය, 2004 පෙබරවාරි 18-20, UN doc. 4/2005/124 (2004 දෙසැම්බර් 07).

9. රොබර්ටා කොහෙන්, වොල්ටර් කාලින් සහ එරින් මූනි (eds) බලන්න. "අභ්‍යන්තර අවතැන් වීම පිළිබඳ මාර්ගෝපදේශක ප්‍රතිපත්ති සහ දකුණු කොකේසස්හි නීති," අන්තර් ජාතික සමාගම්වල නීතිමය ප්‍රතිපත්ති අධ්‍යයනය, නො. 34 (ජාත්‍යන්තර නීතිය පිළිබඳ ඇමරිකානු සමාජය සහ අභ්‍යන්තර අවතැන මත බෲකිංස් ආයතන ව්‍යාපෘතිය, 2003).

10. ආර්ථික සහ සමාජයීය කවුන්සිලය (ECOSOC) විභේදනය 2004 ජූලි 23 වන දිනයේ 2004/05, 39 වන ඡේදය.

11. උදාහරණයක් ලෙස, බලන්න,

    IGAD ප්‍රදේශය තුළ අභ්‍යන්තර අවතැන් වූවන් පිළිබඳ අමාත්‍ය සම්මන්ත්‍රණයේ "කාර්ටොවුම්" ප්‍රසිද්ධ ප්‍රකාශනය, 2003 සැප්තැම්බර් 02 දා, තෝරා ගෙන පිළිගන්නා ලද "IGAD උප ප්‍රදේශයේ, අභ්‍යන්තර අවතැන් වීම පිළිබඳ සම්මන්ත්‍රණය" යන්නෙහි උපග්‍රන්ථය "සුඩානයේ කාර්ටොවුම්හි ප්‍රවීණයන්ගේ රැස්වීමේ වාර්තාව, 2003 අගෝස්තු 30 සිට සැප්තැම්බර් 02" (අභ්‍යන්තර අවතැන පිළිබඳ ව්‍යාපෘතිය, 2003 බෲකිංස් ආයතනය - බටහිර අප්‍රිකානු ප්‍රාන්ත රාජ්‍යයන්වල (ECOWAS), ආර්ථික ප්‍රජාවෙහි සාමාජික ප්‍රාන්ත රාජ්‍යයන්, මේ ලෙසම, "මාර්ගෝපදේශක ප්‍රතිපත්තීන්" සැකසුමක් ලෙස භාවිත කරමින් අභ්‍යන්තර අවතැන් වීම් මත, ජාතික නීතිවල සංවර්ධනය යෝග්‍ය සහ සුදුසු යැයි යෝජනා කර සිටින අතර බටහිර අප්‍රිකානු ප්‍රාන්ත රාජ්‍යයන්වල ආර්ථික ප්‍රජාවෙහි සාමාජික රාජ්‍යයන් (ECOWAS) සංවර්ධනය කරන නීති සම්පාදනයේ ආදර්ශ ආකෘතියේ දළ සටහන මගින් ප්‍රයෝජනවත් උපදේශකත්වයක් ලබාදිය හැකි බවද ඉඟි කර ඇත. "අභ්‍යන්තර අවතැන් වූවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ ලේකම් නියෝජිතවරයාගේ වාර්තාව" බලන්න. UN doc. E/CN 4/2003/86, 32 වන ඡේදය.

12. එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජයීය මණ්ඩලය, විභේදනය

2004/05 39 වන ඡේදය ද, එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජයීය මණ්ඩලය, විභේදනය 2003 ජුලි 15 වන දිනයේ 2003/05, 9 වන ඡේදය ද බලන්න.

13. මානව හිමිකම් පිළිබඳ, එක්සත් ජාතීන්ගේ කොමිසම, විභේදනය 2004/55

(2004 අප්‍රේල් 20), 18 සහ 21 වන ඡේදයන් සහ විභේදනය 2003/51 (2003 අප්‍රේල් 23), 18 සහ 21 වන ඡේදයන්.

14. උදාහරණ ලෙස බලන්න, මාරියේ ගෝමස්, "අභ්‍යන්තර අවතැන් වූවන් සහ ජාතික මානව හිමිකම් ආයතනයන්: ශ්‍රී ලංකාවේ අත්දැකීම් මගින් නිදර්ශනය කිරීම" (බෲකිංස් ආයතනය - SAIS අභ්‍යන්තර අවතැන පිළිබඳ ව්‍යාපෘතිය, 2002 ජුලි මස).

15. බ්‍රිජට් රෙෆ්ස්ලුන්ඩ් සොරෙන්සෙන් සහ මාර්ක් වින්සන්ට්, "දේශසීමා මායිම් ඇතුළත හසුවන ලද : අභ්‍යන්තර අවතැන් වූවන්ගේ උපක්‍රම අනුගමනය"

(නොර්වීජියානු සරණාගත මන්ත්‍රණ සභාව, 2001).

16. "අභ්‍යන්තර අවතැන් වීම් පිළිබඳ මාර්ගෝපදේශක ප්‍රතිපත්තීන්," 07(03) (ඈ), 18 (03), සහ 28 යන ප්‍රතිපත්තීන්.

17. "අභ්‍යන්තර අවතැන් වූවන්ගේ ඡන්ද අයිතීන්: OSCE ප්‍රදේශය (බෲකිංස් ආයතනය - SAIS අභ්‍යන්තර අවතැන පිළිබඳ ව්‍යාපෘතිය, 2004 නොවැම්බර් මස.

18. උදාහරණයක් ලෙස බලන්න, "නැවත පැමිණීම, අලුතෙන් නැවත පදිංචි කරවීම සහ පුනරුත්ථාපනය කිරීම සඳහා ව්‍යාපෘතියේ නියැළෙන්නාගේ අංගෝපාංග කට්ටලය" (මානුෂීය සේවායතන සමූහය - කොළඹ සහ බෲකිංස් - අභ්‍යන්තර අවතැන් වීම් මත ව්‍යාපෘතිය, 2004), සහ "අභ්‍යන්තර අවතැන පිළිබඳ ක්ෂේත්‍රීය වෘත්තීය නියැලීමෙහි පාඨමාලා අත්පොත එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතනවලින් නිදසුන් සහ අභ්‍යන්තර අවතැන් වූවන් පිළිබඳ සහාය වීම් කටයුතුවල මුල් පියවරයන්," මානව හිතවාදී කටයුතුවල සම්බන්ධීකරණය සඳහා එක්සත් ජාතීන්ගේ කාර්යාලය (OCHA) අන්තර් නියෝජිත ස්ථාවර කමිටුව කාර්යමය කණ්ඩායම් ප්‍රතිපත්ති පත්‍ර නො. 1 ශ්‍රේණිය (OCHA), 1999.

19. "මාර්ගෝපදේශක ප්‍රතිපත්ති," 25 සහ 29 (2) යන ප්‍රතිපත්තීන්

# උපග්‍රන්ථය : අභ්‍යන්තර අවතැන පිළිබඳ මාර්ගෝපදේශක ප්‍රතිපත්ති

## හැඳින්වීම - විෂය පථය හා අභිප්‍රායන්

1. ලෝ පුරා අභ්‍යන්තර අවතැන් වූ අයගේ නිශ්චිත අවශ්‍යතාවන් "මාර්ගෝපදේශක ප්‍රතිපත්ති" මගින් ආමන්ත්‍රණය කෙරේ. බලපෑම් මත සිදුවන අවතැන්වීම්වලින් පුද්ගලයින් ආරක්ෂා කිරීමටත්, එම අවතැන්වීම් වූ කාලය තුළ සහ ඔවුන්ගේ නැවත පැමිණීමේ සහ නැවත අළුත් ස්ථානවල පදිංචි කරවීමේ සහ ඒකීයකරණයේ කාලයන් තුළත් ඔවුන්ගේ ආරක්ෂාව සහ උදව් ආධාරවලට අදාළ වන හිමිකම් සහ සහතික වීම් මෙම "මාර්ගෝපදේශක ප්‍රතිපත්තීන්" විසින් හඳුනා ගෙන ඇත.

2. මෙම ප්‍රතිපත්ති සඳහා අරමුණු හෝ අභිප්‍රායන් වන්නේ, තම පුරුදු වාසස්ථාන හෝ නිවෙස් අත්හැර දමා යෑම හෝ අත් හැර දමා පලා යෑමට බලාත්කාරකම් හෝ බලපෑම් කරනු ලැබූ පුද්ගලයින් හෝ පුද්ගලයින්ගේ කණ්ඩායම්ද, විශේෂිතවම සන්නාහ සන්නද්ධ ගැටුම් හෝ ආරාවුල් හේතු කොට ගෙන හෝ එම විරුද්ධවාදීකම්වල ප්‍රතිඵල මග හැරීමට සහ පොදු ප්‍රචණ්ඩත්වයන් හෝ ව්‍යාප්තව ඇති ප්‍රචණ්ඩත්වයන් සහිත තත්ත්වයන්, මානව හිමිකම් උල්ලංඝනය වීම්, ස්වාභාවික හෝ මිනිසා විසින් ඇති කරන ලද ව්‍යසනයන් නිසා ජාත්‍යන්තරිකව පිළිගන්නා ලද රාජ්‍ය මායිමක් තරණය නොකළ පුද්ගලයින්ය.

3. මෙම ප්‍රතිපත්තීන් ජාත්‍යන්තර මානව සුභසාධන නීතිය හා ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සමග ස්ථිරව සහ අචලව ඇති අතර ඒවා තුළ පිළිබිඹු වෙයි. මේවා මග පෙන්වීමක් හෝ උපදේශකත්වයක් සලසන්නේ :

   (අ) මහ ලේකම් නියෝජිතවරයා ලත් අභ්‍යන්තර අවතැන් වූවන් පිළිබඳ කටයුතු කිරීමේ බලය ක්‍රියාවේ යොදවාගෙන යෑමට,

   (ආ) රාජ්‍යයන් අභ්‍යන්තර අවතැන් වීමේ සංසිද්ධීන්වලට මුහුණු පා සිටින විට,

   (ඇ) වෙනත් සියලුම අධිකාරීන් කණ්ඩායම් සහ පුද්ගලයින් අභ්‍යන්තර අවතැන් වූවන් සමග ඇති ඔවුන්ගේ සම්බන්ධතාවයන් තුළ සහ,

   (ඈ) අන්තර් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධානයන් අභ්‍යන්තර අවතැන ආමන්ත්‍රණය කරන විට.

4. මෙම මාර්ගෝපදේශක ප්‍රතිපත්තීන් හැකි තරමින් පුළුල්ව ව්‍යාප්ත කර යෙදවිය යුතුය.

## 1 වන කොටස - පොදු ප්‍රතිපත්ති

### 1 වන ප්‍රතිපත්තිය

1. අභ්‍යන්තර අවතැන් වූවන් ඔවුන්ගේ රටෙහි අනෙකුත් පුද්ගලයින් මෙන්ම, සම්පූර්ණ සමානත්වයකින්, ජාත්‍යන්තර සහ රටෙහි හෝ දේශීය නීති යටතේ එකම හිමිකම් සහ එකම නිදහස් තත්ත්වයන් භුක්ති විඳිනු ඇත. අභ්‍යන්තර අවතැන් වූවන්, ඔවුන්ගේ අවතැන් වීමේ හේතුවෙන්, ඔවුන් හට ඇති හිමිකම් සහ නිදහස් තත්ත්වයන් භුක්ති විඳීමේ අයිතියට විරුද්ධව, වෙන් කර දැමීම නොකළ යුතුව ඇත.

2. මෙම ප්‍රතිපත්තීන්, ජාත්‍යන්තර නීතිය යටතේ, පෞද්ගලික අපරාධ වගකීමට විශේෂයෙන්ම සමූල ඝාතනය, මිනිස් සංහතියට විරුද්ධව අපරාධ සහ යුද අපරාධ කෙරෙහි අපක්ෂපාතී විය යුතුව ඇත.

### 2 වන ප්‍රතිපත්තිය

1. මෙම ප්‍රතිපත්ති සියලුම අධිකාරීන් හෝ පාලකයින් මගින්ද, කණ්ඩායම් සහ පුද්ගලයින් මගින්ද ඔවුන්ගේ නීතිමය තත්ත්වයන් සැලකීමට නොගනිමින් අනුගමනය කර කිසිම විරුද්ධ විශිෂ්ටතාවකින් තොරව යෙදිය යුතුව ඇත. මෙම ප්‍රතිපත්තීන් අනුගමනය කිරීම, මේ සඳහා සම්බන්ධ වන කිසිම පුද්ගලයන් හෝ කණ්ඩායම් හෝ අධිකාරීන් හෝ නීතිමය කාර්ය තත්ත්ව හෝ තරාතිරම මත බල නොපානු ඇත.

2. මෙම ප්‍රතිපත්තීන් භාවිතය හෝ ක්‍රියා කරවීම, රටෙහි හෝ දේශීය නීතිය යටතේ පුද්ගලයින්ට පවරන සහ දෙනු ලබන ජාත්‍යන්තර මානව හිතවාදී සහ ජාත්‍යන්තර මානව හිමිකම් සැපයීම් හා නීතිමය ලියවිල්ල හෝ හිමිකම් සීමා කිරීමක්, වෙනස් කිරීමක්, හෝ දුබල කිරීමක් හෝ ඒවාට හානි කිරීමක් ලෙස අර්ථ දැක්වීම සිදු නොවනු ඇත.

### 3 වන ප්‍රතිපත්තිය

1. ජාතික අධිකාරීන් හට ඇත්තා වූ ප්‍රාථමික හෝ මූලික රාජකාරිමය යුතුකම හා වගකීම වන්නේ අභ්‍යන්තර අවතැන් වූවන් හට ආරක්ෂාව සහ මානව සුභවාදී උදව් ආධාර ලබාදීම ඔවුන්ගේ අධිකරණ බල සීමාව තුළදී සිදු කිරීම ය.

2. මෙම අධිකාරීන් තුළින් මානව හිතවාදී ආධාර සහ ආරක්ෂාව ඉල්ලා සිටීමත් ඒවා ලබා ගැනීමටත්, අභ්‍යන්තර අවතැන් වූවන් හට අයිතිය ඇත. මෙවැනි ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේදී පීඩා කිරීමක්, හිංසා කිරීමක් හෝ දඬුවම් කිරීමක් නොකළ යුතුව ඇත.

### 4 වන ප්‍රතිපත්තිය

1. මෙම ප්‍රතිපත්තීන් යෙදවීම සිදුකළ යුතු වන්නේ කිසිදු විවේචනයක් හෝ වෙනස්කම් කිරීමක් වැනි, ජාතිය, වර්ණය (හමේ පාට), ස්ත්‍රී පුරුෂ භාවය, භාෂාව, ආගම, හෝ වෙනත් ඇදහීම්, සහ විශ්වාසයන්, දේශපාලනමය හෝ වෙනත් මතයන්, රටවැසිකම, ජනවාර්ගික හෝ සමාජයීය ආරම්භය, නීතිමය හෝ සාමාජීය මට්ටම සහ තත්ත්වයන්, වයස, නොහැකියාව, දුබලතාව, අපොහොසත් වීම, දේපළ ඉඩම් කඩම් සහ බූදලය, උප්පැන්න සහ වෙනත් මේ හා සමාන උපමානයන්ගෙන් තොරවය.

2. සමහර අභ්‍යන්තර අවතැන් වූවන් වන ළමයින්, විශේෂයෙන්ම කාත් කවුරුත් නොමැති බාල වයස්කාර ළමයින්, ගර්භණී මව්වරුන්, බාල ළමයින් සමග මව්වරුන්, නිවෙස්වල ස්ත්‍රී නායකත්වය, නොහැකියාව හෝ විකලාංගභාවය හෝ දුබලකම ඇති පුද්ගලයින් සහ වැඩිහිටි සහ මහලු වූවෝ ඔවුන් සිටිනා තත්වයන්ගේ ඉල්ලීම් වන, ආරක්ෂාව සහ උදව් ආධාරවලටද, ඔවුන්ගේ ඒ විශේෂ අවශ්‍යතාවන් අවධානයට ලක් කරන ලදුව ඒ සඳහා නිසි සැලකීම හෝ පිළියම ලබා ගැනීමටද අයිතිය ලබති.

## 2 වන කොටස - අවතැන් වීමෙන් ආරක්ෂා කිරීම හා සම්බන්ධ ප්‍රතිපත්ති

### 5 වන ප්‍රතිපත්තිය

සියලුම තත්ත්වයන් සහ අවස්ථාවන් තුළ මානව හිමිකම් සහ මානව සුභසාධන නීතීන් ඇතුළත් ජාත්‍යන්තර නීතිය යටතේ තමන් සතු රාජකාරිය හෝ යුතුකම නැතහොත් වගකීම හෝ සේවාව කෙරෙහි, සියලුම අධිකාරීන් සහ ජාත්‍යන්තර ක්‍රියා කරන්නවුන් තම ගරුත්වය පුද කිරීමත්, එම ගරුත්වය සහතික කිරීමත්, කරනු ඇත්තේ, පුද්ගලයින්ගේ අවතැන් වීම කෙරෙහි රුකුලක් වන එම තත්ත්වයන් වළක්වාලීමටත් මග හැර වීමටත්ය.

### 6 වන ප්‍රතිපත්තිය

1. සෑම මනුෂ්‍යයෙකු හටම තම පුරුදු වාසස්ථානයෙන් හෝ ඔහුගේ හෝ ඇයගේ නිවසෙන් බලාත්කාරව නැතහොත් හිතුවක්කාර ලෙස අවතැන් වී සිටීමට විරුද්ධව අවශ්‍ය ආරක්ෂාව ලබා ගැනීමේ අයිතිය තිබෙනු ඇත.

2. හිතුවක්කාර අවතැන් වීම්වල තහනම තුළ ඇතුළත් වන අවතැන් වීම ඃ

   (අ) අවතැන් වීම් බලපෑ ජනතාවගේ වර්ණ භේදය, ජනවාර්ගික පිරිසුදු කිරීම හෝ එයට සමාන ක්‍රියාවන් වන ජනවාර්ගික, ආගමික හෝ වාර්ගික මිශ්‍රණය නැත හොත් කලවම් වීම වෙනස් කිරීමේ ප්‍රතිඵලය හෝ එම ප්‍රතිඵලය ලබා ගැනීමේ ඉලක්කය කෙරෙහි අනුගමනය කළ යුතු ක්‍රියාවන් ප්‍රතිපත්තීන් මත පදනම් වූ විට,

   (ආ) සන්නාහ සන්නද්ධ අරගලයන් තුළ සම්බන්ධ වී ඇති හෝ පටලැවී ඇති සාමාන්‍ය වැසියාගේ සුරක්ෂිත භාවය හෝ බලවත් සේ අවශ්‍ය වන පැහැර හැරිය නොහැකි යුද හමුදා හේතූන් මත මිස,

   (ඇ) විශාල පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘති අසාධාරණ ලෙස මහා ජනයාගේ අයිතීන් හා පැවතුම් පාගා දමමින් බල කිරීමෙන් සිදු කිරීම තුළ,

   (ඈ) ආපදාවන් සිදුවී ඇති තත්ත්වයන් හෝ අවස්ථාවන්හි, එය බලපෑ පුද්ගලයින්ගේ ප්‍රවේසම සහ සෞඛ්‍යය මත ඔවුන්ගේ ඉවත්ව යෑම අවශ්‍ය නම් සහ,

   (ඉ) සියල්ලන් සඳහා පොදු දඬුවමක් ලෙස එය භාවිත කරන විට.

3. අවතැන් වීම් තත්ත්වයන් සහ අවස්ථාවන්වලට අවශ්‍ය කාල සීමාවට වඩා දිගු කලක් එම අවතැන් වීම් පැවතිය නොයුතු වීම.

### 7 වන ප්‍රතිපත්තිය

1. පුද්ගලයින්ගේ අවතැන් වීම කෙරෙහි අවශ්‍ය තීරණයක් ගැනීමට පෙර අවතැන් වීම සම්පූර්ණයෙන්ම මග හරවා ගැනීම සඳහා ඒ හා සම්බන්ධව ක්‍රියා කරන අධිකාරීහු ප්‍රායෝගික විකල්පයක් සොයා බලා හෝ සෝදිසි කර බලා ඒ බව ස්ථිර කර ගනිති. කිසිම විකල්පයක් නොපවතින හො නොමැති විට අවතැන් වීමත් අවතැන් වීමෙහි අහිතකර ප්‍රතිඵලත් අවම කරගැනීමට සියලු ක්‍රම සහ විධිමත් පියවර ගත යුතු වෙයි.

2. එවැනි අවතැන් වීමක් භාරගන්නා වූ අධිකාරීන් ප්‍රායෝගිකව උපරිම දුරට, අවතැන් වූවන් හට සුදුසු සහ හරියාකාර ඉඳුම්හිටුම් සහ නවාතැන් ලබා දීමටත්, එවැනි අවතැන් වීම් සැහෙන සතුටුදායක තත්ත්වයන් වන ප්‍රවේසම, පෝෂණය, සෞඛ්‍යය සහ සනීපාරක්ෂාව ඇතිව සිදු කිරීමටත්, සහ එකම පවුලේ සාමාජිකයන් වෙන් නොකිරීමටත් සනාථ සහ ස්ථිර විය යුතුය.

3. අවතැන් වීම් සිදු වන්නේ සන්නාහ සන්නද්ධ අරගලයන් සහ බේදවාචක හෝ ව්‍යසනයන් නැතහොත් ආපදාවන් වැනි අවස්ථාවන් හැර වෙනත් අවස්ථාවන් තුළදී නම් පහත සඳහන් වගකීම ඉටු කරන බවට පොරොන්දු වීමට එකඟ විය යුතුය.

(අ) නීතිමය බලය පැවරීමකින් බලවත් කරන ලද රාජ්‍ය අධිකාරියක් මගින්, එවැනි පියවරයන් අණ කිරීම සඳහා, නිශ්චිත තීරණයන් ගනු ලබනු ඇත.

(ආ) අවතැන් කිරීමට සිටින්නා වූ පුද්ගලයින්ට ඔවුන්ගේ අවතැන් වීමට හේතුන් සහ එය කෙරෙහි අනුගමනය කරන ක්‍රියා මාර්ගයන් ඇතුළත් විස්තර සහිත සම්පූර්ණ තොරතුරු සහ යෙදිය හැකි අවස්ථා සහ ස්ථානවලදී ඔවුනට වන්දි ගෙවීමට සහ අළුත් තැනකට යාම ගැනද වගකීම ඉටු කරන බවට පොරොන්දු වීමට සෑහෙන සහ ප්‍රමාණවත් පියවර ගැනීම සිදු කෙරෙයි.

(ඇ) අවතැන් කිරීමට සිටින පුද්ගලයින්ගේ නිදහස් එකඟ වීම සහ සියලු තොරතුරු ඔවුන් දැනුවත්ව ලබා දෙන එකඟ වීමක් සොයා බලා ලබා ගනු ඇත.

(ඈ) අවතැන් වීම බලපෑ පුද්ගලයින් සඳහා තමන්ගේ අළුත් ස්ථාන පිහිටුවීම හෝ අළුත් ස්ථානවලට යෑම සම්බන්ධව සැලසුම් පිළියෙළ කිරීමටත් ඒ සම්බන්ධව ඇති පරිපාලන කටයුතුවලටත් ඔවුන්ම - විශේෂිතව ස්ත්‍රී පක්ෂය සහභාගි කරවා ගැනීමට, එයට අදාළ අධිකාරීන් දැඩි උත්සාහයක් හෝ ප්‍රයත්නයක් ගත යුතු වේ.

(ඉ) අවශ්‍ය ස්ථාන, හේතුන් සහ අවස්ථාවන්වලදී සුදුසු සහ අවශ්‍ය බලය ලත් නීත්‍යානුකූල අධිකාරීන් මගින් නීතියේ බලය ක්‍රියාත්මක කරවීම සිදු කරගෙන යා යුතුව ඇත.

(ඊ සඵලවත් පිළියමකට ඇති අයිතිය සහ එවැනි තීරණ ගැනීම ඇතුළු යෝග්‍ය සහ උචිත අපක්ෂපාතී අධිකාරීන් මගින් ගන්නා ලද එම තීරණවල සංශෝධනය ගරු කෙරෙනු ඇත.

### 8 වන ප්‍රතිපත්තිය

අවතැන් වූවන්ගේ සුරක්ෂිතභාවය, නිදහස, අභිමානය සහ ජීවිතයේ හිමිකම් සහ අයිතීන් උල්ලංඝනය වන ආකාරයට එම අවතැන කෙරීගෙන යාම නොකළ යුතු වේ.

### 9 වන ප්‍රතිපත්තිය

යම් ප්‍රදේශයකට හෝ පළාතකට පමණක් පොදු වූ ජනතාව සහ සුළුතර ජනයාද ගොවීන් හෝ කෘෂිකර්මකරුවන් හෝ ගැමියන්ද, එඬේර හෝ ගොපලුන් වැනි ජනයන් සහ තම භූමිය මත විශේෂ බලාපොරොත්තුවක් සහ බැඳීමක් ඇති වෙනත් ජන කණ්ඩායම්වල අවතැන් වීමට විරුද්ධව ආරක්ෂාව සැපයීම මත විශේෂිත වූ රාජකාරියක් සහ යුතුකම් සහිත වගකීමක් යටතේ රාජ්‍ය බැඳී සිටින්නේය.

## 3 වන කොටස - අවතැන් වීම පවතින අතරතුරේ තිබිය යුතු ආරක්ෂාවට අදාළ වන ප්‍රතිපත්තීන්

### 10 වන ප්‍රතිපත්තිය

1. සෑම මනුෂ්‍යයෙකුගේම ජීවිතය කෙරෙහි තමාට ආවේණික වූ අයිතිය නීතිය මගින් ආරක්ෂා කරනු ලැබේ. කිසිම කෙනෙකුගේ ජීවිතයක් හිතුවක්කාර හෝ පදනම් රහිත ලෙස ඔහුට හෝ ඇයට අහිමි නොකරනු ලැබේ. අභ්‍යන්තර අවතැන් වූවන් විශේෂිතවම ආරක්ෂා කරනු ලබන්නේ:

    (අ) මිනිස් සංහාරයෙන් (ජාතියක් හෝ ගෝත්‍රයක් සමූල ඝාතනයක්),

    (ආ) මිනීමැරුමෙන් හෝ ප්‍රාණඝාතයෙන්,

    (ඇ) සම්පින්ඩණ හෝ පදනම් රහිත මරණ දණ්ඩනය දීමෙන්,

    (ඈ) පැහැරගෙන යාමෙන්ද, ඒත්තු නොගත් හෝ නොපිළිගත් රඳවා ගැනීම හෝ බලයෙන් තබා ගැනීමෙන්ද, තර්ජන කිරීම්වලින් හෝ ප්‍රතිඵල මරණය වන අවස්ථාවලිනුත් යන කරුණු ඇතුළත් බල කර සිටින අතුරුදහන් වීම්වලිනුත්ය.

    ඉහත සඳහන් කිසියම් හෝ ක්‍රියාවලියක පංගු කරුවෙකු වීම හෝ එම ක්‍රියාවන් කෙරෙහි පෙලඹවීම හෝ තර්ජනය කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කෙරෙනු ඇත.

2. විරුද්ධකම් නැතහොත් එදිරිවාදිකම්වල සහභාගි නොවන හෝ තවදුරටත් සහභාගි නොවන්නා වූ අභ්‍යන්තර අවතැන් වූවන්ට විරුද්ධව, ඇති කරන ප්‍රචණ්ඩ ක්‍රියා හෝ පහර දීම නැතහොත් ප්‍රහාරයන් සියලුම තත්ත්වයන් තුළ හෝ මොනම තත්ත්වයක් යටතේ හෝ සිදුවීම් සම්පූර්ණයෙන්ම තහනම් කෙරේ. අභ්‍යන්තර අවතැන් වූවන් හට විශේෂිත වූ ආරක්ෂාවක් දෙනු ලබන්නේ:

    (අ) සාමාන්‍ය වැසියා වෙත ප්‍රහාරයක් එල්ල කිරීමෙහි නිරත වීම සඳහා පළාත් බිහිකර ගැනීම ඇතුළු සෘජු සහ වග විභාග රහිත ප්‍රහාරයන් හෝ අනෙකුත් ප්‍රචණ්ඩ ක්‍රියාවන්වලදීත්,

    (ආ) සටන් ක්‍රමයක් ලෙස හාමතේ හෝ කුස ගින්නේ තැබීමේදීත්,

    (ඇ) යුද හමුදා අරමුණ නැතහොත් අභිප්‍රාය ප්‍රහාරයන්වලින් වසා තබා ගැනීමට, ආවරණය කර තබා ගැනීමට නැතහොත් මුවා කර තබා ගැනීමට හෝ යුද හමුදා මෙහෙයුම්වලට බාධා කිරීම් සහ අවහිරතා ඇතිකිරීම් හෝ යුද හමුදා මෙහෙයුම්වලට අනුග්‍රහය දැක්වීම ආවරණය කිරීම්වලදීත් ය.

    (ඈ) අවතැන් වූවන්ගේ කඳවුරුවලට හෝ ඔවුන්ගේ ජනාවාස ස්ථානවලට විරුද්ධව ප්‍රහාරයන්වලදීත්,

    (ඉ) බිම් බෝම්බ භාවිතයේදීත්ය.

### 11 වන ප්‍රතිපත්තිය

1. සෑම මනුෂ්‍යයෙකු හටම අභිමානවත් සහ කායික, මානසික සහ සදාචාර සෘජුකමක් හෝ අවංකත්වයක් සඳහා අයිතිය ඇත.

2. අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයන්ගේ නිදහස අවහිර කරන ලදුව හෝ නොලදුව වුවත් ඔවුන් විශේෂිතව ආරක්ෂා කෙරෙන්නේ:

    (අ) ස්ත්‍රී දූෂණ, අංගයන් ඡේදනය කිරීම හෝ කපා හැරීම්, දැඩි මානසික හා කායික වධ දීම්, කෲර අමනුෂ්‍ය හෝ අවමානයට පත් කරන හෝ පහත හෙළන සැලකීම් හෝ දඬුවම් දීම්ද පුද්ගලික අභිමානය මත කෙරෙන අනෙකුත් හිංසාපීඩාද, සාහසික අපරාධද, වැනි ලිංගික නිශ්චිත ප්‍රචණ්ඩත්වය බල කරන ලද ගණිකා වෘත්තීන් සහ ඕනෑම ස්වභාවයක ඇති අශිෂ්ට අඩන්තේට්ටම් කිරීම්,

(ආ) වහල්කම් හෝ නූතන සමකාලීන වහල්කම් වන විවාහයන් සඳහා විකිණීම, ලිංගික අපයෝජනයන් හෝ ළමයින්ගෙන් බලහත්කාරයෙන් හෝ බල කිරීමෙන් වැඩ ගැනීම්, සහ

(ඇ) අභ්‍යන්තර අවතැන් වූවන් අතරට භීතිය හෝ භය පතුරුවා හැරීමේ අදහසින් හෝ උවමනාවෙන් ඇති කරන ප්‍රචණ්ඩත්වයේ ක්‍රියාවන්වලින්ද වේ.

ඉහත සඳහන් ඕනෑම ක්‍රියාවලියක් කිරීමට තර්ජනය කිරීම හෝ පෙලඹවීම සම්පූර්ණයෙන්ම තහනම් කරනු ලැබේ.

## 12 වන ප්‍රතිපත්තිය

1. අයෙකුගේ සුරක්ෂිතභාවය සහ ස්වාධීනත්වය සඳහා සෑම මනුෂ්‍යයෙකුටම අයිතිය ඇත. හිතුවක්කාර හෝ පදනම් රහිත ලෙස අත්අඩංගුවට ගැනීමට හෝ දඬුවමක් ලෙස රඳවා තබා ගැනීමට කිසිදු පුද්ගලයෙකු භාජන නොකෙරිය යුතු වේ.

2. අභ්‍යන්තර අවතැන් වූවන් සඳහා වන මෙම අයිතියට ප්‍රතිඵලයක් හෝ වටිනාකමක් දීම සහ ඔවුන් අල්ලා ගැනීමක්, හිර කිරීමක් හෝ කඳවුරක රඳවා ගැනීමක් නොකරනු ලැබේ. නමුත් විශේෂ වූ හෝ අසාමාන්‍ය අවස්ථාවන් තුළ එවැනි අල්ලා ගැනීම්, හිර කිරීම් සහ රඳවා ගැනීම්, අනිවාර්යයෙන්ම අත්‍යවශ්‍ය වනු ඇති අතර, එම රඳවා ගැනීම් එම තත්ත්වයන්ට අවශ්‍ය සහ සුදුසු කාලයට වඩා වැඩි කාලයක් නොඉක්මිය යුතුය.

3. අභ්‍යන්තර අවතැන් වූවන්, ඔවුන්ගේ ඒ අවතැන්වීමේ හේතුවෙන් හෝ එහි ප්‍රතිඵලයක් වශයෙන් අසාධාරණ සාධක මත වෙනස්කම් කිරීමකින් අත් අඩංගුවට ගැනීමෙන් ද, සහ එවැනි ලෙසම බලයෙන් රඳවා තබා ගැනීමෙන් ද, ආරක්ෂා කරනු ලැබේ.

4. අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් කොයි ආකාරයේ තත්ත්වයක වුවත් ප්‍රාණ ඇපකරුවන් ලෙස තබා ගනු නොලැබේ.

## 13 වන ප්‍රතිපත්තිය

1. අභ්‍යන්තර අවතැන් වූ ළමයින් මොනම හේතු සහගත තත්ත්වයන් යටතේ වුවත් එදිරිවාදීකම් සහ විරුද්ධවාදීකම්වලට බඳවා ගැනීම හෝ මේ සඳහා ඔවුන් අවශ්‍ය වීම හෝ එවැනි ක්‍රියාවල යෙදවීම හෝ නිරත වීම සඳහා අවසරය හෝ නොලැබෙනු ඇත.

2 අභ්‍යන්තර අවතැන් වූවන්, ඔවුන්ගේ අවතැනෙහි ප්‍රතිඵලයක් ලෙස අසාධාරණ සාධක වැනි ජාතිය, ආගම, වයස සහ ලිංග අනුව වෙනස්කම් කිරීමේ ක්‍රියාවලීන් තුළින් සන්නාහ සන්නද්ධ බලකායන් තුළට හෝ වෙනත් කණ්ඩායම් තුළට බඳවා ගැනීමට එරෙහිව ආරක්ෂා කරනු ලැබේ. විශේෂිතවම, සියලු අවස්ථාවන්හිදීම කෲර, අමනුෂ්‍ය හෝ අවමානයට පත් කරන ක්‍රියාවලීන් සඳහා එකඟ වීමට බලකරන හෝ එකඟ නොවන අවස්ථාවල දඬුවම් ලෙස බඳවා ගැනීම් තහනම් කරනු ලැබේ.

## 14 වන ප්‍රතිපත්තිය

1. සෑම අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයෙකු හටම, එහා මෙහා යෑමේ ස්වාධීනත්වය සහ ඔහුගේ හෝ ඇයගේ වාසස්ථානය තෝරා ගැනීමේ නිදහසට අයිතිය ඇත.

2. විශේෂිතවම, අභ්‍යන්තර අවතැන් වූවන් හට ඔවුන්ගේ කඳවුරු හෝ වෙනත් පදිංචි ස්ථාන හෝ ජනාවාස වලින් හෝ පිටවීමේ සහ ඇතුල් වීමේ නිදහසෙහි අයිතිය ඇත.

## 15 වන ප්‍රතිපත්තිය

අභ්‍යන්තර අවතැන් වූවන් හට:

(අ) තම රටෙහි වෙනත් පළාතක ආරක්ෂාව හෝ ප්‍රවේසම සොයා ගැනීමට අයිතිය ඇත.

(ආ) ඔවුන්ගේ රට අත්හැර යෑමට අයිතිය ඇත.

(ඈ) වෙනත් රටක තම රක්ෂාස්ථානය සහ රැකවරණය සොයා ගැනීමේ අයිතිය ඇත.

(ඈ) බලාත්කාරයෙන් නැවත පැමිණීම හෝ නැවත අළුත් ස්ථානයක පදිංචි කරවීම ඔවුන්ගේ ජීවිතයෙහි ප්‍රවේසම නැතහොත් ආරක්ෂාව, ස්වාධීනත්වය සහ/හෝ සෞඛ්‍යය අවදානමකට ලක් වීමේ හැකියාව ඇති ඕනෑම ස්ථානයකට යාමට විරුද්ධව ආරක්ෂාව ලබාගැනීමේ අයිතිය ඇත.

## 16 වන ප්‍රතිපත්තිය

1. සියලුම අභ්‍යන්තර අවතැන් වූවන් හට තම අතුරුදහන් වූවන් හෝ සොයාගත නොහැකි හෝ දක්නට නොමැති ඥාතීන් ගැන තොරතුරු ඇතුළත්, ඔවුන්ගේ යාම්ඊම්, ඉඳුම්හිටුම් තොරතුරු, ඔවුන් හට සිදුවූ ඉරණම හෝ ඔවුන්ගේ දෛවය යන කරුණ ගැන සොයා බැලීමේ අයිතිය ඇත. එම අතුරුදහන් වූ හෝ සොයාගත නොහැකි හෝ දක්නට නොමැති බවට වාර්තා වී ඇති අභ්‍යන්තර අවතැන් වූවන්ගේ තොරතුරු සහ ඉරණම්, ඒ හා කාර්යයන් කිරීමට අදාළ අධිකාරීන් විසින් සොයා ගොඩ නැගීමට උත්සාහවන්ත ප්‍රයත්නයක් දැරීමත් මෙම කර්තව්‍යයේ නියැළී සිටින ඒ හා අදාළ වන ජාත්‍යන්තර සංවිධාන සමගද සහභාගිත්වයෙන් ක්‍රියා කිරීමත් කළ යුතුව ඇත.

2. එම අතුරුදහන් වූ පුද්ගලයින්ගේ ළඟම ඥාතීන් හෝ පවුලේ උදවිය හට තම අධිකාරිය විසින් කරන ලද සෝදිසියේ හෝ විමර්ශනයේ ප්‍රගතිය හෝ පෙරට යෑම දක්වා එම කාර්යයෙහි යම් ප්‍රතිඵලයක් වේ නම් ඒ බවත් ඔවුනට දැන්විය යුතුව ඇත.

3. මරණයට පත් වූ පුද්ගලයින්ගේ මෘත දේහ එකතු කර ගැනීමටත්, ඒවා හඳුනා ගැනීමටත්, එම මෘත දේහයන් පැහැර ගැනීම හෝ කොල්ල කෑම සහ කොටස් කපා ගැනීම වැනි අභාග්‍යමත් සිදුවීම් වලින් බේරා ගෙන, මරණයට පත් වූවන්ගේ ළඟම ඥාතීන් හට ලැබෙන්නට සැලසීම හෝ ඒවා අවසාන ගෞරවය සහිතව භූමදාන කිරීමටත් මෙම කාර්යභාර හෝ මෙයට අදාළ අධිකාරීන් උත්සාහ වන්ත ප්‍රයත්නයක් දරන ලදුව ඇත.

4. සියලුම අවස්ථාවන් තුළදී අවතැන් වූවන්ගේ මිනී වළවල් හෝ සොහොන් ආරක්ෂා කළ යුතු අතර ඒවාට ගරු කිරීමක් තිබිය යුතු වේ. අභ්‍යන්තර අවතැන් වූවන් හට ඔවුන්ගේ අභාවයට පත් ඥාතීන්ගේ මිනී වළවල් සහ සොහොන් බැලීමට යෑමේ ඉඩ පහසුකම් ලබා ගැනීමට අයිතිය තිබිය යුතුව ඇත.

## 17 වන ප්‍රතිපත්තිය

1. සෑම මනුෂ්‍යයෙකු හටම ඔහුගේ හෝ ඇයගේ පවුල් ජීවිතය කෙරෙහි ගරු කිරීමක් ඇති කර ගැනීමට අයිතිය ඇත.

2. මෙම අයිතිය සඳහා අභ්‍යන්තර අවතැන් වූවන්ගේ පවුල්වල සාමාජිකයින් ගෙන් එකට ජීවත් වීමේ උවමනාව සහ කැමැත්ත ඇති පුද්ගලයින්ට, එසේ කිරීමට ඉඩ අවකාශ දෙනු ලැබේ.

3. අභ්‍යන්තර අවතැන් වීම හේතුකොට ගෙන වෙන් වී ඇති පවුල් නැවත එකතු කිරීම හැකි තරම් ඉක්මනින් කළ යුතුය. මෙවැනි පවුල්වල නැවත එක් වීම ඉක්මන් කිරීම සඳහා, උචිත සුදුසු සහ යෝග්‍ය සියලුම පියවරයන් ගත යුතු අතර, විශේෂිතවම ළමයින් මෙම ප්‍රශ්නයට බැඳී ඇති විට මේ දෙය කිරීම ඉතාමත් අත්‍යවශ්‍ය වේ. මේ සඳහා වගකීමක් දරන හෝ වගකීමකින් බැඳී සිටින අධිකාරීන් මෙම පවුල්වල සාමාජිකයින් මගින් නගන ලද සෝදිසි කිරීම් සඳහා ඉඩ අවකාශ සැලසිය යුතු වන අතර, පවුල් නැවත එකතු කිරීමේ කර්තව්‍යයට උර දී සිටින නැතහොත් ඒ සඳහා යෙදී සිටින මානව හිතවාදී සංවිධාන දිරිමත් කරමින් සහයෝගය දිය යුතු වේ.

4. අභ්‍යන්තර අවතැන් වූවන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ ස්වාධීනත්වය කඳවුරුවල රඳා තබා සිටීම හෝ රැඳවුම හේතුවෙන් සීමා කරන ලද නම්, එලෙසම එකට සිටීමට හෝ එකට විසුමට අයිතිය ඇත.

## 18 වන ප්‍රතිපත්තිය

1. සියලුම අභ්‍යන්තර අවතැන් වූවන් හට සෑහෙන සහ ප්‍රමාණවත් ජීවන මට්ටමකට අයිතිය ඇත.
2. අවම වශයෙන් අභ්‍යන්තර අවතැන් වූවන් කෙරෙහි වෙනස්කම් කිරීමකින් තොරව අවස්ථාවන් ගැන ඒ හැටි සැලකිල්ලක් නොදක්වා දක්ෂ අධිකාරීන් විසින් පහත සඳහන් දේ ඔවුන් හට ලබාදීමෙනුත් ඒවා ලබා ගැනීම සඳහා ප්‍රවේසම් සේන්දු වීමක් සැලසීම සනාථ කර ගැනීමත් කළ යුතු වන්නේ :

   (අ) අත්‍යවශ්‍ය ආහාර සහ බීමට සුදුසු ජලය,

   (ආ) මූලික රැකවරණය පිළිසරණය සහ නිවාස

   (ඇ) උචිත සුදුසු සහ යෝග්‍ය වස්ත්‍ර හෝ ඇඳුම් පැළඳුම්, සහ

   (ඈ) අත්‍යවශ්‍ය ඖෂධීය සේවාවන් සහ සනීපාරක්ෂාව

3. මෙම මූලික සැපයුම් බෙදා හැරීමට සහ එම බෙදා හැරීම සැලසුම් කිරීමට ස්ත්‍රී පක්ෂයේ සම්පූර්ණ සහාය ලබා ගැනීම සහතික කර ගැනීමට විශේෂ උත්සාහයන් දැරිය යුතුය.

## 19 වන ප්‍රතිපත්තිය

1. සියලු තුවාල ලැබූ සහ අසනීප තත්ත්වයේ පසු වන අභ්‍යන්තර අවතැන් වූවන්ද නොහැකියාවෙන් පසු වන්නා වූ පුද්ගලයින්ද සඳහා වෛද්‍ය හේතූන් හැර මොනම පදනමක් මත වුවත් කිසිදු වෙනස්කමකින් තොරව ප්‍රයෝගිකව හැකි උපරිම මට්මටකින්ද, සුනංගු වීමේ අවම මට්ටමකින්ද, අවශ්‍ය වෛද්‍ය සත්කාරයන් සහ අවධානය ලැබෙනු ඇත. අවශ්‍ය වූ විට, අභ්‍යන්තර අවතැන් වූවන් හට මානසික සහ සාමාජීය සේවාවන්වලට ප්‍රවේශය ලැබෙනු ඇත.
2. ලිංගික හා අනෙකුත් අතවරයන්වලට ලක්වූ ස්ත්‍රීන් සඳහා උචිත සහ සුදුසු වූ උපදෙස් ලබා දීම හා ස්ත්‍රීන්ගේ ප්‍රජනන සෞඛ්‍ය සත්කාරය වැනි ස්ත්‍රී සෞඛ්‍ය සත්කාරයන් සලසන්නවුන් සහ එම සේවාවන්වලට ප්‍රවේශ වීමේ හැකියාව ඇතුළත් වන ස්ත්‍රීන්ගේ සෞඛ්‍ය අවශ්‍යතාවන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු විය යුතුය.
3. අභ්‍යන්තර අවතැන් වූවන් අතර මානව ප්‍රතිශක්ති ඌනතා වයිරස් රෝගය ඇතුළු ස්පර්ශ කිරීමෙන් බෝ වෙන රෝග සහ ආසාදන වන රෝග වළක්වාලීම සඳහා විශේෂ අවධානයක් යොමු විය යුතුය.

## 20 වන ප්‍රතිපත්තිය

1. සෑම මනුෂ්‍යයෙකුටම සෑම තැනකම නීතිය ඉදිරිපිට සිටින්නා වූ පුද්ගලයෙකු ලෙස හඳුනාගැනීමක් තිබීමේ අයිතියක් ඇත.
2. මේ හා සම්බන්ධ හෝ අදාළව ක්‍රියා කරන නිලධාරීන් අභ්‍යන්තර අවතැන් වූවන් සඳහා ඇති මෙම අයිතියට වටිනාකමක් හෝ හොඳ ප්‍රතිඵලයක් දීමට නම් අභ්‍යන්තර අවතැන් වූවන්ගේ නීත්‍යානුකූල අයිතීන් හෝ හිමිකම් භුක්ති විඳීමත් ඒවා ක්‍රියාවෙහි යෙදවීමත් සඳහා අවශ්‍ය සියලු ලියකියවිලි ඇතුළුව ගමන් බලපත්‍ර, පුද්ගලික හැඳුනුම් ලියකියවිලි, උප්පැන්න සහතිකයන්, සහ විවාහ සහතිකයන්, නිකුත් කළ යුතුව ඇත. අවතැන සිදු වන අවස්ථාවේ අභ්‍යන්තර අවතැන් වූවන්ගේ නැති වූ ලියකියවිලි වෙනුවට අළුත් ලියකියවිලි පිළියෙළ කර දීමට හෝ අළුතෙන්ම එම ලියකියවිලි ලබා දීම සඳහා පහසු පියවරයන් සලසා දීම එම අධීකාරීන් විසින් කළ යුතු විශේෂිත කාර්යයක් වන අතර, මේ කර්තව්‍යයේදී මෙම ලියවිලි හෝ වෙනත් අවශ්‍ය ලියකියවිලි ලබා ගැනීමට නම්, යම් කෙනෙකු තම සුපුරුදු වාසස්ථානයට හා ඒ පළාතට නැවත පැමිණිය යුතුය යන අයුතු සහ අසාධාරණ නීති තත්ත්වයන් ඇතිකළ නොයුතුය.
3. ස්ත්‍රීන් සහ පුරුෂයින් යන දෙපක්ෂයටම අවශ්‍ය වන එවැනි ලියකියවිලි ලබා ගැනීමේ සම

අයිතියක් ඇති අතර, ඔවුන්ගේම නම්ගම්වලින්ම එම ලියකියවිලි පිළියෙළ කරවා ගෙන ලබා ගැනීමේ සම අයිතියක්ද ඇත.

## 21 වන ප්‍රතිපත්තිය

1. ඉඩම්කඩම් දේපළ සහ බඩුබාහිරාදිය වැනි තමන් සතු දේ පදනම් රහිතව කිසිම පුද්ගලයෙකු හට අහිමි කරනු නොලැබේ.

2. අභ්‍යන්තර අවතැන් වූවන්ගේ ඉඩම්කඩම් සහ දේපළ සියලු අවස්ථාවන්වලදී ආරක්ෂා කරනු ලබන අතර, විශේෂයෙන්ම පහත පෙන්වා දී ඇති ක්‍රියා මාර්ග අනුව මෙය සිදු කෙරෙනු ඇත:

   (අ) කොල්ල කෑම හෝ පැහැර ගැනීම,
   (ආ) ඍජු හෝ අසාධාරණ සාධක මත පහරදීම් හෝ අනෙකුත් ප්‍රචණ්ඩ ක්‍රියා,
   (ඇ) යුද හමුදා මෙහෙයුම් ක්‍රියාද, අරමුණු හෝ අභිප්‍රායන් ආවරණය සඳහා යොදවා ගැනීම,
   (ඈ) පලිගැනීම හෝ එකට එක කිරීම සඳහා විෂයක් ලෙස භාවිත කිරීම, සහ
   (ඉ) විනාශ කර දමන ලදුව හෝ පොදු දඬුවම් ක්‍රමයක් ලෙස උචිත හෝ සුදුස්සන් කරවනු ලැබීම.

3. අභ්‍යන්තර අවතැන් වූවන් විසින් දමා ගොස් ඇති ඉඩම් කඩම් සහ දේපළ විනාශ කිරීම සහ අහඹු ලෙස තෝරා ගැනීමත් නීති විරෝධීව අයිති කරගැනීම සහ අත්පත් කරගැනීම හෝ අල්ලා ගැනීමටත් එරෙහිව ආරක්ෂා කළ යුතුය.

## 22 වන ප්‍රතිපත්තිය

1. අභ්‍යන්තර අවතැන් වූවන්, කඳවුරු වල ජීවත් වූවත්, නැතත් පහත සඳහන් වී ඇති අයිතීන් හෝ හිමිකම් භුක්ති විඳීමෙහිදී ඔවුන්ගේ අවතැන් වීමේ ප්‍රතිඵලය ලෙස ඔවුන් කෙරෙහි කිසිදු වෙනස්කම් කිරීමක් සිදු නොකෙරෙනු ඇත.

   (අ) කල්පනා කිරීමට හෝ සිතීමට, හෘද සාක්ෂ්‍යයට සවන් දීමට, ආගමට, හෝ එවැනි යම් විශ්වාසයකට තැන දීමට, තම මතය හෝ විශ්වාසයට ඉඩ දීමට, තම හැඟීම්වලට ඉඩ දීමට, යන මෙම කරුණු කෙරෙහි ඔවුන් සතු නිදහසට අයිතිය,
   (ආ) රක්ෂාවක් සඳහා හොඳ අවස්ථාවන් හෝ වාසිදායක අවස්ථාවන් සොයා යෑමට ඇති නිදහසේ අයිතිය හා ආර්ථික ක්‍රියාකාරකම්වල සහභාගි වීමේ නිදහසට අයිතිය,
   (ඇ) ප්‍රජා කටයුතු හෝ කාර්යයන් තුළ නිදහසේ හවුල් වීමට ඇති අයිතිය හා ඒවාට සමව සහභාගි වීමට ඇති නිදහසේ අයිතිය,
   (ඈ) රාජ්‍ය කටයුතු හෝ කාර්යයන් ඇතුළත්, පොදු හෝ මහජන කටයුතු තුළ සහභාගි වීමේ අයිතිය සහ ඡන්ද භාවිතයේ අයිතිය, මෙම අයිතීන් ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය උපක්‍රම, මුදල් හදල් හෝ වත්කම කෙරෙහි ප්‍රවේශ වීමට ඇති අයිතිය, සහ
   (ඉ) ඔවුන් දන්නා සහ ඔවුන්ට තේරුම් ගත හැකි භාෂාවකින් කතා බහ කිරීමට සහ ගනුදෙනු කිරීමට ඇති අයිතිය ය.

## 23 වන ප්‍රතිපත්තිය

1. සෑම මනුෂ්‍යයෙක් හටම අධ්‍යාපනයක් ලබාගැනීමට අයිතියක් ඇත.
2. අභ්‍යන්තර අවතැන් වූවන් හට මෙම අයිතිය ලබා දීම පලබර කිරීම සඳහා මෙම පුද්ගලයින් හට, විශේෂයෙන්ම අවතැන් වූ ළමයින් හට නිදහස් අධ්‍යාපනයක් ප්‍රාථමික මට්ටමේදී අනිවාර්යව ලබා ගැනීමට ඉඩ සැලසීමට වග බලා ගත යුතුවේ. මෙම අධ්‍යාපනය, ඔවුන්ගේ සංස්කෘතික හැඳුනුම සහ භාෂාවත්, ආගමත් සමග සම්බන්ධ විය යුතුය.
3. අධ්‍යාපනික වැඩ සටහන් තුළ ස්ත්‍රීන් සහ ගැහැණු ළමයින්ගේ සම්පූර්ණ සහ සම සහභාගිත්වයක් ඇති කිරීම ස්ථිර සහ සනාථ කර ගැනීමට විශේෂ ප්‍රයත්නයක් දැරිය යුතුය.
4. අභ්‍යන්තර අවතැන් වූවන් හට අධ්‍යාපනය සහ පුහුණු වීමේ පහසුකම් ලබා ගැනීමට ඉඩ සලසන අතර, විශේෂයෙන් නව යෞවනයින් හෝ ගැටවරයින්ට සහ ස්ත්‍රීන් හටත් මොවුන් කඳවුරු තුළ ජීවත් වුවත් නැතත් නිසි සහ සුදුසු තත්ත්වයන් ලැබුණු විගසම ඉඩ සැලසිය යුතුය.

## 4 වන කොටස - මානව හිතවාදී ආධාර කිරීම සම්බන්ධව ඇති ප්‍රතිපත්ති

### 24 වන ප්‍රතිපත්තිය

1. මනුෂ්‍ය දයාව සහ අපක්ෂපාත වීමත් සාධාරණකමත් මත ඇති ප්‍රතිපත්තිවලට අනුකූලව සහ කිසිදු වෙනස්කමකින් තොරව සියලු මානව හිතවාදී ආධාර ලබාදීම ක්‍රියාවට නැගිය යුතුය.
2. අභ්‍යන්තර අවතැන් වූවන් හට ලබා දෙන මානව හිතවාදී ආධාර උදව්, මොනම ආකාරයකටවත් වෙන අතකට යොමු නොවිය යුතු අතර, විශේෂයෙන්ම යුද හමුදාමය හේතුන් හෝ දේශපාලනමය හේතුන් මතද මෙසේ නොවන බවට වගබලා ගත යුතුය.

### 25 වන ප්‍රතිපත්තිය

1. අභ්‍යන්තර අවතැන් වූවන් හට උදව් ලබාදීම සඳහා වන ප්‍රාථමික වගකීම සහ යුතුකම රඳා පවතින්නේ ජාතික අධිකාරීන් සමගය.
2. ජාත්‍යන්තර මානව හිතවාදී සංවිධාන සහ අනෙකුත් උචිත වූ සහ සුදුසු වූ ක්‍රියාකරන්නවුන් හට අභ්‍යන්තර අවතැන් වූවන් කෙරෙහි තම සහාය පල කර සිටීමේ අයිතිය ඇත. එවැනි සහාය පළ කිරීමක්, සතුරු ක්‍රියාවක් හෝ රාජ්‍යයක අභ්‍යන්තර දේවල්වලට ඇඟිලි ගැසීමක් ලෙස නොසලකා හොඳ විශ්වාසයකින් සලකා බැලිය යුතු වේ. මෙවැනි සහාය පළ කිරීමකට කැමත්ත දීම හිතුවක්කාර ලෙස හිර කර තබා නොගත යුතු වන අතර විශේෂයෙන්ම අදාළ අධිකාරීන් හට එම අවශ්‍ය මානව හිතවාදී ආධාර ලබා දීමට නොහැකි වූ විට හෝ ඔවුන් නොකැමති වූ විටත් මෙය එලෙසම සිදු විය යුතුය.
3. මානව හිතවාදී ආධාරවල නිදහස් සංක්‍රමණය සඳහා අවකාශ දීම සහ එම කාර්යයන් පහසු කිරීම ඒ හා සම්බන්ධ සියලු අධිකාරියන් මගින් කළ යුතු අතර, අභ්‍යන්තර අවතැන් වූවන් සඳහා මෙම ආධාර ලබා දීමෙහි නිරත වන්නවුන් සඳහා යුහුසුලු නැතහොත් කඩිසර සහ කිසිම බාධාවකින් තොර ප්‍රවේශ වීමක් ලබාදිය යුතුය.

### 26 වන ප්‍රතිපත්තිය

මානව හිතවාදී ආධාර ලබාදීමේ යෙදී සිටින පුද්ගලයින්ටද, ඔවුන්ගේ ප්‍රවාහන පහසුකම් සහ සැපයීම්වලටද ගරු කිරීම සහ ආරක්ෂාව දිය යුතුය. පහර දීම් සහ වෙනත් ප්‍රචණ්ඩ ක්‍රියාවන්වලට මෙම පුද්ගලයින් ගොදුරු විය නොයුතුය.

### 27 වන ප්‍රතිපත්තිය

1. ජාත්‍යන්තර මානව හිතවාදී සංවිධාන සහ වෙනත් සුදුසු සහ උචිත ක්‍රියා කරන්නවුන් අභ්‍යන්තර අවතැන් වූවන් හට උදව් ආධාර ලබා දීමේදී ඔවුන්ගේ ආරක්ෂක අවශ්‍යතාවන් සහ මානව හිමිකම් කෙරෙහි මනා සැලකිල්ලක් දැක්විය යුතු වන අතර මේ සඳහා යෝග්‍ය වූ පියවරයන් ගැනීම කෙරෙහිද සැලකිලිමත් විය යුතුය. මෙසේ කිරීමේදී මෙම සංවිධාන සහ ක්‍රියා කරන්නවුන්, මේ හා සමාන්තර හෝ අදාළ වන ජාත්‍යන්තර ප්‍රමිතීන් හෝ මට්ටම් සහ නිසි හැසිරීම සඳහා වන සංකේත හෝ නීතිරීතිවලට ගරු කළ යුතුය.
2. මෙවැනි සේවාවන් රාජ්‍යයන් විසින් ලබා දෙන ලදුව හෝ රාජ්‍යයන් විසින් ඉල්ලුම් කරන ලදුව හෝ එම කාර්යයන් ඉටු කිරීමේ පැවරුම ලබා ඇති ජාත්‍යන්තර සංවිධානවල ආරක්ෂක වගකීම්වලට අපක්ෂපාතීව ඉහත ඡේදය ඇත.

## 5 වන කොටස - නැවත පැමිණීම, නැවත ජනාවාස කිරීම සහ සමාජයට යළි එකතු කිරීම හා සම්බන්ධ ප්‍රතිපත්ති

### 28 වන ප්‍රතිපත්තිය

1. අභ්‍යන්තර අවතැන් වූවන්ට තම නිවෙස් හෝ සුපුරුදු වාසස්ථාන වෙත ආරක්ෂා සහ ප්‍රවේසම් සහිතව ද, තම අභිමානය රැකගනිමින් ද, සිය කැමැත්තෙන් පදිංචියට පැමිණීමට හෝ රටෙහි වෙනත් පළාතක සිය කැමැත්තෙන් නැවත ජනාවාස කිරීමට ඉඩ සැලසීම සඳහා සුදුසු තත්ත්වයන් ගොඩ නැගීමත් ඒ සඳහා අවශ්‍ය උපක්‍රම සඳහා මග සැලසීමත් දක්ෂ අධිකාරීන් සතු ආරම්භක යුතුකමක් සහ වගකීමකි. නැවත පැමිණි හෝ නැවත ජනාවාස කරවන ලද, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ ඒකීයකරණය හෝ සමාජයට යළි එකතු කිරීම පහසු කිරීම සඳහා එවැනි අධිකාරීන් උදක්ම යත්න දැරිය යුතුය.

2. මෙලෙස නැවත පැමිණීම සහ නැවත ජනාවාස කිරීමත් සමාජයට යළිත් එක් කිරීම හෝ ඒකීයකරණය කිරීමත් සඳහා වන සැලසුම් කිරීම් සහ පරිපාලනය කෙරෙහි අභ්‍යන්තර අවතැන් වූවන්ගේ සම්පූර්ණ සහභාගිත්වය සනාථ කරමින් ස්ථිර කරගැනීම සඳහා, විශේෂ ප්‍රයත්නයන් දැරිය යුතුය.

### 29 වන ප්‍රතිපත්තිය

1. මෙලෙස තම නිවෙස් හෝ සුපුරුදු වාසස්ථාන කරා පැමිණි පුද්ගලයින් හෝ රටෙහි වෙනත් පළාතක නැවත ජනාවාස කරවන ලද අභ්‍යන්තර අවතැන් වූවන් හට ඔවුන්ගේ අවතැන හේතු කර ගනිමින් කිසිදු වෙනස්කම් කිරීමකින් තොරව සැලකිය යුතුය. සෑම මට්ටමකම වන පොදු කාර්යයන් තුළ සම්පූර්ණ සහ සම වූ සහභාගිත්වයකට අයිතිය සහ පොදු සේවාවන් මෙන් මහජන සේවාවන්වලටද පිවිසීමට සම වූ අයිතියක් ඔවුනට ලැබෙනු ඇත.

2. නැවත පැමිණි සහ/හෝ නැවත ජනාවාස කරන ලද අභ්‍යන්තර අවතැන් වූවන් හට ඔවුන් විසින් දමා ගිය හෝ අවතැන හේතුවෙන් අහිමි වූ තම ඉඩම්කඩම් හා දේපළද බඩුබාහිරාදියද නැවත සොයා ගැනීමටත් ලබා ගැනීමටත් හැකි උපරිම දුරට උදව් ආධාර කිරීම සඳහා දක්ෂ අධිකාරීන් හට වගකීමකුත් යුතුකමකුත් ඇත. මෙවැනි ඉඩම්කඩම් හා දේපළ නැවත සොයා ගැනීමට නොහැකි අවස්ථාවලදී දක්ෂ අධිකාරීන් විසින් මෙම අභ්‍යන්තර අවතැන් වූවන් හට යෝග්‍ය හෝ උචිත හෝ සුදුසු වන්දි ගෙවීම් හෝ වෙනත් ආකාරයක සාධාරණ පිළියම් කිරීමක් නැතහොත් ප්‍රකෘතිමත් කිරීමක් ලබා ගැනීමට ආධාර ලබා දිය යුතුය.

### 30 වන ප්‍රතිපත්තිය

ජාත්‍යන්තර මානව හිතවාදී සංවිධාන සහ අනෙකුත් උචිත සහ සුදුසු ක්‍රියා කරන්නවුන් තම තමන්ට අදාළ සේවාවන් ඉටු කිරීම ක්‍රියාවේ යෙදවීමටත්, අභ්‍යන්තර අවතැන් වූවන් සඳහා ඔවුනගේ නැවත පැමිණීම හෝ නැවත ජනාවාස කිරීම සහ ඒකීයකරණය කිරීම වැනි සමාජයට යළි එකතු කිරීම සඳහා උදව් ආධාර ලබා දීමට ඉතා යුහුසුලු සහ සියලු බාධාවන්ගෙන් තොරවූ පිවිසීමක් නැතහොත් ප්‍රවේශයක් සඳහා, උදව් කිරීම සහ පහසු කිරීම අදාළ සියලු අධිකාරීන් විසින් කළ යුතුය.

**වැඩි විස්තර සඳහා විමසන්න:**

මානුෂීය සේවායතන සමූහය (*CHA* )
නො 86, රොස්මීඩ් පෙදෙස
කොළඹ 07
ශ්‍රී ලංකාව.

දුරකථන/ෆැක්ස්: : +94–11–4610943/4
සෘජු අංකය: : +94–11–4616824
ඊමේල්: : *info@cha.lk*
අන්තර්ජාලය: : *www.humanitarian-srilanka.org*